සන්න සහිත

# අලුකොබෝ සන්දේශය.

රන්දෙණියේ
දිනෙස් මැන්දිස් වික්‍රමරත්න සේනානායක
මුහන්දිරම් මැතිතුමන් විසින්
සමාරාධිතයි.

බලපිටියේ
එච්. ජේ. ඇම්. වික්‍රමරත්න සේනානායක
ශ්‍රෙෂ්ඨාධිකරණ ශාලාවේ නීතිඥමහතා විසින්
විරචිතයි.



කොළඹ මහසෙක්‍රතාරිස් කන්තෝරුවේ
ඩබ්ලිව්. ඒ. ඇම්. විමලරත්න මහතා විසින්
ප්‍රකාශිතයි.

අම්බලම්ගොඩ
"විජය" යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

ශ්‍රී. බු. ව: 2457.
ක්‍රි. ව: 1913.

ස න් න ස හි ත

# අලුකොබෝ සන්දේශය.

ලාඞ්කිකජනශෙඛරායමාන වූ ගරු නයිට් පදප්‍රාප්ත

**සර් දෙන් සලමොන් ඩයස් බණ්ඩාරනායක**

මහමුදලිමන්ත්‍රීශ්වරයන්වහන්සේට

ආයුරාරෝග්‍ය ශ්‍රී වර්ධනය කරවීම පිණිස

—✱—

රන්දෙණියේ

**දිනෙස් මැන්දිස් වික්‍රමරත්න සේනානායක**

මුහන්දිරම් මැතිතුමාගේ ආරාධනාවෙන්

—✱—

කොකැටූ සන්දේශය

කැණරි සන්දේශය, ගමන්විස්තරය

යන කාව්‍යයන්හි කර්තෘවූද

**ප්‍රාචීනභාෂෝපකාර සමිතියේ හා රාජකීය ආසියාතික**

සමිතියේ සාමාජිකවූද

බලපිටියේ

පොලිස්මහෙස්ත්‍රාත්ධූරයේ කලින්කල වැඩබැලූ

**හැන්රි ජෝන් මැන්දිස් වික්‍රමරත්න සේනානායක**

ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාවේ

නීතිඥමහතා විසින්

කරණ ලදි.

—✱—

# ALUKOBO SANDESA

OR

## THE ASH-DOVE'S MESSAGE


COMPOSED BY

**H. J. M. Wickramaratne Senanayaka,**

PROCTOR OF THE SUPREME COURT OF CEYLON, MEMBER OF THE CEYLON BRANCH OF THE ROYAL ASIATIC SOCIETY OF CEYLON, AND MEMBER OF THE COMMITTEE ON ORIENTAL STUDIES, AUTHOR OF THE COCKATOO SANDESA, THE CANARY SANDESA AND THE GAMANVISTARAYA.

Sometime Acting Police Magistrate, Balapitiya.


---

AT THE REQUEST OF

DENIS MENDIS WICKRAMARATNE SENANAYAKA, MOHANDIRAM, BALAPITIYA.

---


PUBLISHED BY

**EATON MENDIS WIMALARATNE,**

(of the Colonial Secretary's Office, Colombo.)

**1913.**

Printed at the SANDA KIRANA PRESS No. 78, Dam Street, Colombo.

# PREFACE.

The Alukobo Sandesa or the Ash-dove's Message is a short poem in Singhalese composed by me in the form of an epistle addressed to Natha, the incumbent god of Totagamu Vihara, situated on the south-west coast of Ceylon about 14 miles to the north of Galle. This form of addressing rhymed epistles to gods has been a favourite method with ancient poets.

The aim of the Sandesa is a prayer to Natha to confer blessings of health, wealth and prosperity on the illustrious Maha Mudaliyar Sir Solomon Dias Bandaranaike, Kt., C.M.G., and his family.

The Bandaranaike family is one of the oldest Singhalese noble families, members of which have distinguished themselves for public service during the last four or five centuries, and the Portugese and Dutch records amply testify to such distinction. Mention of the family is also made in the Hansa Sandesa (Swan's Message),—a standard work of a contemporary of Sri Rahula Thero in the 15th century. This family has also been fortunate in holding the distinguished office of Maha Mudaliyar at a very early period of the History of Ceylon of European rule.



Sir Don Solomon Dias Bandaranayaka, Knight, C.M.G.,
Maha Mudliar and Native A.D.C.

ශ්‍රීමත් දොන් සලමන් දියස් බන්ඩාරනායක වාසල මහමුදලි
මනාත්‍රීසවරයාණෝ තා.

THE present MAHA MUDALIYAR was born in his father's Walauwa at Horagolla in Veyangoda on 22nd May 1862, and was educated at St. Thomas's College, Colombo. When the present King George V and His Majesty's late elder brother Prince Albert Victor, the late Duke of Clarence, visited the Island in 1882 the Maha Mudaliyar had the honour of being invested by Their Royal Highnesses with the rank of Mohandiram of the Governor's Gate, and as such he entered Public Service in his 19th year. In honour of the event the surname "Raja-kumarun-kadu-karalu" was by special permission of Government added to his name. He succeeded his father Don Christoffel Henricus Dias Abeyewickreme Jayatillake Seneviratne Bandaranaike, Mudaliyar of the Governor's Gate and Justice of the Peace and Unofficial Police Magistrate, in the office of Mudaliyar of Siyane korale East. In 1895 he succeeded his relative Don Conrad Peter Dias Bandaranaike in the office of Maha Mudaliyar and received his investiture from His Excellency the Governor Sir Arthur Havelock. He was the recipient of a gold medal in 1896 from the inhabitants of Siyane korale East in recognition of the services to that district, while administering its affairs as Mudaliyar. In 1897 he was one of the Official Representatives of Ceylon at the Diamond Jubilee Celebrations in England of Her Majesty Queen Victoria and was the recipient of Diamond Jubilee Gold Medal. In1901 by public subscription he was presented with a Gold Sword of Honour. The same year he acted as extra A D.C. to Duke of York (the present King-Emperor) during the visit of Their Royal Highnesses the Duke and Duchess. In 1902 he was made C.M.G., and received the Coronation Gold Medal, when he represented Ceylon at the Coronation of the late King Edward VII. In 1907 he received the Royal Order of Merit, Cambodia. In the same year he was also invested with the insignia of the Order of Knighthood. He is also a Justice of the Peace for the whole Island and Native Aid-de-camp to His Excellency the Governor.

His paternal grandfather was Don Solomon Dias Bandaranaike, an account of whom is given in the second volume of Sir Emerson Tennant's History of Ceylon. In 1898 the Maha Mudaliyar married Daisy Ezline, the eldest daughter of Sir Solomon Christoffel Obeyesekara, Kt., and M.L.C., a gentleman of great respect and high position. The Obeyesekara family is one of the oldest noble families of Southern Province. Lady Obeyesekara is the second daughter of the late Hon. Mr. James De Alwis, M.L.C. and Mrs. de Alwis (Florence Dias Bandaranaike), a sister of the late Sir Harry Dias, Kt., Senior Puisne Justice of Ceylon. The late Hon. Mr. James Peter Obeyesekera, M.L.C., was the eldest brother of Sir Solomon Christoffel Obeyesekera and their parents were D. B. F. Obeyesekera, Mudaliyar of Talpe Pattu and Mrs. Obeyesekera (Cornelia Susana Dias Bandaranaike).

The Maha Mudaliyar is a fairly well-to-do person and owns extensive cocoanut and rubber plantations, and has much house property in Colombo, Nuwara Eliya, Veyangoda and other places. He has also the honour of being president, vice-president and member of various societies, institutes, boards &c., too numerous to mention.

Request of my late lamented father Denis Mendis Wickramaratne Senanayaka, Mohandiram, coupled with the high honours deservingly paid to Sir Solomon, prompted me to undertake this work, though in the midest of my professional and other duties I had very little time to spare.

Amongst those Ceylonese who have been honoured by our ruling monarch George V, and the late monarchs Edward VII., and Queen Victoria and other members of the Royal Family, the present Maha Mudaliyar stands foremost, and in whatever high circle he moved he has brought credit to himself and to his countrymen. The keen interest he takes in the welfare of his people and the modesty with which he shows his kindness and regard to the people, high or low, rich or poor, educated or illiterate, irrespective of caste, colour or creed are rare virtues, especially among those who have the good fortune to receive such honours. It is for kings and princes to honour them, but we have ourselves a duty to perform, namely, to offer them our sincere

wishes of long life, happiness and prosperity. It is to discharge this duty to-wards him who is noble both in deed and in birth, and to preserve in a native poem the name so honoured that I have undertaken this task, and by so doing I have also the satisfaction that I have acted in accordance with a noble teaching of Lord Buddha as given in Maha Mangala Sutta :—

"Pujá-ca puja niyánam
Etam mangala muttamam."

To honour him to whom honour is due is a noble act.

*Totagamu. Vihara.*—This vihara, like one of the Modern Universities of Great Britian, was at the time of Sri Rahula Sangha Raja a great seat of learning. This Sangha Raja who was the author of the well-known classical works, known as Padasadana Tika, Pancikapradipa, Kaviasekhara, Paravi Sandesa, Selalihini Sandesa &c., and who may be called the Shakespeare of Ceylon, was the renowned principal of the Oriental College called the Vijaya-bahu Pirivena. The fame of the institution was so great that it had attracted pupils even from across the seas; and so great a Sanskrit scholar as Sri Rama Chandra Bharati—the author of the Bauddha-Sataka (Book of 100 stanzas on Buddha's virtues), and two works on prosody known as Vritaratnakara-pancikawa, and Vritamalakhiawa, came to Ceylon to prosecute his studies under the principal of the College.

The history of the Vihara is further embellished by the fact that it was here that the late lamented great oriental scholar Hikkaduwa Sri Sumangala, Chief High Priest of Colombo, Galle and Adam's Peak, and Principal of the Vidiodaya College, Colombo, was admitted to priest-hood and passed the early part of his holy life. The village where the old vihara stood was then known as Totagamuwa, which means in Singhalese a sea-port or a port-town, from *tota*, a port and *gama*, a village, the Pali and Sanskrit equivalents being Titthagama and Tirthagrama respectively. Since the days of Prakrama-bahu IV the village has been called Telwatte (oil garden or oil hamlet), as that monarch caused a grove containing 5000 cocoanut trees to be planted for the purpose of supplying oil to the vihara. The following account of the

vihara given in the 90th chaper of the Mahawansa may be read with interest :—

"At Titthagama (Totagamu) vihara, where the great Vijayabahu built a temple, five and forty cubits long, which had gone altogether to decay, this king, Prakrama-bahu, built a fine two-storied temple, thirty cubits long, with tall spires, and then gave that building, as it shone with divers paintings, to the great and venerable elder Káyasatthi who dwelt in the Pirivena called Vijayabahu. He also gave for the benefit of that Pirivena, a village named Salaggama (Halpatota), near the bank of the river Gimha (Ginganga); and in that delightful village of Tittha-gama he formed a grove with five thousand cocoanut trees."

This Vijayabahu is Vijayabahu I, known also as Siri Sanghabodhi Vijayabahu and Mahalu Vijayabahu, who ascended the throne of Lanka in 1065 A.D., and reigned 55 years. Having defeated the Cholians in several battles, he drove them over the seas, and re-established the Buddhist Church which had then fallen into a very degenerate state, by introducing the ordination ceremony from Ramanna (a province in Burmah), reconstructing a good many old viharas, building new ones and richly endowing the priest-hood.

Prakramabahu referred to is undoubtedly identical with Prakramabahu IV who ascended the throne of Lanka in 1295 A.D. He was an oriental scholar of no mean repute, and henee was known as Pandita Prakramabahu. He was the author of the Kausilumina (the crest-gem of poetry), a Singhalese classic in blank verse, and translator of the Buddhist birth-stories known as "The Pansiya-panas Jataka" into Singhalese. It is surmised that it was in this reign the popular Singhalese grammar called Sidat-sangara was written. It is the opinion of some scholars that it was written by Vedeha Thero, the addmitted author of the two Pali works, "Samanta-kuta-vannana (A description of Adam's Peak), and Rasa-wahini; whilst others ascribe it to Sanga Raja Anomadassi—the author of "Daivagna-kamadhenu" and "Paropakarakaranaya." My own opinion is that it was written by the latter in the reign of Prakramabahu II., and I have discussed the subject at length giving my reasons in the Singhalese Preface.

On one of the stone pillars by the side of the Natha dewala at Totagamu Vihara is still to be seen an old inscription with the mention of "Mahabadgama," which literally means *great rice village.* This may be, construed as referring to Baddegama. Halpatota and Baddegama are villages on either side of the Gin-ganga, about 6 miles from the Vihara. The quotation from chapter 90 of the Mahawansa shows that Halpatota was given to the priests of the vihara, and it may be conjectured that Baddegama was also similarly given to the same priests. Even at the present day the vihara owns some old fields at Baddegama.

The inscription is very old and from a palaeographical point of view it may be considered as belonging to a distant date of the 10th or 11th century.

"There are", says Hikkaduwa Sri Sumangala Thero in his elaborate preface to the Kaviasekhara, "two lines of and old inscription on a fragmentary slab, one of which reads *vacissarappamukha* (with Vachissara as the Principal), and the other *ettha baddha sima* (here is fixed the consecrated boundary)." Vachissara means professor or master of words or speech, and was an honorific title conferred by the king on Totagamuwa Sri Rahula Sangha Raja for his proficiency in languages. Since then Hikkadowa Sri Sumangala Thero had the honour of holding that title and well did he deserve it.

A reference to the vihara is made also in the Gira Sandesa (Parrot's Message), a standard Singhalese work composed by a contemporary of Totagamuwa Sri Rahula Sangha Raja and addressed to him from Cotta, the then capital of Ceylon, with the request that prayers might be offered to Natha for blessings of prosperity on his foster-father Prakramabahu VI.

It also appears from the same epistle that there had been an image called *Disa pilima,* which perhaps means the image of the province. A literal translation of a part of the 215th stanza is as follows :—"Have a sight of the blue coloured image known as *Disa-pilima* which was made by god Indra for the welfare of the Island at a time when the ocean commenced to wash away the shore, owing to the wrath of gods who were incensed at the unwise act of the great king Kelani Tissa of Ceylon, for condemning the innocent saint Kelani Tissa Thero &c."

The 22nd chapter of the Mahawansa gives an account of this attrocious deed of imperial tyranny without however mentioning how the arhat Kelani Tissa Thero was cruelly killed by being thrown into a caldron of boiling oil on a false charge of having sent a secret message to the queen consort.

King Kelani Tissa was the maternal grand-father of Dutugemunu—the greatest warrior king of Ceylon who ascended the throne in 306 B. C.

The name of the arhat is immortalised in the Pali poem called the Tela-kataha-gatha (Stanzas of the Oil-caldron), where the exhortations of the dying arhat to the king afford very pathetic reading. The Tela-kataha-gatha was rendered into English with notes by me, and appeared in 1890 in a series of articles in the second volume of "The Buddhist," a Weekly Magazine published by the Theosophical Society of Colombo. An English Translateration of the poem edited with a very useful preface by the well-known oriental scholar E. R. Gooneratne, Mudaliyar of the Governor's Gate and Justice of the Peace, was published in 1884 in the Journal of the Pali Text Society.

*Natha.*—The god Natha to whom this epistle is addressed is believed by the Buddhists to be the future Buddha.

Sri Rahula Thero in his Kaviya-sekhara speaks of Natha as follows :—

"Hail ! Natha, god of Totagamu shrine,
Whose graceful beauty like the moon doth shine
The future Lord Buddha, the omniscient,
In fame and glory highly transcendant."

Natha means lord or saviour, and is a term often applied to Buddha. He is supposed to be a very benign god whose blessings are often invoked on matters of great importance.

The poem is named after the messenger Ash-dove or *Alukobo* in Singhalese. It contains 152 stanzas in *gee* (blank verse), *seheli* (a mixture of blank verse and rhyme), and *sivu-pada* (rhymes of four lines). I may explain here that in this poem I have deviated a little from my usual mode of composition by using alliterations, acrostics &c., at the request of my friends, but I have,

however, been careful to arrange the same recurrent sound to convey a different meaning at each repitition, and thus avoid the error known in Singhalese as *punarut* (tautology).

This poem is the fourth work by me, the other three being:— "The Cockatoo Sandesa," "The Canary Sandesa," and "The Gaman-vistaraya" (A description of a tour from Balapitiya to Colombo). At the request of the publisher a paraphrase is appended to each stanza to help the reader to understand the poem.

In accordance with the usage of the Oriental bards the poem begins with a benediction to the messenger and describes his beauty and names the qualities which befit him as a messenger to be entrusted with an epistle of importance. Then it gives a description of Randombe—the author's native village—whence the journey is to begin. The messenger is enjoined to observe an object of good omen and to start at an auspicious hour on a Monday morning at sunrise when the planets jupiter, venus and mercury, and the sun and moon are in powerful positions of the Zodiac with good aspects or exaltations. He is to adore the Triple-gem and to invoke protection of gods before he starts on the journey. He is to proceed first to the Maha Mangala Samudra Rama (commonly called Maha Vihara) of Randombe, and to worship the divers objects of worship there, then to take permission of the priests and to proceed on his journey, taking a route through busy Ambalangoda, Madampe, Dewagoda Vihara, Lankagoda, Akurala, Kahawa, Godagama and Telwatta, where lies his destination—the famous Totagamu Vihara. The poem then gives a description of the vihara with a brief account of its past history and the virtues of its incumbent god Natha to whom the epistle is to be offered. Before the important function of delivering the epistle the poem gives a brief account of the Maha Mudaliyar with the salient virtues and prominent traces of his character as a great and good man. Next follows the praise to the messenger for his valuable service. The poem then gives a very short account of the author and date of composition and concludes with an elaborate piece of composition called "Sadara-chakra-bandhana" (a verse written in a wheel with six spokes).

Of my previous works the Cockatoo Sandesa was publised in 1906, and the encouragement I received from the vernacular press and the distinguished Singhalese scholars of the day induced me to devote a greater part of my leisure hours to this kind of literature. The editorial of the Lakminipahana commenting on the merits of the Cockatoo Sandesa as a poem is given at the end of the Singhalese Preface.

*Acrostics.*—The initials and finals of the first stanza read "සැහැසි වැඳ කියම්මෙ" (I compose this having adored Lord Buddha). The initials of the 2nd stanza mean " Please read the Ash-dove's message. The finals of the 38th stanza give the name of the author, those of the 83rd stanza the name of the addressee (Natha), and those of the 91st stanza the name of the incumbent priest of the Maha Vihara of Randombe. The initials of the 120th to 123rd stanzas convey the meaning "Please proceed to Totagamu Vihara where Sri Rahula Sanga Raja, the great professor on the Tripitakas resided." The last acrostic in the 150th stanza gives the purport of the poem, its initials reading "May the Maha Mudaliyar enjoy long life and prosperity".

Before concluding I have to acknowledge with thanks my indebtedness to my Singhalese tutor the erudite scholar Dhammatilaka Nayaka Thero, a worthy pupil of the famous Bopagoda Siri Sumna, Chief High Priest of the Amarapura sect of Buddhist Priests, and of the well-known Singhalese poet Mihiripenna Dhammaratana, for the careful revision of the poem. He is the author of the Vil-lihini Sandesa (a standard work of the present day in Singhalese), Kavlakara, Acharya-varnana, Jagarasthavirodha Varnana, Adhimasa Dipaniya, Adhimasa Bhedaya. Adhimasa Mandalaya, and a translation of Sasana Visuddhikata &c.

I have also to express my thanks to Sri Saranankara Thero, High Priest of Bentota and Principal of Sailantayatana Pirivena, and to my Pali tutor Sudassana Thero of Maha Vihara, Randombe—the chief honorary secretary and *anuvijjaka* (a judge of the priests) of the Saddhammavansa of the Amarapura sect. for the ungrudging and valuable suggestions I received from them.

Ratnagiri Walauwa, THE AUTHOR.
Balapitiya, October 22, 1913.

# පටුන.

සඥාපනය.


| පිට. | පෙළ. | |
|---|---|---|
| 1 | 2 | සන්දේශ නාමය. |
| ,, | 7 | සන්දේශ යැවීම පුරාණ සිරිතක්බව. |
| ,, | 21 | දූතයින්ගේ විශෙෂ විභාග. |
| 2 | 5 | මහමුදලිතුමාගේ උත්පත්තිය. |
| ,, | 9 | රජකුමරුන් කඩුකරලනුලැබීම. |
| ,, | 20 | සියනෑකොරලයේ මුදලිධුරයලැබීම. |
| ,, | 24 | මහමුදලි ධුරය ලැබීම. |
| ,, | 26 | සියනෑකෝරල වාසීන්ගෙන් රන් පදක්කමක් ලැබීම. |
| ,, | 27 | දියමන්ති ජුබිලි උත්සවය සඳහා එංගලන්තයටයාම. |
| ,, | 30 | ඇඩ්වඩ්. මහරජතුමන්ගේ මෞලිමඞ්ගල්‍යයගැණ එංගලන්තයට යාම. |
| ,, | 32 | සී. ඇම්. ජී. නාමය ලැබීම. |
| ,, | 34 | ඒ. ඞී. සී. නාමය ලැබීම. |
| ,, | 36 | නයිට් පදවිය ලැබීම. |
| 3 | 1 | නොයෙක් සමිතිවල සාමාජිකධුර ඉසිලීම. |
| ,, | 7 | මූත්තනුවන්ගේ නාමය ලඞ්කා ඉතිහාසයේ සඳහන්වී තිබීම. |
| ,, | 13 | සරණබන්ධනය. |
| ,, | 26 | රාජරාජ මහාමාත්‍යාදීන්ගෙන් ගරුබුහුමන් ලැබීම. |
| 4 | 8 | ගුණවතුන් වර්ණනාකිරීමේ ඵලය. |
| ,, | 30 | තීර්ථග්‍රාම විහාරයෙහි පෞරාණිකත්වය. |
| 5 | 12 | විජයබාහු පිරිවෙණ |
| ,, | 18 | ශ්‍රී රාමචන්ද්‍රභාරතී පඬිතුමා හා වෙනත් බ්‍රාහමණවරු විජයබාහු පිරිවෙණෙහි ඉගණගත්බව. |
| ,, | ,, | සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගල මාහිමියන්වහන්සේ තොටගමු විහාරයෙහි පැවිදිවීම හා කලක් විසීම. |
| 6 | 6 | බද්දේගමහාහල්පාතොටතොටගමුවිහාරයටඅයත්බව. |
| ,, | 18 | සීමාව සම්බන්ධ ශිලාලෙඛණය. |
| ,, | 33 | දිසා පිළිමහිමිතුමන්වහන්සේ. |
| 7 | 6 | කැලණිතිස්ස තෙරුන්වහන්සේ හා තෙලකටාහගාථා. |
| ,, | 13 | තීර්ථග්‍රාම විහාරය පිහිටි ප්‍රදෙශය දූන් තෙල්වත්ත යයි ව්‍යවහාර ප්‍රාප්තිය. |

| පිට. | පෙළ. | |
|---|---|---|
| 8 | 7 | මහා විජයබාහු රජතුමා කරවූ විජයබාහු පිරිවෙණ හතරවෙනි පරාක්‍රමබාහු රජතුමා ප්‍රතිසංස්කරණය කරවීම හා පොල්ගස් 5000කින් යුත් උයනක් පූජාකිරීම. |
| ,, | 28 | සිදත්සඟරා කතෘ. |
| 9 | 8 | ප්‍රතිරාජ පරිවෙණාධිපතීන්වහන්සේ පිළිබඳ විනිශ්චය. |
| 12 | 6 | සිදත්සඟරා කතෘ අනවමදර්ශී මාහිමියන්බව. |
| ,, | 30 | වෛදෙහ මහාස්වාමීන්ගේ සිංහලශබ්දලක්ෂණය සිදත් සඟරාව නොවනබව. |
| 14 | 9 | සිද්ධාන්තසංග්‍රහ නිර්මාණකාලය. |
| 15 | 6 | නාථදෙවෙන්ද්‍රයෝ. |
| ,, | 25 | සන්දේශ කාව්‍යයාගේ ක්‍රමය. |
| 17 | 5 | මූලාන්තාක්ෂරයන්ගෙන් විශේෂාර්ථ ප්‍රකාශකිරීම. |
| ,, | 21 | මේ සන්දේශයට ආධාරකළ භවතුන්වහන්සේලා. |
| 18 | 11 | කොකැටුසන්දේශයගැණ ලක්මිණිපහණේ පළවූ කතෘ වාක්‍යය. |

කාව්‍යය,

| | | | |
|---|---|---|---|
| 1 | —— | | ආශීර්වාදය හා නමස්ක්‍රියාව. |
| 2 පටන් | 10දක්වා | | දූතයාගේ විශේෂවර්ණනාව. |
| 11 | —— | | සන්දේශයදීමට විධානකිරීම. |
| 12පටන් | 34 | ,, | රත්දෙණ්ඩි වර්ණනාව. |
| 35 | —— | | පිටත්වන ස්ථානය. |
| 36පටන් | 38 | ,, | ගමනට අවසරගැණීම. |
| 39 | —— | | පිටත්වන මුහුර්තය. |
| 40 | —— | | පෙරමගනිමිති. |
| 41පටන් | 46 | ,, | පෙරමගවර්ණනාව. |
| 47 එම | 50 | ,, | බත්මුළුගල. |
| 51 එම | 90 | ,, | මහාමඞ්ගලසමුද්‍රාරාමය. |
| 91 එම | 93 | ,, | එහි වැසි භික්ෂූන්වහන්සේලා. |
| 94 | —— | | තෙළුම්විල. |
| 95පටන් | 100 | ,, | අම්බලම්ගොඩ. |
| 101එම | 105 | ,, | මාදම්පාගම. |
| 106 | —— | | අකුරල. |
| 107 | —— | | කහව |
| 108 | —— | | ගොඩගම. |
| 109සහ | 110 | ,, | තෙල්වත්ත. |

| | | |
|---|---|---|
| 111 පටන් | 119 දක්වා | තීර්ථග්‍රාමය. |
| 120 එම | 123 ,, | තීර්ථග්‍රාම විහාරය. |
| 124 එම | 128 ,, | නාථදේවමන්දිරය |
| 129 එම | 135 ,, | නාථදේවේන්ද්‍රයෝ. |
| 137 එම | 138 ,, | සන්දේශය ඔප්පුකිරීම. |
| 139 එම | 147 ,, | මහමුදලිමන්ත්‍රීශ්වරයානෝ. |
| 148 සහ | 149 ,, | නාථදේවේන්ද්‍රයන්ට යාඥකිරීම. |
| 150 | —— | කර්තෘනාම සංඥීතය. |
| 151 | —— | දූතයාට ආශිර්වාදය. |
| 152 | —— | සන්දේශ නිර්මාණකාලය. |

අවසානයෙහි කර්තෘනාම සංඥීත ෂඩරචක්‍රබන්ධනය.

අළුකොබෝ සංදෙශය කිරීමට ආරාධනාකළාවූ
දිනෙස් මැන්දිස් වික්‍රමරත්න සෙනානායක
මුහන්දිරම් මැතිතුමා.



DINES MENDIS WICKRAMARATNE SENANAYAKA
MUHANDIRAM.

RANDOMBE, BALAPITIYA.

## සංඥාපනය.

—*—

# අලුකොබෝ සන්දේශය.

අලුකොබෝ පක්ෂියකු දූතක්‍රියාවෙහි යෝජිත ආකාරයෙන් විරචිතබැවින් මෙම කාව්‍යය **අලුකොබෝ සන්දේශ** නම්.

“ප්‍රසිද්ධනායකී කාන්‍ය පුරුෂාන්‍යාථ යොෂිතඃ,
සන්දේශං ප්‍රේෂයෙ ද්දිමාන් දූතෛර්වංශාදිභිශ්ශුභෛඃ ”

යනාදීන් නිර්දිෂ්ටප්‍රකාර දූතකාව්‍යලක්ෂණයෙන් සමලඞ්කෘතකොට විරචිතව දෙවාදීන්ට සන්දේශ යැවීම පෞරාණික විදග්ධයන්ගේ සච්චරිත්‍රයෙකි.

එබැවින් ලාඞ්කික ජනශෙඛරායමානවූ අතිප්‍රසිද්ධ ගරු නයිට් පදප්‍රාප්ත **සර් දෙන් සල්මොන් ඩයස් අභයවික්‍රම ජයතිලක සෙනෙවිරත්න රජ කුමරුන් කඩුකරලූ බණ්ඩාරනායක** මහමුදලි මන්ත්‍රීශ්වරයාණන්වහන්සේ කාව්‍ය නායකකොට එතුමාණන් හා ස්වකීය මන්ත්‍රිණීයද පරපුරද යෙහෙන් ආරක්ෂාකරවාලීමු සඳහා (අන්‍යයෙකුට දූතනොවූ) අලුකොබෝ පක්ෂියා දූතකොට ගාලුනගර යට උතුරුදිග චතුර්දශක්‍රොශයක් පමණතැන මහා සමුද්‍රතීරාසන්න මහාමාර්ගයෙන් පූර්වදිග්භාගයෙහි පිහිටි තිස්සග්‍රාම (තොටගමු) විහාරයෙහි අධිගෘහිතවූ නාථදෙවෙන්ද්‍රයාණන්ට යවනුපිණිස රත්දෙණී සේනානායක වලව්වේ විසූ අපගේ ප්‍රේමවත් පියාණෝවන **දිනෙස් මැන්දිස් වික්‍රමරත්න සේනානායක** මුහන්දිරම් මැතිතුමන්ගේ ඇරයුමෙන් මෙශ්‍රාවිසින් හෙළදිව්බසින් ත්‍රිවිධකාව්‍යමුඛය අතුරෙන් නමස්ක්‍රියාමුඛයෙන් රචනාකරණලදය.

එහි දූතයෝ නම් — (**නිසෘෂ්ටාර්ථය, මිතාර්ථය, සන්දේශහාරකයයි** තිදෙනෙකි. පණිවුඩය කියනතැනැත්තාගේදලබනතැනැත්තාගේද අභිප්‍රායදැන එය තම සිත තබාගෙණ ඊට අවිරුද්ධව ප්‍රස්තාවොචිත උත්තර ප්‍රත්‍යුත්තර දී කාර්‍ය්‍ය නිෂ්පාදනයකරණ දූත තෙමේ නිසෘෂ්ටාර්ථ නම. ලත්පණිවුඩය පමණක් කියා කාර්‍ය්‍යනිෂ්පාදනයකරණ දූතතෙමේ මිතාර්ථ නම. රචනාකොට දුන් සන්දේශය ගෙණගොස් දීමපමණක්කරණ දූතතෙමේ සන්දේශහාරකනම්. දූතීහුද මෙසේමැයි. ඔවුන් අතුරෙන් මේ අලුකොබෝ පක්ෂිතෙමේ සන්දේශහාරක නම්වේ. ශාරිකාසන්දේශාදියෙහිලා ශාරිකාදීන් මෙනි.

මෙහි කාව්‍යනායකවූ මහමුදලි මන්ත්‍රීශ්වරයාණෝ වනාහි පෞරාණික ඉතාවැදගත් පෙළපතකින් පැවතඑන ගෞරවාර්හ උත්තමයෙකි. මෙතුමාණෝ 1862 මැයිමස 22 වෙනි දින වේයන්ගොඩ ස්වකීය පියාණන්ගේ වලව්වේදි උපන්සේක. ඉක්බිති පුරසඳසේ ක්‍රමයෙන් වැඩෙනුවෝ ශාස්ත්‍රෝද්ග්‍රහණයට තිසිවයස්වූකල සැන්තෝමස් නම් උසස් ශාස්ත්‍රශාලාවෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණය කොට ශාස්ත්‍රවත්වූහ.

1882 දි ලක්දිවට වැඩවදල ශ්‍රීමත් පස්වෙනි ජෝර්ජ් මහ රජතුමා හා උන්වහන්සේගේ වැඩිමාලු සහෝදරවූ ස්වර්ගස්ථවී වදාළ ඇල්බට් වික්ටර් ආදිපාදයාණන්වහන්සේ විසින් රජවාසල මුහන්දිරම් තනතුරට පත්කරණුලැබ එහි රාජකාර්‍ය මනාව ඉෂ්ට කළෝය. එය සිහිවීමපිණිස රජකුමරුන් කඩුකරලූ යන නාමය පටබඳිනලදි.

ඉක්බිති ස්වකීය පියාණෝවූ රජවාසල මුදලිතනතුර හා සාමදාන විනිශ්චයකාරධුරයද-තිලකෝලත් පොලිස් මහෙස්ත්‍රාත් ධුරයද දූරු දොන් ක්‍රිස්ටොපල් හැන්ඩ්‍රිකස් ඩයස් අභයවික්‍රම ජයතිලක සේනාවිරත්න බණ්ඩාරනායක මන්ත්‍රීශ්වරයාණන්ගේ ඇවෑමෙන් නෑගෙනහිර සියනෑකෝරළයේ මුදලි ධුරයට පත්කරණු ලැබූහ.

ස්වකීය ඥාතියෙක්වූ දොන් කොන්රාඩ් පීටර් ඩයස් බණ්ඩාරනායක මහමුදලි මන්ත්‍රීශ්වරයාණන්ගේ අභාවයෙන්පසු ශ්‍රීමත් සර් ආර්තර් හැව්ලොක් ලංකේශ්වරයාණන්වහන්සේ විසින් 1895 දී ගරු මහමුදලි තනතුර හා සමස්ත ශ්‍රී ලංකාද්වීපයෙහි සාමදාන විනිශ්චයකාර ධුරයද දෙවා වදාරා රන්කඩු කර පලඳවනලදහ. 1896 දී සියනෑකෝරළ වාසීන් විසින්ද රන්පදක්කමක් ත්‍යාගීකරණලදි.

1897 දී මෙතුමාණෝ වික්ටෝරියා මහාරාජිනින්වහන්සේගේ දියමන්තිජුබිලි උත්සවයසඳහාලංකාව වෙනුවෙන් එංගලන්තයේ රාජ්‍යාමාත්‍යයෙකුමෙන් පෙණීසිටීමට පත්කරණලදුව එහිපැමිණ ස්වර්ණමුද්‍රිකාවක් (රන්පදක්කමක්)ද ස්වර්ගස්ථවී වදාළ සත්වෙනි ඇඩ්වඩ් මහරජතුමන්වහන්සේගේ මෞලිමඞ්ගල්‍යයේදීද එසේම ලංකාව වෙනුවෙන් එංගලන්ත රාජ්‍යයේ අමාත්‍යයෙකුමෙන් පෙණීසිටීමට පත්කරණලදුව 1902 දී එහිපැමිණ සී. ඇම්. ජී. යන ගරුනාමයද ලැබූහ. ලංකේශ්වරයන් වහන්සේගේ අමාත්‍යධුරයවූ ජේ. පී. සී. යන ගරු තිලයටද පත්කරණලදහ. 1907දී නායිට්පදවිය හා කාම්බෝජ රජතුමා විසින් ගරු අමාත්‍ය තනතුරකටද පත් කරණුලැබූහ.

තවද මෙතුමාණෝ නොයෙක් ගරු සමිතිවල ප්‍රධානත්වයද උපප්‍රධානත්වයද සාමාජික ධුරද උසුලති, ස්වර්ණරජත මුක්තාමාණික්‍යාදි ධනයෙන් හා ශතවිධ ධාන්‍යයෙන්ද විශාලවූ දර්ශනීයවූ ප්‍රාසාදාදි ගෘහයන්ගෙන්ද කෙත්වත් ආදියෙන්ද හස්ත්‍යශ්වරථාදි යානවාහනයන්ගෙන්ද ආඪ්‍යයහ.

මෙතුමාණන්ගේ පියපාර්ශ්වයේ මුත්තණුවෝ නම් සර් ඇමර්සන් ටෙනැන්ට් නම් මහලේකම්මැතිතුමාවිසින් විරචිත ලංකා ඉතිහාසයේ දෙවෙනි කාණ්ඩයේ සඳහන්ව තිබෙණ දොන් සලමොන් ඩයස් බණ්ඩාරනායක මන්ත්‍රීශ්වරයාණෝය.

මෙතුමාණෝ ගරු නයිට් පදප්‍රාප්ත නීතිදායක මන්ත්‍රණසභාවේ සිංහල මන්ත්‍රීවරයෙක්වූ සර් සලමොන් ක්‍රිස්ටොපල් උබයසේකර මන්ත්‍රීශ්වරයාණන්ගේ දුහිතෘවන ඩේසි ඇස්ලින් නම් මැතිනිය සමග 1898 දී සරණබන්ධන ප්‍රාප්තවූහ, මේ මන්ත්‍රිණීතොමෝ වනාහි නෛකස්ත්‍රීගුණාඪ්‍ය සඞ්ගත ස්ත්‍රීරත්නයකි.

මෙම මන්ත්‍රිණියගේ මාතෘවන උබයසේකර ආර්යාව වනාහි වංශාධිපති ජේම්ස් ද අල්විස් මන්ත්‍රීශ්වරයාණන්ගේ ද්විතීය දුහිතෘවයි, එම ජේම්ස් ද අල්විස් මන්ත්‍රීශ්වරයාණන්ගේ මන්ත්‍රිණිය නම් නයිට් ස්ථානාන්තරප්‍රාප්ත සර් හැරි ඩයස් ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාවේ විනිශ්චයකාර මන්ත්‍රීශ්වරයාණන්ගේ සහෝදරිය.

යථෝක්ත උබයසේකර මැතිතුමාණන්ගේ වැඩිමාලු සහෝදරයාද නීතිදායක මන්ත්‍රණසභාවේ සිංහල මන්ත්‍රීධුරය කලක්දැරූ වංශාධිපති ජේම්ස් පීටර් උබයසේකර මැතිතුමායි, වංශාධිපති උබයසේකර මන්ත්‍රීයුග්මයේ දෙගුරුහුනම් තල්පේපත්තුව කරවූ ඩී. බී. ඇජ්f. උබයසේකර මුදලිතුමා හා කොර්ණේලියා සුසානා ඩයස් බණ්ඩාරනායක මන්ත්‍රිණියද යන දෙපලය.

පස්වෙනි ජෝර්ජ් මහරජතුමන්වහන්සේගෙන් හා උන්වහන්සේගේ ජනකවූ ස්වර්ගස්ථවූදළ සත්වෙනි ඇඩ්වඩ් මහරජතුමන්වහන්සේ ගෙන්ද වික්ටෝරියා මහාරාජිනීන් වහන්සේගෙන්ද ඉංග්‍රීසි මහරජපවුලේ අන්‍ය කුමාර කුමාරිකාදීන් ගෙන්ද මන්ත්‍රීන්ගෙන්ද මෙතුමා පමණ ගරුබුහුමන් ලැබූ අන්‍ය ලාංකිකයෙක් නැත්මැයි.

ඒ රාජරාජ මහාමාත්‍යාදීන් සමග සංචාරණයකල සියලු අවස්ථාවලදීම මෙතුමාණෝ මුළු ලක්දිවටම ගෞරව ලැබෙනසේ ක්‍රියාකළෝය.

උසස් පහත් පොහොසත් දුප්පත් උගත් නූගත් සියලුදෙනාකෙරෙහි ක්ෂාන්තිකරුණා මෛත්‍රියෙන් යුක්තව ජාතිභෙද ආගම්භෙදාදියෙන් තොරව සර්වසාධාරණව ස්වදෙශවාසින්ගේ ශුභසිද්ධියම පරමාර්ථකොටගෙණ රාජකාර්‍ය්‍යකරණ මේසා ගරු ස්ථානාන්තරප්‍රාප්ත ස්වදෙශික මන්ත්‍රිවරයෙක් මෙකල දර්ශනය අතිදුර්ලභ මැයි, මේ මහොත්තමයාණන් කෙරෙහි පිහිටි සජ්ජන වර්ණනීය නෛසර්ගික ගුණ සමුදායම මෙම සන්දෙශරචනාවට හෙතුවිය.

ගුණවතුන්ගේ ගුණවර්ණනාකරණ ව්‍යක්තතෙමේ සභාහි විජෘම්භමානවේ. ඒබව: —

ප්‍රබුදුකළ කුමුද න
සඳරැසමෙන් දියුණුව න
මෙරමා ගුණවණ න
වියත් පැළඹේ සෙබේ හොබමින

යන පණ්ඩිතවචනයෙන් ප්‍රකාශිතයි, මෙවැනි උත්තමයන්ගේ ගුණවර්ණනාවට මේසා කුඩාප්‍රකරණයක් ප්‍රමාණනොවේ, එසේදවූවත්:—

පරසතුමලින්පු ද
ලදමුනිසඳුට දියත ද
වනපසමලින්පු ද
කලසි පවසනු කවර වරද ද

යන ආප්තොපදෙශානුගතවද එකශ්ලොකිය භාගවත සප්තශ්ලොකිය භාගවතාදියගැනද සලකතකල මහාකාව්‍යයකින් වර්ණනීයමෙතුමාණන් කුඩාකාව්‍යයකින් වර්ණනාකිරීමද නිර්දොෂමැයි.

වංශයෙන්ද සච්චරිත්‍රයෙන්ද තදන්‍ය නානාවිධගුණාඪ්‍යයන් ගෙන්ද අග්‍රප්‍රාප්තවූ මෙතුමාණන්හා පරම්පරාවද ආයුරාරොග්‍යාදි සකලෛශ්වර්‍ය්‍යාභිවර්ධනයෙන් යුක්තකොට චිරකාලයක් යෙහෙන් ආරක්ෂාකරවාලීම අපවැන්නන්විසින් කර්තව්‍යයකැයිවැටහිගියෙන් නීතිඥධූරයපිළිබඳවූද තදන්‍යවූද කර්තව්‍ය බාහුල්‍යයනිසා මෙය ඉතා අනවකාශයෙන් කරණලද්දේය.

යථොක්ත නිඃශ්‍රාම්විහාරය වනාහි ඉතා පුරාණකාලයෙහි පටන් අතිප්‍රසිද්ධවිහාරයකි, මීට අවුරුදු හාරසියඅනූගණනකට පමණපෙර හවෙනි පැරකුම්බාරජතුමන්ගේ කාලයෙහි විසූ පණ්ඩිවරයෙකුවිසින් රචනාකරණලද ගිරාසන්දෙශයෙහි "පෙරසිට ඉටුහො

පටු- තොටගමුවෙහෙර විසිතුරු”-යන්තෙන්ම මෙම විහාරය එකලත් පුරාණවිහාරයක්මෙන් ව්‍යවහාරවූබැව් ප්‍රකාශවේ, මෙම විහාරයෙහි රහතන්වහන්සේලා පන්සියනමක් එකලවැඩසිටිබැවින් **රග්පග්** (රහත්පත) යනනාමය ව්‍යවහාරප්‍රාප්තවීයයි මුඛපරම්පරාගත වාර්තායි.

මෙම විහාරය වනාහි වර්තමානකාලයෙහි මහාබ්‍රිතාන්‍යරට වල පවත්නා සංස්කෘත ශාස්ත්‍රශාලාමෙන් කලක් නානා ශබ්දශාස්ත්‍ර සම්බන්ධ ප්‍රසිද්ධියක් ඉසුලූයේය.

පදසාදනටීකාව පඤ්චිකාප්‍රදීපය කාව්‍යශෙඛරය සැලලිහිණි අස්න පරවිඅස්න යනාදි ප්‍රශස්තතර ග්‍රන්ථයන්හි කර්තෘභූත සකල කවිකුල තිලකායමානවූ ෂඩ්භාෂාපරමෙශ්වර **ශ්‍රීරාහුල** මහාස්වාමීන්ද්‍රයන්වහන්සේවිසූ **විජයබාහුපිරිවෙණ** පිහිටියේත් මෙම විහාරයෙහිය

එකල මෙමපිරිවෙණේ ප්‍රසිද්ධිය කොපමණ ව්‍යාප්තවතිබුනාද කියතහොත් බෞද්ධශතකය වෘත්තරත්නාකරපඤ්චිකාව වෘත්තමාලාඛ්‍යාව යනමේ ග්‍රන්ථයන්හි කර්තෘවූ තර්කව්‍යාකරණ කාව්‍ය නාටකාදි සමස්ත ශාස්ත්‍රාතිදක්ෂ විචක්ෂණ කාශ්‍යප ගොත්‍රසම්භූත බෞද්ධාගමචක්‍රවර්ති **ශ්‍රීරාමචන්ද්‍රභාරතී** නම් බ්‍රාහ්මණපණ්ඩිතොත්තමයා පවා මෙම පිරිවෙණටපැමිණ ශ්‍රීරාහුල මහාස්වාමීන්ද්‍රයන්වහන්සේගෙන් බුද්ධධර්මයඉගෙණගත්තේය.

තවද ගිරාසන්දෙශයෙහි:—

“ තියුණු නැණින් කරමින් සැක නිවා රණ
පමුණු වමින් එකිනෙක සමයකා රණ
දපුණු සිතින් ඉඳකර වෙහෙර පූ රණ
බමුණු රුසෙක වේදරුත් කරණද රණ ”.

යන්තෙන් වෙනත් බොහෝ බ්‍රාහ්මණයන්ද මෙම විජයබාහු පිරිවෙණෙහි ශාස්ත්‍රෝද්ග්‍රහණයකළබව ප්‍රකාශවේ, මෙම පිරිවෙණට ආසන්නව පිහිටාතිබෙන බමුණුවත්ත මෙම බ්‍රාහ්මණයන්ගේ නිවාසස්ථානයයි සැලකියහැක, මේ අසල නටබුන්විගිය විශාල පොකුණුහතක්ද මේදක්වා තිබෙනහෙයින් හා ගිරාසන්දෙශයෙහිපෙණෙනැකියමන්වලින්නුත් මෙහි බොහෝභික්ෂූන් ශාස්ත්‍රෝද්ග්‍රහණයකළ බව මනාව ඔප්පුවේ.

කොළඹ නවකෝරළයේද ගාලුකෝරළයහා ශ්‍රීපාදස්ථානයෙහිද ප්‍රධාන සංඝනායකපදවියදැරුවාවූ විද්‍යොදය පරිවෙණාධිපතිව

විසූ සිප්කඩුවෙ ශ්‍රීසුමඞ්ගල මාහිමියන්වහන්සේ පැවිදිව කලක් වැඩසිටියේත් යථොක්ත තිඹිරිග්‍රාම විහාරයෙහිය.

එහි නාථදෙවමන්දිරයඅසල මහබද්ගම කියා පුරාණසිංහල අකුරු කොටනලද ශිලාලෙඛණයක්දතිබේ, ඒ මහබද්ගමයනු බද්දේගම සඳහා කියනලද්දක්දැයි ශඞ්කාකළහැකිය.

ගිංගගේ එක්තීරයක බද්දේගමද අනික්තීරයෙහි හල්පාතොටද පිහිටාතිබේ, ඒගම්දෙකම පුරාණකාලයේදී ඒ විහාරවාසී සඞ්ඝයාවහන්සේටසිවුපසයපිණිස පූජාකරන්ටඇතැයිසිතියයුතුය, මෙම ගම්දෙක පිහිටාතිබෙන්නේත් තොටගමුවිහාරයේසිට හැතැප්ම 6 ක් පමණදුරිනි, ශිලාලෙඛණයේ අකුරුගැණ කල්පනාකරණවිට ක්‍රිස්තුවර්ෂයෙන් 10 වෙනිහෝ 11 වෙනිශතවර්ෂයේදී ව්‍යවහාරකළ අකුරුයයි සිතියහැක.

ක්‍රිස්තුවර්ෂ. 1872. මුද්‍රිත සිප්කඩුවේ ශ්‍රීසුමඞ්ගල මාහිමියන්වහන්සේවිසින්ලියනලද කාව්‍යශෙඛරව්‍යාඛ්‍යාසංඥපත්‍රයෙහි මෙසේ කියාතිබේ:—

“එහි අල්ලනලදගල්වලින් බොහොමයක් මේතාක්පවතී, එහි කැඩුණු ගල්කැබැල්ලක පුරාණසිංහල අකුරුකැබලි දෙකක් තිබේ, ඉන්එකක වාචිස්සරපසමුඛ කියාත් අනිකේ එන්පයිමාබඩ කියාත් තිබුණා අපටදකින්ටලැබුණනමුත් ගල ඔබ මොබ ලැමෙන් එපමණත් කියවාගන්ට නුපුළුවන්ලෙස පලුදුවීතිබේ”–යනුයි.

සවෙනි පරාක්‍රමබාහු මහරජාණන්ට ශාන්තියලබාදීමපිණිස යාච්ඤාකරණලෙස තොටගමුවේ ශ්‍රීරාහුල මාහිමිතුමන්වහන්සේ ව රචනලද සිරසන්දේශ යෙහි කිපතැනකම මෙම විහාරය වර්ණනාකරතිබේ.

එමසන්දේශයේ 215 වෙනිදශපදසැහැල්ලෙන් එහිදිශාපිළිම හිමි නමින් ලඞ්කාවට ශාන්තියපිණිස ශක්‍රදෙවෙන්ද්‍රයාවිසින් මාපිත පිළිමයක්ද තුබුණබව පෙණේ. ඒ මෙසේයි:–

“ ලකරද ඉසුරුලද – දද කැළණිතිස් මහරද
ස විර ද වරද තතුලෙස නොදැන පිරිසි දේ
නිවර ද වරද හිමිඳුට වරද කළ ස දේ
කිරියෙන් සුරන් සිත් – සිදු එතවෙරළ මැඩගෙණ
තිසා මෙලක සෙත එම මුහුදු පැහැ මැ වූ
දිසා පිළිමරුව දැක සක්දෙවිඳු මැ වූ
රුදුව සෙතගගෙණ ආවසවතු සුද ට
මුදු ව බිඳු තෙපලින් ජයගෙණ ලොව ට
බුදු ව නොයෙක් සෙත්කළ අපමුනිසඳු ට
වදු ව අදර බැතිපෙම් සිත් දියුණුකො ට.”

අභිසම්බකාරිව **කැලණිතිස්ස** මහරජහුවිසින් කරණලද මේ ඝෝරතර භයඞ්කර ක්‍රියාව මහාවංශයේ 22 වෙනි පරිච්ඡේදයේද සඳහන්කරතිබේ.

කැලණිතිස්සරජව්තාහි **දුටුගැමුණුරජහුගේ** මාතාබිසවුන්ගේ පියරජතුමාය. **තෙලකටාහගාථා** නම් මාහැඟි ගාථාසියයකින් යුත් ග්‍රන්ථය මේ **කැලණිතිස්ස** නම් ක්ෂීණාශ්‍රවයන්වහන්සේගේ රචනාවකි. මෙය මාවිසින් අථොලිපිසමග ඉංග්‍රීසියටපෙරළනලදුව වර්‍ෂ 1890 දී බුඩිස්ටගරාවේ පළකරවනලදි. සාමදනවිතිශවයකාරධුරන්ධර **ජ්. ආර්. ගුණරත්න** වාසලමුදලිමහත්තුවරයන්විසින්ද මෙම ග්‍රන්ථය ඉතාප්‍රයොජනවත් සංඥපනයක්සමග වර්‍ෂ 1884 දී ඉංග්‍රීසි පාලිපොත්සමාගමේ (පාලිටැක්ස් සොසයිටි)වාර්‍තාපොතේ ප්‍රසිඬකරණලදී.

යටෝක්තවිහාරය තුබුණු ප්‍රදෙශය පුරාතනයේදී **තොටගමුව** යන නමින් ප්‍රසිඬ නමුත් දැන් **තෙල්වත්තයයි** ව්‍යවහාර කරණුලැබේ. විහාරයට තෙල් සපයන පිණිස ඒ හාත්පස පොල් ගස් 5000 කින්යුත් උයනක් **පරාක්‍රමබාහු** මහරජාණන් විසින් කරවනලදහෙයින් ඒ ප්‍රදෙශයට **තෙල්වත්ත** යන නාමය ව්‍යවහාරවිය. ඒ සඳහා**මහාවංශයේ** 90 වෙනි පරිච්ඡේදයේ මෙසේ ඇතුවාතිබේ.

"**තිත්ථගාම** විහාරස්මිං **මහාවිජයබාහුනා**,
පරිජිණ්ණා අහුදිස පාසාදෙ තස්ස සොපුන.

**පරක්කමභුජො රාජා** තිංසහත්ථායතං සුභං,
විභූමිං දිස්පාසාදං තුඞ්ගසිඞ්ග සමායුතං.

කාරාපෙත්වාන තං නානා විතාන කම්මනා භාසුරං,
තද **විජයබාහු** නාම පරිවෙණාධිවාසිනො.

**නාගසත්ථි** මහාථෙර භදන්තස්ස සම්පපයි,
උපගිම්භතදීතිරං සාලගාමාභිධානකං.

ගාමෙකච පදාපෙසි කත්වා තප්පාරිවේණිකං,
පුනතං පඤ්චසහස්සෙහි නාළිකෙර තරූහි සො;
ආරාමං කාරයී තස්ස **තිත්ථගාමෙ** මනොරමෙ."

" **මහාවිජයබාහු** නරෙන්‍ද්‍රයන්විසින් **තොටගමුවිහාර** යෙහි කරවනලද සතලිස්පස්රියන් අයම්වූ ප්‍රාසාදයතෙම යම්තැනෙක්හි හාත්පසින් දිරාගියේද එතැන්හි නැවත **පරාක්‍රමබාහු** නරෙන්‍ද්‍රතෙම තිස්රියන් දිගඇත්තාවූ යහපත් තුඟුකැරලිඇති දෙමහල්දිගුප

හයක් කරවා නානාවිධ චිත්‍රකර්මයෙන් බැබලීමකරවූයේය. එකල්හි විජයබාහු පරිවෙණාධිපති කාශ්‍යප නම් පින්වත් මහාස්ථවිරයන් වහන්සේට එම්රජතෙම ප්‍රාසාදය ප්‍රදානයකරවූයේය. ගිංගඟුවර වෙත පවත්නාවූ සල්ගමු (හල්පාතොට) නම් එක්ගමක්ද පිරිවෙණට අයත්කොට දෙවූයේය. හෙතෙම පන්දහසක් නෙරළුතුරුවලින් යුත් අරමක් මනහර නොවගමුවෙහි කරවූයේය " යනුයි.

මේහි සඳහන්වූ මහාවිජයබාහුරජ නම් ශ්‍රී සඞ්ඝබෝධි විජයබාහු මහලුවිජයබාහු යන නම්වලින් ප්‍රසිද්ධවූ ක්‍රිස්තුවර්ෂ 1065 දී රාජ්‍යාභිෂේකලැබ 55 අවුරුද්දක් ලංකාරාජ්‍යානුශාසනාකළ පළමුවෙනි විජයබාහු රජතුමාය.

මේ රජතුමාවිසින් සොළීන් යුධකීපයකින් පරාජයකොට මුහුදින්එතරට පළවාහැර රාමඤ්ඤදෙශයෙන් මහණඋපසම්පදාව ගෙන්නා ලංකාශාසනය නැවතපිහිටුවා ජරාවාසවූ බොහෝවිහාර ප්‍රතිසංස්කරණයකරවා අභිනව විහාරකීපයක්ද කරවා සඞ්ඝයා වහන්සේට නානාවිධ පූජාකොට ශාසනාභිවෘද්ධිය කරණලද්දේය.

මෙහි "තිසගාමවිහාරසම්ං" යන්නාදි ගාථාවලින් දක්වනලද පරාක්‍රමබාහු මහරජතුමා නම් ක්‍රිස්තුවර්ෂ 1295 දී ලංකාරාජ්‍යශ්‍රීපද ප්‍රාප්තවූ (පන්සියපනස්) ජාතක පොත්වහන්සේ සිංහලට නගාලූ හතරවෙනි පරාක්‍රමබාහු මහරජතුමාය.

වේදේහ මහාස්ථවිරපාදයන්වහන්සේවිසින් සිදත්සඟරාව කරණලද්දේත් මේරජතුමාගේ කාලයෙහියයි ඇතම්හවතුන්ගේ මතයි. සමහරු තුන්වෙනි පරාක්‍රමබාහු මහරජතුමාගේ කාලයෙහි යයිද කියත්.

නමුත් එයකරණලද්දේ අනවමදර්ශීසංඝරාජ මාහිමියන්වහන්සේවිසින් ක්‍රිස්තුවර්ෂ 1240 වැන්නේ රාජ්‍යාභිෂේකලැබපන්තිස් වසක්රජයකළ කවිජනසභාවනීයවූ විසුද්ධිමාර්ගසන්න කව්සිළුමිණ ආදි ග්‍රන්ථයන්හි කර්තෘවූ කලිකාලසාහිත්‍ය සර්වඥ පණ්ඩිතයයි ප්‍රසිද්ධ දෙවෙනිපරාක්‍රමබාහු මහරජතුමන්ගේ කාලයෙහිබව මතුදක්වන කරුණුවලින් නිශ්චයකළහැකිය.
සිදත්සඟරානිගමනයෙහි:—

" දකුණලකසියල්-බුජමහවුරේනි රක්නා,
දෙදෙව් රදළ ගම්විමනග-පතිරජදෙව් සැරදෙනෝ.

අදරෙන් යදත ඔහු-විබත්තිරණස සියබස,
පළකරණුවස් මෙනෙළෙම්-කුළුණෙන් සිදත්සඟරා.

යන්නෙන් හා විභක්ත්‍යධිකාරාවසානයෙහි සකලවිභක්තිදක්වන:-

"දෙනෙ දූත මෙ සිදත පතිරජ පි  රුවන
සැකෙවිනි පළකළ දූනුමට ස  රුවන
දද බැවි නිවරවැ මහගතු ක  රුවන
සෙබෙ වති වැජඹෙත සජනෙති වැ  රුවන"

යන්නෙන්ද සිදත්සඟරාව ප්‍රතිරාජදෙව අමාත්‍යානනමයාණන්ගේ ඇරයුමෙන් ප්‍රතිරාජ පරිවෙණාධිපතීහු විසින් කරණ ලදබැව් ප්‍රකාශවේ, මෙම ප්‍රතිරාජ පරිවෙණාධිපතීහු නවරහුදයත්:—

"ප්‍රතිනෘපති මහාවිහාර නෙතා-
ක්‍ෂිති සුරවංශජනි මුනිඥ සූනුඃ,
ඉද මනවමදර්ශිනාමධෙයඃ
පරම කරොත් කරණං පරොපකාරම්-"

"ප්‍රතිරාජ මහා විහාරයෙහි නායකවූ (ප්‍රතිරාජ පරිවෙණාධිපතිවූ) බ්‍රාහ්මණ වංශොද්භූතවූ අනවමදර්ශී නම් බුඩ පුත්‍රතෙමේ උතුම්වූ මේ පරොපකාර කරණ නම්වූ ප්‍රකරණය කෙළේය" යන්නෙන් ප්‍රකාශවූ අනවමදර්ශි සඞ්ඝරාජ මාහිමියන්වහන්සේය.

මෙහි "ප්‍රතිනෘපති මහා විහාර" යන්නෙන් ප්‍රකාශවන්නේ ප්‍රතිරාජ පිරිවෙණ නොව ප්‍රතිරාජ මහාවිහාරයයි සමහරු සළකත්. මහාවංශයෙහි යථොක්ත රජතුමාගේ පුණ්‍යක්‍රියාදිය සඳහන් වන 85 වෙනි පරිච්ඡේදයෙහිම:-

"තතො ගන්ත්වා පරක්කම බාහු නාමො සනාමතො,
පරිවෙණඤ්ච කාරෙත්වා තුඞ්ගපාසාද මණ්ඩිතං.
නානා කප්පිය භණ්ඩ ච භොගගාම වරෙ බහූ,
දත්වා තස්ස විහාරස්ස මහාපූජංච කාරයි-"

යනාදියෙහි "පරිවෙණඤ්ච කාරෙත්වා තස්ස විහාරස්ස"-"පිරිවෙණක්ද කරවා ඒවිහාරයට හෙවත් ඒ පිරිවෙණටය"යි යොදා තිබීමෙන් පරිවෙණ විහාර ශබ්දවය පර්‍යාය නාමලෙස එකල ව්‍යවහෘත බැව් මනාව ස්ඵුටවේ.

තවද විහාරශබ්දය සුගතාලයවූ ගඳකිළිය භික්ෂූන්ගේ ආවාස ගෘහ යනාදියට ව්‍යවහාර කරණලදබැව් පෙණෙන හෙයින් පරිවෙණ ශබ්දයෙන් ප්‍රකාශවන්නේ ශාස්ත්‍රාගම උගන්වන ස්ථානයක් වුවත් හෙද විහාරස්ථානයක් තුළම පිහිටි හෙයින් විහාරාධිපතියයි

කිකල පරිවෙණාධිපතිත්‍වයද එයින්ම ප්‍රකාශවනබැව් සලකා "ප්‍රති නෘපතිමහාවිහාරනෙතා"කියා යොදන්ටඇතැයිකල්පනාකළයුතුය.

එම්පමණක්ද නොව ප්‍රතිරාජ මහා විහාරයයි කියා තිබෙන හෙයින් මෙම මහාවිහාරය පිරිවෙන් (ආවාසගෘහ) ගඳකිළි යනාදියෙන් යුක්තවියයුතුය, මෙම මහාවිහාරයතුළ පිරිවෙණක් පිහිටුවා ඊටද ප්‍රතිරාජ පිරිවෙණ කියා ව්‍යවහාරකරණලදැයිද සැළකිය හැක්කේය.

වර්තමාන කාලයෙහිද **ශෛලාන්තායතන** විහාරයෙහි පිහිටි පිරිවෙණට **ශෛලාන්තායතන** පිරිවෙණ කියාද **මහාචෛත්‍යාරාම** යෙහි පිහිටි පිරිවෙණට **මහාචෛත්‍ය** පිරිවෙණ කියාද **අග්‍රබෝධි** විහාරයෙහි පිහිටි පිරිවෙණට **අග්‍රබෝධි** පිරිවෙණ කියාද ව්‍යවහාර කරන්නාක්මෙනි.

මේ ආදි කරුණුවලින්හා **ප්‍රතිරාජ පිරිවෙණ** එක්ස්ථානයකත් **ප්‍රතිරාජ මහාවිහාරය** අන්‍ය ස්ථානයකත් පිහිටි බවක් නොදක්නා ලද හෙයිනුත් "ප්‍රතිනෘපති මහාවිහාර" යන්නෙන් දක්වන්නේ **ප්‍රතිරාජ පිරිවෙණම** බැව් සුවිනිශ්චිතය.

තවද මහාවංශයේ 86 වෙනි පරිච්ඡේදයේ-:

"තතො ගන්ත්වාන සො **හත්ථවනගල්ල විහාරකං**,
රඤ්ඤෝ වුත්තනියා මෙත කත්වා බහුධනබ්බයං.

කාරාපෙත්වාන පාසාදං තුඞ්ගසිඞ්ගං තිභූමකං,
**අනොමදස්සි** නාමස්ස මහාසාමිස්ස ධීමතො.

තං දත්වාන තතො තස්ස මහාරාජනියොගතො,
දනවට්ටම්පි කප්පෙත්වා සිලාලෙඛ මකාරයි.

යන්නෙන් ප්‍රතිරාජ අමාත්‍යයා විසින් **පරාක්‍රමබාහු** මහරජාණන්ගේ නියමයෙන් මහත්ධන වියදම්කොට ප්‍රතිසංස්කරණය කරණලද අත්තනගල්ල විහාරය **අනවමදර්ශි** මහාස්ථවිරයන්වහන්සේට පුදකළබව පෙණේ.

මේ ප්‍රතිරාජ අමාත්‍යතෙම දෙවෙනි **පරාක්‍රමබාහු** මහ රජතුමන්ගේ අමාත්‍යයෙක්බව මහාවංශයේ 86 වෙනි පරිච්ඡේදයෙන්ද පූජාවලියෙන් හා **නිකාය සංග්‍රහයෙන්ද** අත්තනගලුවංශයේ 11 වෙනි පරිච්ඡේදයේ:—

"සො **පරක්කම**බාහු මහානරින්දෙ **හත්ථවනගල්ල** මහාවිහාරෙ **අත්තනො** පිතුමහාරඤ්ඤෝ ආළාහනට්ඨානෙ මහාචේතියං

බන්ධාපෙත්වා තත්ථෙව අනෙකභික්ඛුසහස්ස පරිභුඤ්ජනං පාසාදවරං
චිරකාල විනට්ඨං සුත්වා ධනුක්කෙතකවත්ථු වංසෙ ජාතං සද්ධාදි ගුණස
ම්පත්ති සමුදිතං **පතිරාජදෙව** නාමකං අමච්චවරං පෙසෙත්වා තෙන
අනෙකසහස්ස ධනපරිච්චාගෙන භූමිභිත්ති මණ්ඩිත මනොහරං පු
රෙවිය තං පාසාදං කාරාපෙත්වා තත්ථ නිවසන්තානං අනෙකෙසං
භික්ඛූනං නිච්චපච්චයප්පදානං පවත්තෙසි"—

"ඒ (දෙවෙනි) **පරාක්‍රමබාහු** නම් මහාරාජෝත්තමතෙම **අත්ත
නගලු** විහාරයෙහි තමන්ගේ පියරජහු ආදාහනකළාවූ ස්ථානයෙහි
මහාචෛත්‍යයක් බඳුවා ඒවිහාරයෙහිම දහස්ගණන්රහතන්වහන්
සේලා විසින් පරිභොගකරණලද්දාවූ උතුම්වූ ප්‍රාසාදයක් නටබුන්වී
බොහෝකලක් ගියබැව් අසා **ධනුක්කේතු** වංශයෙහි උපන්නාවූ
ශ්‍රද්ධාදි ගුණසමෘද්ධියෙන් විශෙෂයෙන් ප්‍රසිද්ධවූ **දෙවප්‍රතිරාජ** නම්වූ
අමාත්‍යොත්තමයන්යවා ඒ අමාත්‍යයාලවා නොයෙක් දහස්ගණන්
ධනපරිත්‍යාගයෙන් භූමිපරිකර්මයෙන් හා භිත්තිපරිකර්මයෙන් ප්‍රති
මණ්ඩිතව මනොහරකොට පළමු පරිද්දෙන් ඒ ප්‍රාසාදය කරවා ඒ
විහාරයෙහි වාසයකරන්නාවූ බොහෝ භික්ෂූන්වහන්සේලාට නිර
න්තරයෙන් (චීවරාදි සිවු) පසදනය පැවැත්වූයේයි" යන්නෙන්ද
ප්‍රකාශවේ.

**පරාක්‍රමබාහු** මහරජතුමා තමන්ගේ නාමයෙන් පිරිවෙණක්ද
යුවරජණන්ගේ-නමින් පිරිවෙණක් හා තවත් පිරිවෙන් කීපයක්ද
කළබව **මහාවංශයෙන්** පෙණේ.

ඒ කරවනලද පිරිවෙන් අතුරෙන් එක්පිරිවෙණක් ශාසන සං
ග්‍රහ භාරධාරී සැදැහැවත් තම හිතෛෂී ප්‍රතිරාජ නම් ඇමතියා න
මින්ද කරවන්ට ඇතැයි කල්පනාකළහැකිය, ප්‍රතිරාජපිරිවෙණ න
මින් ප්‍රසිද්ධවූයේත් ඒපිරිවෙණ වියයුතුය, එය එම ඇමතියාණන්
විසින් අතිශයාදරයෙන් සලකනු ලැබූවාවූද **අත්තනගලු** විහාරය
පූජාකළාවූද අනවමදර්ශී සඞ්ඝරාජ මාහිමියන්වහන්සේටම පුදන්ට
ඇතැයි සිතීමට "ප්‍රතිනෘපති" යනාදි ශ්ලොකයද ස්ථිර සාක්ෂ්‍යයකි.

තවද **නිකාය සංග්‍රහයෙහි මහානාම** රජුදවසපටන් දෙවෙනි
**පරාක්‍රම**බාහු රජතුමන්ගේ කාලය දක්වා ලඞ්කාවේ විසූ ශ්‍රෙෂ්ඨ ප
ණ්ඩිතයන්ගේ නම් දැක්වීමේදී **අනවමදර්ශි සංඝරාජ** මාහිමියන්
වහන්සේ එම දෙවෙනි **පරාක්‍රමබාහු** මහරජතුමාගේ කාලයෙහි වි
සූබව ප්‍රකාශවනහෙයින්ද—

**අත්තනගලුවංශයෙහි:—**

" බුහ්මණ්ඩයෙනානුගතපඤ්චමනොමදස්සි,
බ්‍යාතෙන සඞ්ඝපතිරාජගුරුඣ්ධරෙන "—

යන්නෙන් මුන්වහන්සේ ත්‍රිපිටකය හා තර්ක ව්‍යාකරණාදි නානා ශබ්දශාස්ත්‍රයන්හි අලාමක ඥාණගතියක් ඇතිහෙයින් **අනවමදර්ශී** යන අන්වර්ථනාමයකින් ප්‍රසිද්ධවූබව ප්‍රකාශවනහෙයින්ද **සිද්ධාන්ත** **ගරා** කර්තෘ මුන්වහන්සේයයි සැළකියහැකිය.

**රසවාහිනි** නිගමනයෙහි:—

" කාලිඞ්ගවංසො මහාථෙරො යසොපඤ්ඤායතං ගතො,
මඞ්ගලවිහො මහාථෙරො ඛණ්ඩසීමාපතී යතී.

යස්ස ආචරියො ආසි සබ්බසත්‍ථ විසාරදො;
**ආරඤ්ඤරතනා** නාම මහාථෙරො මහාගණී.

ගරුපත්තමාගතො යස්ස සද්දසාගර පාරගූ,
යො **විජ්ජගාමවංසෙක** කෙතුභූතො තිසීහලෙ,

යො කා සීහලභාසාය **සීහලං සද්දලක්ඛණං**,
යො ච **සමන්තකූටස්ස** වණ්ණනං වණ්ණයී සුභං.
තෙන වෙදෙහථෙරෙන කතායං **රසවාහිනී**. "

යන්නෙන් වෙදෙහ මහාස්ථවිරපාදයෝ තමන්වහන්සේගේ **උපාධ්‍යාය** ආචාර්යයන්වහන්සේලාද තමන්වහන්සේ **උපන්** වංශයහා කළපොත්පත්ද ප්‍රකාශකළහ.

මෙසේම **සමන්තකූටවණ්නා** පරිසමාප්තියෙහි:—

" යො යාචිතො රඤ්ඤවාසි ගුණාධාර සුධීමතො,
රාහුලත්‍ථෙරනාමෙන විස්සුතෙන මහීතලෙ;

භුවනොදරම්හි පඤ්ඤතො රවිච්ඡම්බරමණ්ඩලෙ,
**ආරඤ්ඤ රතනානාම** මහාථෙරො මහාගණී;

ජීවිතං විය යො සත්‍ථු සාසනස්ස මහාකවි,
සාරොසුප්පටිපන්නෙසු සද්දසාගර පාරගො;

තස්ස සිස්සායි යො **විජ්ජගාමවංසෙකකෙතුකො**,
ඤාතාගමෙථෙරඤ්ඤවාසී සීලාදිගුණභූසණො;

යො කා සීහලභාසාය **සීහලං සද්දලක්ඛණං**,
තෙන **වෙදෙහ** ථෙරෙන කතායං **පියසීලිනා**."

යනාදියෙන් සමන්තකූටවණ්ණනාව කිරීමට ආයාචනාකළ තැනැත්වහන්සේගේ නමද ස්වකීය ආචාර්ය්‍ය වරයාද උන්වහන්සේගේ නිවාසස්ථානය හා පාණ්ඩිත්‍යයද තමන්වහන්සේගේ නමද වංශය හා ශාස්ත්‍රාගමදෙක්හි නෛපුණ්‍යයද සිංහලභාෂායෙන් සිංහලශබ්දලක්ෂණයක් කළබවද ප්‍රකාශවේ.

උන්වහන්සේ විසින් කරණලද මේ පුස්තකවයෙහිම තමන්වහන්සේ ගැණ දැක්වියයුතු කරුණු දක්වා තිබියදීත් අවශ්‍යයෙන් කියයුතුවූ **ප්‍රතිරාජපරිවෙණාධි පතිත්වය** හා **සිදත්සඟරා** නම් හෙළවියරණක් නිපදවූබවද කියානැති හෙයින් හා **වනරතනආනන්ද** මහා ස්ථවිරයන්වහන්සේද උන්වහන්සේගේ ශිෂ්‍යයෝ වන බුද්ධ**ප්‍රිය ගෞතම වෛදෙහ** මහා ස්ථවිරයන් වහන්සේලාද ආරණ්‍යවාසී බව ප්‍රකාශවනහෙයින්ද **වෛදෙහ** ස්ථවිරයන්වහන්සේ **ප්‍රතිරාජමහාවිහාරයෙහි** හෙවත් ප්‍රතිරාජ **පිරිවෙණෙහි** ස්වාමීඥනුවූබවත් උන්වහන්සේ කළ සිංහල ශබ්දලක්ෂණය **සිදත්සඟරාව** නොව අන්‍ය සිංහල ව්‍යාකරණයක් බවත් සුවිනිශ්චිතමය.

තවද දෙවෙනි පැරකුම්බා මහරජහුගේ කාලයෙහි ධර්මවිනය ශබ්දශාස්ත්‍ර සම්බන්ධ නානා මතික නානා නිකායික සඞ්ඝයාවහන්සේලා වැඩසිටිබව පොතපතින් පෙණෙනහෙයින් ඒ කාලයෙහි සිංහල ශබ්දලක්ෂණකිපයක් පැවතුනාට සැකනැත.

මිථ්‍යාදෘෂ්ටිකරජුන් ලඞ්කාරාජ්‍ය ශ්‍රී පදප්‍රාප්තවූ කාලවල ධර්මවිනය ශබ්දශාස්ත්‍ර සම්බන්ධ පොත්පත් බෙහෙවින් අභාවප්‍රාප්තවූ හෙයින් **වෛදෙහ** මහාස්ථවිර ප්‍රණීත සිංහල ශබ්දලක්ෂණයද ඒ කාලයකදී ලුප්තප්‍රාය වීදෝයි ශඞ්කා කළහැක.
තවද සිදතෙහි:—

“ සඳවත සිදු කිය කුඹු යොන නම සත රං
කිවී සෙවෙත හොඳ වැලිනී යළ තොගො රා
අරුණු කිහෙනි ඒ කොරලන් ලැබ හුරි රා
පැටිව නෙදෙස යුද පතිරජ් දියඉසු රා”

යන උභය භාෂාලඞ්කාරය දක්වනපිණිස **අනයනී** සෘෂියා හා **වාලුකා** නදියත් අතරවූ කථාවක් මෙන් ප්‍රකාශවන මේ කවෙන් **ප්‍රතිරාජ** අමාත්‍යයා කෙරළයුද්ධය ප්‍රාරම්භකළබව සූචිතහෙයින් ඒ යුද්ධය කරණකාලයෙහි **සිද්ධාන්තසංග්‍රහය** කළබැව් සැලකියයුතුය.

කෙරළයුද්ධය **චන්ද්‍රභානු** නම් ජාකුමාරයා ලඞ්කාවට යුද්ධපිණිස පැමිණෙන්ට ප්‍රථමබව මහාවංශයේ 83 වෙනි පරිච්ඡේද

යෙන් පෙණේ, චන්ද්‍රභානු කුමාරයා ලඞ්කාවටපැමිණියේ විතීය පරාක්‍රමබාහු මහරජහුගේ රාජ්‍යාභිෂෙකයෙන් 11 වෙනි වර්ෂයෙහිය, ඒබව:—

" අථෙකා දසමෙ වස්සෙ සම්පත්තෙ තස්ස රාජිනො,
තද ජාවකරාජෙකො චන්‍ද්‍රභානූති විස්සුතො;
මයම්පි සොගතා එව ඉතිමායං විධාය සො,
සඞ්ඝං ජාවකසෙනාය තකතිලාය සමොතරි–"

යන්නෙන් දතයුතුය, ඒ රජතුමා ක්‍රිස්තුවර්ෂයෙන් 1240 වැන්නෙහි රජ පැමිණිබව මහාවංශයෙන් පෙණෙන බැවින් ඒ වර්ෂයටත් 1251 වෙනිවර්ෂයටත් අතර වර්ෂයකදී දක්ෂිණලඞ්කාව පාලනයකල ප්‍රතිරාජ අමාත්‍ය සත්පුරුෂයාණන්ගේ ආරාධනාවෙන් ප්‍රතිරාජපිරිවෙණාධිපති අනවමදර්ශි සංඝරාජ මාහිමියන්වහන්සේ විසින් සිදත්සඟරාව කලබව නිශ්චයකලහැකිය.

අනවමදර්ශී වෙදෙහ යන මහාස්වාමීන්ද්‍ර දෙදෙනා වහන්සේම ප්‍රඥාවාතුයසීාතිශයෙන් මස්තකප්‍රාප්ත පණ්ඩිතොත්තමයෝයි, ඉනුදු අනවමදර්ශි මහා ස්වාමීන්ද්‍රයන්වහන්සේ වනාහි භාෂාන්තර ශබ්දශාස්ත්‍රාන්තරයන්හිද සකල වෙදාඞ්ගයෙහිද න්‍යායාලඞ්කාෘති සමෘතිඡන්දෝ විචිත්‍යාදියෙහිද සුසැට කලාවන්හිද ත්‍රිපිටකයෙහිද පාරදර්ශීවූ විශිෂ්ටතර බුඩිමත්භාවයෙන් විශෙෂයෙන් පණ්ඩිතජන පූජ්‍යයහ.

කියනලදමැයි දෛවඥකාමධෙනු වෙහි:—

" අනුගතජින ශිෂ්ටිර්බ්‍රහමවංශෙකදෘෂ්ටිර්
මුනිරත වමදර්ශී පාරදර්ශී කලානාම්,
ප්‍රණ්‍යති සකාලාංසත් ග්‍රන්ථසාරාඪ්‍යදෛශ්ඨ්‍යං
විබුධජනනිසෙව්‍යාං දෛවවිත් කාමධෙනුම්–"

මෙසේ මුන්වහන්සේගේ විශිෂ්ටතර ප්‍රඥපාටව්‍ය හා ශාස්ත්‍රාන්තර නෛපුණ්‍යයද සිඩාන්තසංග්‍රහ යෙහි ලීලාවද සසඳබලනකල පවා අභිප්‍රශස්තවූ සිඩාන්තසංග්‍රහ නම් සිංහල ශබ්දශාස්ත්‍රය අනවමදර්ශී මහා ස්වාමීන්ද්‍රයන්වහන්සේ විසින් නිපදවනලදැයි විනිශ්චය කටයුත්තේයි.

මෙහි කථාශරීරයනම්:—

ශ්‍රීමත් සූරවීර වික්‍රමාන්විතවූ ගරු නයිට්පදප්‍රාප්ත දෙන්සල මොන් ඩයස් අභයවික්‍රම ජයතිලක සෙනෙවිරත්න රජකුමරුන්

කඩුකරලූ බණ්ඩාරනායකාභිධාන රජවාසල මහමුදලි මන්ත්‍රීශ්වරො ත්තමයාණන් හා එතුමාණන්ගේ මන්ත්‍රීණියද පරම්පරාවද ආයුරා රොග්‍යශ්‍රීන් සමෘද්ධකොට දීර්ඝකාලයක් ආරක්‍ෂාකිරීම පිණිස තීර්ථ ග්‍රාම (තොටගමු) විහාරයෙහි අධිගෘහිතවූ බුද්ධාංකුර චරිතයෙන් ස නාථවූ නාථදේවේන්ද්‍රයාණන් වහන්සේට ආයාචනාකිරීමයි.

මෙම සන්දේශකාව්‍යයට සම්ප්‍රදානවූ නාථ දෙවේන්ද්‍රොත්ත මයෝ වනාහි මෙම මහා භද්‍රකල්පයෙහි මෛත්‍රෙය නමින් සර්වඥප දප්‍රාප්තවන බෝධිසත්ත්වොත්තම කෙණෙකැයි ඇතැම් කෙණෙක් සලකති, අවිශේෂයෙන් මතු බුදුවන ශ්‍රී බෝධිසත්ත්වොත්තමයෙකුබව කාව්‍යශේඛර මහා කාව්‍යයෙහි:—

“සරි රුසිරු තරි දු  
යස තෙද දිගත පසි දු  
මතු වන බුදු ර දු  
සැරද තොටගමුවෙහෙර නාථි දු–”

යන්නෙන් හා ගිරාසන්දේශයෙහි:—

“ම හ ත සසර සයුරෙහි කුමුටුව සුර ණ  
අ න තු සත නිවන්පුර ගෙණයන සිති න  
ස ත ත සොඳුරු බුදුකුරු ගුණදම් පුර ණ  
දි ය ත පසිදු නාථිඳුන් දක ගොස් සොබ න.”

යන්නෙන්ද ප්‍රකාශිතයි.

කෙසේ සලකා බැලුවත් සර්වප්‍රකාරයෙන්ම සකල සත්ත්වයා කෙරෙහි පතළ මහත්කරුණාවක් හා ප්‍රඥානුගත වීර්‍ය්‍යපරාක්‍රමයක් ඇතිව බුද්ධකාරක ධර්මපූරණයෙහි තත්පරවූ සර්වඥ බෝධිසත්ත්වො ත්තමයන් වහන්සේ කෙණෙක්මැයි දතයුතු.

මෙම සන්දේශකාව්‍යයාගේ ක්‍රමය නම්:—

චිරන්තන මහා කවිවරයන්ගේ රචනානුකූලව ප්‍රථමකොට දූතයාට ආශිර්වාදකොට තදනන්තරව දූතයාගේ සාමාන්‍ය ගුණවර්ණ නාවක්ද දූතක්‍රියායෙහි යෙදවීමට සුදුසුවූ ඔහුගේ විශේෂගුණාඞ්ගද පෙරමග නිමිති හා ගමනට යොග්‍ය නකත්ද දක්වා ඉක්බිති රජ දෙඹා ගමහා එහි පිහිටි මහාඔඩගෙ සමුද්‍රාරාමය සම්බන්ධ විශේෂව ර්ණනාවක් හා එම ගම උපන් සුගතශාසනධ්වජ විනයාචාර්‍ය්‍ය ධම්මා ලඞ්කාර මහානායක සද්විර, මෙකල යථොක්ත විහාරාධිපති සරණ

පාල මහාස්ථවිර, එම විහාරවාසී විනයාචාර්ය වැලිතර සුදස්සන
ස්ථවිර, අම්බලම්ගොඩ හා එහිපිහිටි සුභද්‍රාරාමය හා සුනන්දාරාමය,
විශ්‍රාමශාලාව (තානායම), මාදම්පාමෝදර පිහිටි උදකොක්ෂේප ශ්‍රී
මාමණ්ඩිරය එහි විනය කම් කරවූ අරියවංසාලඞ්කාර සාසනධජ වි
නයාචරිය පියරතන තිස්ස නායකස්ථවිර; සාසනවංසාලඞ්කාර කවි
ධජ විනයාචරිය වැලිගම ශ්‍රීසුමඞ්ගල නායකස්ථවිර, මාදම්පාමෝදර,
මාදම්පේ දේවගොඩ ශ්‍රීවර්ධනාරාමය එහි අධිපති අසමදීයාචාර්ය
සිරි සවර ගණ පරඞ්ඛිත ධම්මතිලක නායකස්ථවිර, ලොකප්‍රසිද්ධ ශ්‍රී
සද්ධම්මවංශපාල ධීරානන්ද මහානායකස්ථවිර යන්වහන්සේ උපන්
ලඞ්කාගොඩ, සද්ධම්මවර ජෝතිපාල සහවේ ඤාණානන්ද මහාස්ථවි
රයන්වහන්සේ උපන් සහව, ගොඩගම, කෙල්වත්ත හෙවත්
කොටගමුව එහිපිහිටි විහාරය, විජයබාහු පරිවේණාධිපතිව විසූ
ෂඩ්භාෂාපරමේශ්වර ශ්‍රීරාහුල මහාස්ථවිර, එම කොටගමු විහාර
යෙහි පැවිදිව කලක්විසූ විද්‍යෝදයපරි වේණාධිපති ත්‍රිපිටකවාගී
ශ්වරාචාර්ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගල ප්‍රධාන සඞ්ඝනායකස්ථවිර යන
මේ උතුමන් හා විහාරස්ථානාදිය සම්බන්ධ සාමාන්‍ය වර්ණනාවක්ද,
එහි නාථදෙවාලය, නාථදෙවියාණෝ, මහමුදලිමහනිශ්වරයන්
වහන්සේ හා උන්වහන්සේගේ පරම්පරාව සම්බන්ධ විශෙෂවර්ණනා
වක්ද කොට මෙම සන්දේශය ඔප්පුකරණ ආකාරයද අලුකොබෝ
පක්ෂියාට ආශිර්වාද දී සන්දෙශනිර්මාණකාලයද මෙම සන්දේශය චිරාත්
කාලයක් යෙහෙන් පවත්නාසේ ආශිංසනයක්ද කොට කර්තෘනාම
සඞ්ගික ෂඩරචක්‍රබන්ධනයකින් නිමවනලද්දේය.

ඒ මේ සන්දේශය වනාහි ගී සැහැලි ආදි කව් 152 කින්
සමලඞ්කෘතවේ, මෙය මාවිසින් කරණලද සතරවෙනි ග්‍රන්ථයයි. මීට
ප්‍රථම කොකැටු සන්දේශය, කැණිවී සන්දේශය, ගමන්විස්තරය (බල
පිටිය පටන් කොළඹ දක්වා මාර්ග වර්ණනාව) යන මේ පොත් රචි
නාකරණලද්දන. එයින් මුද්‍රණයකොට විසුරුවා හරිණලද කො
කැටු සන්දේශය ගැණ ප්‍රසිද්ධ පණ්ඩිතයන්ගේ හා සිංහල ප්‍රවෘත්ති
පත්‍ර කර්තෘවරුන්ගේ ලියකියමන් ආදියද අපට සිංහල භාෂාව දියු
ණුකරගැණීමට අතිශයොපකාරිවූයෙන් අප සිත් ධෛර්‍යමත් ව
නසේ ක්‍රියාකල ඒ උතුමන්ට මෙහිදීද අපගේ අවඞ්කස්තුතිය පුදක
රම්හ.

එයින් කොකැටු සන්දේශය ගැණ ලක්මිණි පහන් පත්‍රයෙ
හි වර්ෂ 1906 සැප්තැම්බු මස 8 වෙනි දින පළවූ කතුවැකිය පම
ණක් මෙම සංඥපනයේ අවසානයෙහි යොදඇත.

අප මිත්‍රමහතුන් කීපදෙනෙකුන්ගේ ආයාචනාවපරිදි මෙහි ඇතැම්තැන යමක හා මූලාන්ත්‍යාක්ෂරයන්ගෙන් විශෙෂාර්ථප්‍රකාශක කවි යොදඇතද එය අපගේ පූරුදුකාව්‍යරචනාවට වෙනස්වූයෙන් සුඛාවබොධයට බාධකද්‍යෙයි සිතමු.

තවද මෙහි ප්‍රථමගීයේ **සැහැයි වැද කියම් මේ** යන මූලාන්ත්‍යවර්ණයන්ගෙන් විඝ්නවිනාශයට හෙතුවූ ඉෂ්ටදෙවතාසඞ්ඛ්‍යාත රත්නත්‍රයට නමස්කාරද, 2 වෙනි දශපදසැහැල්ලේ **අලුකොබෝ හඳුන** බලව යන මූලාක්ෂරයන්ගෙන් මේ සන්දෙශය තිරීක්ෂණයෙහිලා ශ්‍රොතෘජනව්‍යායාම ජනනයද, 38 වෙනිගීයේ **විකුම්රුවන්** යන අන්ත්‍යවර්ණයන්ගෙන් මෙහි කර්තෘවූ මාගේ නාමසඞ්ගීතයද, 83 වෙනිගීයේ **නතිදුව** යන අන්ත්‍යවර්ණයන්ගෙන් කාව්‍යයට සම්ප්‍රදානවූ දෙවෙන්ද්‍රයාණන්ගේ නාමයද, 91 වෙනි ගීයේ **සරණපල්** යන අන්ත්‍යවර්ණයන්ගෙන් රන්දෙඹ මහාමඞ්ගල සමුද්‍රාරාමාධිපතීන්වහන්සේද; 120, 121, 122, සහ 123 වෙනි දශපදසැහැලිවල **තෙවලාවදනිසුරු විජයබපිරිවෙණදිපති සිරිරහුලහිමිතුමා විසූ තොටගමුවෙහෙරට** යව යන මූලාක්ෂරයන්ගෙන් අලුකොබෝපක්ෂියාට තීර්ථග්‍රාම විහාරප්‍රවෙශයට අණකිරීමද, 150 වෙනි දශපදසැහැල්ලේ **සැරදම්හමුදලිමැති** යන මූලාක්ෂරයන්ගෙන් මේ ග්‍රන්ථරචනාවෙහි ප්‍රධානාර්ථයද යන මෙතෙක් පිණ්ඩාර්ථයෝ ප්‍රකාශිතයහ.

තවද **විල්ලිඛිණිසන්දෙශය, කව්ලකර, ආචාර්‍ය්‍යවර්ණනාව, ජාගර සර්වරොදය වර්ණනාව,** ලඞ්කාශාසන **විශුද්ධිකථාසඞ්ගය, අභිමාන දීපනිය, අභිමාන සංග්‍රහව, අභිමානමණ්ඩලය අභිමාන ලක්ෂණය, විමතිච්ඡෙදකය, ධ්‍යානවිභාවනීසංග්‍රහව,** (ලක්දිවපිහිටි) **බුද්ධශාසනවංශය,** (පාලිගාථා) යනාදි කවිජන සම්භාවනීය ප්‍රශස්ත පොත්පත්රාශියක් නිපදවාලීමෙන් ලොකශාසන සංග්‍රහ කල කවිකුලතිලකායමානවූ අපගේ ආචාර්‍ය්‍යවූ මාදම්පේ දේවගොඩ ශ්‍රීවර්ධනාරාමාධිපති **සිරි පවර ශසපණ්ඩිත** යනසඞ්ඛ්‍යාතනීය ගරු නාමොපලක්ෂිත ධම්මතිලක නායකස්ථවිර පාදයන්වහන්සේගෙන්ද, බෙන්තොට ශෛලාන්තායතන පරිවෙණාධිපති සරණඞ්කරාභිධාන බෙන්තර විලල්ලාවිටිකෝරළේ හා කළුතර තොටමුනේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරපාදයන්වහන්සේගෙන් හා අමරපුර සිරිසද්ධම්මවංසනිකායේ **අනුනායක** හා ලේඛකධුරන්ධර රන්දෙඹේ මහාමඞ්ගල සමුද්‍රාරාමවාසී විනයාචාර්‍ය්‍ය **සුදස්සන** ස්ථවිර පාදයන්වහන්සේගෙන්ද මේ සඳහා යම් යම් ආධාරලැබුනුබව උන්වහන්සේලාකෙරෙහි ගෞරවයෙන් සිහිපත්කරම්හ.

මෙහි අපගේ ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිත දෝෂ ඇතද සත්පුරුෂයෝ සමාධිය භජනයකිරීමෙන් නිර්දෝෂාර්ථයම සලකත්වායි ආශිංසනය කරම්හ.

කිවිඳෙ කව් බඳි ති
උතුම් දන අදරම වෙ ති
තුරුලිය මල් කෙරෙ හි
සුලඟ එහි සොඳ සුවඳ උසුල ති

වර්ෂ 1913ක්වූ ඉම්වගට,-සජ්ජනමිත්‍රවූ
ඔක්තෝම්බර්මස හැන්රිජෝන්මැන්දිස් වික්‍රමරත්න
27 දින බලපිටියේ සේනානායක (ශ්‍රේෂ්ඨාධිකරණශාලාවේ)
ආදදෙල රත්නගිරි නීතිඥතැන.
වලව්වේදිය.

---

කොකැටුසන්දේශය ගැණ වර්ෂ 1906 ක්වූ සැප්තැම්බර්මස 8 වේනි දින ලක්මිණිපහන්පත්‍රයෙහි පළවූ කතෘවාක්‍යය.

# කොකැටු සන්දේශය.

වැලිතොට මහාකප්පිණ රාජපක්‍ෂවලව්වේ ශ්‍රීමත් වංශාධිපති රාජපක්‍ෂපවුලට ආයුරාරොග්‍යශ්‍රී ආදී ප්‍රාර්ථනාමුඛයෙන් බලපිටියේ පොලිස්මහෙස්ත්‍රාත්ධුරයේ වැඩබලන රන්දෙණියේ සෙනානායක වලව්වේ හැන්රි ජෝන්මැන්දිස් වික්‍රමරත්න සෙනානායක නීතිඥ මන්ත්‍රීශ්වරයාණන්විසින් රචනාකරණලදින් සවුදියෙස් දනාබ්‍රෙව් ශ්‍රී විජයවර්ධන ස්කෝලේමහත්මයා විසින් අච්චුගස්වනලද ඒම්පොතෙන් පිටපතක් ලැබ කියවා බැලීමු.

මේ නීතිඥමහතා පමණක් නොව උන්නැහේගේ මුතුන්මිත්තන්ගේ සත් කුල පරම්පරාවක පටන්ම උභය පරිශුද්ධ බ්‍රහ්ම බන්ධු ගොත්‍රයටඅයත් ශිෂ්ටසම්මත කුලාචාරමර්‍යාදව උල්ලඞ්ඝනය නොකොට යලිත් පර්‍ය්‍යාප්ති ශාසනභාරොවහනය කරමින්වැඩවිසූ අපගේ ආචාර්‍ය්‍යපරම්පරා නමැති මුක්තාහාරයට මහා මුක්තාඵල යන් බඳුවූ ලඞ්කාගොඩ තුඩුවේවත්තේ ධර්මාලඞ්කාරාදි මහානායක සථවිරයන්වහන්සේලාගේ පාර්ශවයෙන් පින්පව් කටයුතු නොකඩයුතු දනහැඳින විසූ රන්දෙණියේ ප්‍රසිද්ධ ප්‍රධාන පවුලක්බව්ද දනිමු.

එටපසු මේ නීතිඥමහතා ඉංග්‍රීසි ලතින්ආදි පරභාෂාශාස්ත්‍ර ඉගෙණ කෙළ පැමිණ ලඞ්කාණ්ඩුවේ නීතිඥධුරය ලැබ එම ධුරයේ සුතුකම් මනාසේ නිෂ්ඨාකළබවට ශාක්ෂියනම් දැනට ඒතුමා බලපි

පියේ අධිකරණශාලාවේ විනිශ්චයකාරධුරයට ආණ්ඩුකාරයාණන් විසින් තාවකාලිකවශයෙන් පත්කරගැණීමයි.

වැඩබලන්ට ශක්තියඇතිවීනම් එබන්දෙකුට එමධුරය ස්ථිර වශයෙන් උසුලන්ටද ශක්තියඇතුවාට සැකනැත. බලපිටියේ උසා වියේ අධිකරණවිනිශ්චය කලහැකිනම් කොළඹ ප්‍රධාන උසාවිය කත් විනිශ්චයකාරයෙක් වීම අරුමයක්නොවේ.

මේ තුමාතුළ විද්‍යමානවූ යහපත් සවභාව හා ගුණාඩගත් උ ගත්කම් හා අවඞකගති ආදියත් ආණ්ඩුකාරතුමාආදී ප්‍රධානිහු ද නිත් නම් මේතුමා වහාම උසස් අධිකරණශාලාවක එමධුරයේ ස්ථිරකරත්හයි බලාපොරොත්තුවෙමු, වැදගත් උගත් සිංහලජා තික මහතුන් උසස්නිලවලට පත්නොකිරීම ජාතියට අලාභයකි.

මෙම නිතිඥමහතා මැතභාගයෙහි සුගත සාසනධජ වින යාචරිය ධම්මාලඞකාර අමරපුරසමාගමේ නායකස්ථවිරපාද මාද ම්පේ ආචාර්‍ය ධම්මතිලක මහාස්ථවිරපාද වැලිතර සුදස්සන ස්ථ විරාදි පණ්ඩිත ස්ථවිරයන්වහන්සේලා ඇසුරුකරමින් බුඬසමය හා එළුවියරණ ඇතුළුවූ හෙළදිව්බසත් මනාසේ උගත්බැව් දනිමු.

ආචාර්‍ය ධම්මතිලක මහා ස්ථවිරපාදයන්වහන්සේ මීරිපැන් නේ නියම එළුවියරණ පරම්පරාවේ විනීය නායකස්ථවිරයන් වහන්සේගේ සියලු ආචාර්‍යමුෂ්ටිලැබ උන්වහන්සේගේ පරම්පරාව ගෙණයාමට සිටිනා එකම සිංහලපණ්ඩිතයායයි ගණන්ගතයුතුවේ. දැනට මේ නිතිඥමහතාට ඒ තමන්ලත් සියලු ආචාර්‍යමුෂ්ටිය නොමසුරුව නොසඟවා දුන්බව් මෙම කාව්‍යයෙන් පෙණේ.

ලක්දිව කාව්‍යකාරයෝ වෙන වෙන ක්‍රමවලිනුත් මදක් සිංහලභාෂාව ඉගෙණ කාව්‍යබඳිතත් මීරිපැන්නේ හරිපරම්පරාවේ කවිබැඳුමට තවම ලංනොකළහැකිබව වැඩිදුරනොගොස් මෙම සන්දේශයෙන්ම පෙණේ.

නියම සවර්ණකාරකුලයෙහි උපන් රන්කරුවන්මෙන්ම අ න්‍ය කුලිකයෝ කෙළපැමිණ මෙකල ඒ කර්මාන්තකරතත් නියම ශිල්පාචාර්‍යවරයෙක් අතටගත්කෙණෙහිම මේ නියමසවර්ණකාර යෙකුගේ අත්තමක මේ අනියම්සවර්ණකාරයෙකුගේ අත්තමකැයි දැනගන්නාක්මෙන් . මීරිපැන්නේ පද්‍යබන්ධනත් පණ්ඩිතයන් අතටපත් වහාම එහි විශේෂය දැනගණිති.

එබැවින් මීරිපැන්නේ ධම්මරතන නම් මහා කවීන්ද්‍රයා ගේ ආචාර්‍යමුෂ්ටිසියල්ලම තංගල්ලේ සිරිසුමන නායකස්ථවිර යන්ටද උන්වහන්සේ විසින් ප්‍රවෙශම්කරතබන්ට සුදුසුනිධාන යක්ලැබී මෙම ආචාර්‍ය ධම්මතිලක මහාස්ථවිරපාදයන්ටද උන්ව

හන්සේ විසින් මෙම සංක්‍ෂෙපකතී නිතිඥමහතාටද ඉතුරු නොඅකා ට දීතිබෙණබවදුන අතිශයින් ප්‍රමුදිතවීමු, මෙහි කාව්‍යස්වභාව ද නගැණිමපිණිස ධවලකිර පක්‍ෂිරාජයාහට පිමත්වන තැනක් පෙර මගතිම්හි කියා පළමුකොට ධර්මාලංකාර නායකස්ථවිරයන් උපන් ප්‍රදෙශයට යනලෙස නියමකොට කියාතිබෙණ කව් මෙසේයී.

" ස ව ණ   සසු න   බාරසිල්දම් විනෙරුසි   න
දි ලු න   සුද න   මනකොඳ සොඳ පොබයම්   න
සු ගු ණ   නදන   දම්ලකරය නාහිමි   න
උ ප න   ළයන   යනු ගල්බොක්ක නමැදූ   න

යනුයි. මේ කවිවල මිහිරිපැන්නේ කාව්‍ය මාධුර්‍යගුණය කදිමට පෙනේ, අසම්ඥවූකිසිවෙකුට නිදෙස්දෙයක් නොකලැකිබව් නො පෙරෙලෙන්නාවූ සත්‍යයක්බැවින් මෙහිත් අර්ථයටබාධානොවන් නාවූ සවල්පදෙස් නැතැයි නොකියමු.

නමුත් ගුණවශයෙන් බලනකල ඉංග්‍රිසිභාෂා ශාස්ත්‍ර ඉගෙණ පෙරකඩේරුනිලේ සහ විනිශ්වකාරධුරයේත් නියුක්තවීමෙන් අනව කාශවූ මේ මහතා මෙපමණපිරිසිදුව සිංහලභාෂාව ඉගෙණ නියම මහාකාව්‍ය පණ්ඩිතයන්ට අයත් ගෞරවයලබන්ට සුදුස්සෙක් වීම ගැණ ඇත්තාවූ ප්‍රිතිය අප්‍රමාණය.

තවද මේ කාව්‍යයෙන් අදහස්කරතිබෙන්නේ රාජපක්‍ෂපවු ලට ආශිර්වාදසැලැස්වීමයි, නීතිඥමැතිතුමා හෙළදිව්බස මනාසේ ඉගෙණ පළමුවෙන් කළ වර්ණනාව කටයුතුතැනටම කරතිබෙනු දැකිම දෙවෙනිව ප්‍රිතිවීමට හේතුවකි. පරදෙශීන්ට අපරට යටත් වූවාටපසු උඩපාන දෙරටින්ම වර්ණනාකටයුතු ගුණයක් ඇතුව සිටිනාපවුල මෙව රාජපක්‍ෂපෙළපත පමණක්බව අප පමණක් නොව සියලු සිංහලයෝම කියති. ඒවර්ණනා කටයුතුගුණය නම් ධනවත්නකමනොව ත්‍යාගිවන්තකම හා පුරාණ සරිත් වරිත් නො නසා පවත්වාගණ්ඃමයි. මීටවඩා පොහොසත්පවුල් සිංහලයන්අ තර ඇතත් ඔවුන්ට මූළු සිංහලජාතිය ගරුනොකරති. ලංකාව පූර්තුකාල් ලන්දේසි ඉංග්‍රීසි යන පරදෙශික රජුන් තුන්දෙනෙ කුට යටත්වුබැවින් පාතරට සිංහල වැදගත් පරම්පරා දහස්ගණ නක් මිසදිටුවගෙණ සිංහල සරිත් වරිත් හැරදමා දැනට "සුරේසි යන්, බර්ගර්, තුප්පහි, කැරපොතු" යනාදී අමුතු රාතිගණනක් සෑදී නගරවල සිටිති.

රාජපක්‍ෂපෙළපතට සම්බන්ධවූ මුදලි දූහන්දිරම් සියගණන් හා වලව් සියගණනකුත් දකුණුපලාතේ නාඹටුන්න වාච්ච ද ඩල් ල වැලිතර කොස්ගොඩ ගල්ගෙර අහුන්ගල්ල කොළඹමෝදර

මරදන ආදි ප්‍රදෙශවල පැවතික්‍රමයෙන් ඒ වලව්සහ පරම්පරාත් විනාශවීගොස් මහාකප්පිණවලව්ව හා සැමිප්සොන් රාජපක්ෂ කැරලසින් සොයිසා ශ්‍රීවර්ධන ලමාතනි සහ එකමපුත්‍රයාවන වාල්ඩර් රාජපක්ෂ වාසලමුදලිතුමාත් පමණක් ලොකයාගෙන් පුරාණ ලැබූ ගරු නම්බු ලබමින් මෙතාක් සිටිනබව පෙණේ. සෙසුගොත්‍රවලට අයිති නොයෙක් මුදලිපෙලපත් හා ධනවතානයෝද ලංකාවේ නොයෙක්පලාත්වල ඇතත් ඔවුන් සිංහලජාතියට හිමි ආගම සහ සිරිත්චාරිත්‍රාදිය හැරදමා වෙස් මාරුකරගත් බැවින් ඔවුන් සිංහලජාතික උතනමයෝයයි කිසිවෙක් නොසලකති. ගරුබුහුමන් නොපවත්වති.

ඉලංගක්කෝන් මුදලිතුමා හා ලමාතනිද ජීවත්වසිටියදී පුරාණසිරිත් චාරිත්‍ර හා ආගමත් ආරක්ෂාකල බැවින් ඔවුන්ටද සිංහලරජුන්ට දීගණආ ගරු නම්බු පවත්වාගෙණ අවුත් දැනට ඒ පවුලේ ආගම හා සිරිත් චාරිත්‍රාදිය නොපවත්නාබැවින් බොහෝදෙනාගේ කල්පනාව ඉලංගක්කෝන් පෙළපත ඎන්වීගියබවයි.

මෙම සන්දෙශසංග්‍රහනයේ "මෙතාක් තිබීල සම්‍යක්දෘෂ්ටිකව අප්‍රමාණ ශාසනොපකාර කරගෙණඑන රාජපක්ෂ මන්ත්‍රිපරම්පරාව මතු මිථ්‍යාදෘෂ්ටිවුවහොත් ඉන්වියහැකි මහත් ශාසනහානිය ගැණ කම්පිත සිතින්" යනාදි වාසගමින් රාජපක්ෂපෙලපත මතු මිථ්‍යාදෘෂ්ටිවුවහොත් ශාසනහානියක් වියහැකිබව කියනත් පානරට දහස්ගණන් ප්‍රභූසිංහලපවුල් මිථ්‍යාදෘෂ්ටි වීමෙන් ඔවුන් ජතිත්‍රශ්ටයෝව පොදු සිංහලජනයාගෙන් ලැබියයුතු ගෞරවය නොලැබ අසල්වාසි උදවියපවා නොසලකා ඇරීමෙන් ඔවුන් විනාශවූ පමණින් ශාසනයටවූ හානිය කුමක්ද?

ධර්මාශොක දුටුගැමුණු රක්ඛගු රාමඤ්ඤ බුරුම රජපවුල් පවා කාත්පසින් විනාශවීමෙනුත් ශාසනයට කිසිහානියක් නූවූයේනම් රාජපක්ෂපවුල මිසදිටුවීමෙන් ශාසනහානියක් වේයයි සිතීම නුවණ වහුරුනොවේ. ශාසනයපවත්නේ බුදුන්ගේ අධිෂ්ඨානබලයෙනි. එම පෙලපත මතු මිථ්‍යාදෘෂ්ටිවුවහොත් ශාසනහානියට කලින් එම පෙලපත විනාශවීම කුමට කියමුද? යම් යම් කුලවල පැවත එන්නාවූ කුලසිරිත් සිඳබිඳදැමීමෙන් ඒ කුලපිරිහෙනබව ශප්තාපරිහානිය ධර්මයෙහි වදරානිබේ. මිසදිටුවෙලා ගම්රටවලදි ගරුනම්බු ලැබීම ටිකක් අමාරුබව කාටත් හැහෙනවාඇත. ඒවා පසුවට අත්දකින්ටලැබේවි.

තවද මේ සන්දෙශකථාව පණිවුඩපණනක්මෙන්ද ශාසනවංශයක්මෙන්ද ප්‍රධාන සිංහලප්‍රභූන්ගේ ඉතිහාස කථාවක්මෙන්ද වැ

ලිතරපලාතේ ගම් ගෙවතු පිහිටි ආකාර දක්වන කථාප්‍රවෘත්තියක් මෙන්ද කීපආකාරයකින් ප්‍රයොජන ගතහැකිබැවින් පුරාණ සන්දෙශකථාවන්ට වඩා ප්‍රයොජනවත්වූ විශෙෂ සන්දෙශකථාවක් මෙන් පෙනේ.

වනාලඞ්කාර ග්‍රාමාලඞ්කාරාදිය පුරාණ පොත්පත්වල නො එල්ලී තමන්ගේම ප්‍රතිභාණයෙන් ගළපා තිබෙනුපමණක්නොව පූර්තුකාල් ආණ්ඩුකාලේ පටන් සාලාග්‍රාමගොත්‍රයෙහි උසස්වවිසූ ප්‍රභූවරයන්ගේ හා අමරපුරනිකාය දෙවරකට පිහිටුවාළූ මහතෙරුන්වහන්සේලාගේ නම් ගොත් හා කාලාදියද ඒරටේ විසූ ශාස්ත්‍රාගමධාරී ගෘහස්ත ප්‍රව්‍රජිතපණ්ඩිතයන්ගේ නාම ගොත්‍ර හා සිටි කාලාදියද විහාරස්ථාන දාගැබ් මහබෝ සීමාදිය පිහිටුවාළූ දායකාදින්ගේ නම් ගොත් හා කාලාදියද වර්තමානකාලයෙහි ඒපලාතේ වසන ගිහි පැවිදි ප්‍රසිද්ධ උතුමන්ගේ තොරතුරුද මේ පොතෙන් මනාසේ අවබොධවේ.

කව් 172 කින් සම්පූර්ණවූ මේ පොත අනාගතයෙහි ඒ පලාතේ ඇතිවන සත්මුණුබුරු පරම්පරාවටම අතිශයින් ප්‍රයොජනවත්වනබැවින් මීටපෙර එම පලාතවෙනුවෙන් පදබැඳුම්කරණලද රාජපක්ෂවර්ණනාව රාජපක්ෂ චරිතය සාසනවංශදීපය ශිමාන්තය දර්පණය යනාදි සෛංහලික මාගධික භාෂාත්මක පොත් සියල්ලට වඩා මේ කාව්‍යය ප්‍රයොජනවත්වේ.

එළිමගදබසපමණක් දැගෙණ පොත් පත් ලියන ඇතම් පණ්ඩිතයන්ගේ වනාහි අභූතොපමාදිය යොදමින්එකමකාරණයක් ප්‍රකාශකිරීමට නිෂ්ඵල ග්‍රාම නගර ගඞ්ගා තඩාග පක්ෂි චතුෂ්පද නර නාරී වනාලඞ්කාරාදියෙන් ග්‍රන්ථ බාහුල්‍යය ඇතිකර පොත්ලියනපුරුද්දක්ඇතිබැවින් ග්‍රන්ථවශයෙන්මහත්වූපමණට අර්ථනැත්තේය.

කීර්තිශ්‍රී රජතුමාදවස ඉංග්‍රීසීහු මධුරාශිය ආණ්ඩුකලබැවින් සිංහලරජතුමාගේ බිසෝනෙකෙණෙක් මදුරාපුරයෙන් එනගමනට ආරක්ෂාකරන්නටය යන අදහස කියයුතු ලියුමක් පුල්ස්කෑප් පිටු දෙළහකපමණ ලියා යවූකල ඊට ඉංග්‍රීසීන්විසින් පිළිතුරුලියවිල්ල නෝට්පේපර්පලුවකින් පමණ එව්වායයි ආරංචිඅසන්නට ලැබුනාක්මෙන් අපේ සමහර පණ්ඩිතයන්ට කාරණයට පිරිමසින්නට පොත්පත්ලියන්නට නුපුළුවන්නමුත් මේ නීතිඥමහතා ඉංග්‍රීසි ශාස්ත්‍රක්‍රමයට අනුවගොස් මේ සන්දෙශයේ එකම වර්ණාවක්වත් ප්‍රමාණය නොසික්මවා සාරාර්ථයම පිඩුකර ලියාතිබෙනු දැකීම සතුටකි, එහෙයින් මේපොත සිංහලජාතික ගිහිපැවිදි හවතුන්ටම සප්‍රයොජනවේවායි ආශිංසනය කරමු.



**H. J. M. WICKRAMARATNE, PROCTOR, S.C.,**
**BALAPITIYA.**

හැන්රි ජෝන් මැන්දිස් වික්‍රමරත්න සේනානායක
ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාවේ නීතිඥ.



**සන්න සහිත**

# අලුකොබෝ සන්දේශය.

## නමච් තෙරුවන්.

1. **සැ** රද අලුකොබො ස **ඳ**
**හැ** ම සුදන පියවන ස **කි**
**සි** වු මැලිව කළ ගෙතු **සම්**
**වැ** නි ගතිනි දිසි ලොවැ **මේ**

**ස්වස්ති** ශ්‍රී රාජවිරාජිත ශ්‍රී ලඞ්කාද්වීපයෙහි ගරුතර ආඥාකාර උතුමාණන්වහන්සේගේ ස්වදේශික අමාත්‍යවූ ගරු නයිට් **සී. ඇම්. ජී, ඒ. ඩී. සී.** යන ස්ථානාන්තරප්‍රාප්ත ශ්‍රීමත් **සර් දොන් සලමොන් ඩයස් අභයවික්‍රම ජයතිලක සෙනෙවිරත්න රජකරුණ කඩුකරල්ලු බණ්ඩාරනායක මහමුදලි** මන්ත්‍රීශ්වරයන් වහන්සේද ස්වකීය මැතිනිය හා පරපුරද ආයුරාරෝග්‍යාදි අභීෂ්ටාර්ථ සංසිද්ධ්‍යභිවර්ධනය කරදීමෙන් චිරාත්කාලයක් යෙහෙන් රක්ෂාකරවාලීම ප්‍රාර්ථනාකරමින් අලුකොබෝ පක්ෂියෙකු දූතක්‍රියායෙහි යොදා **අලුකොබෝ සන්දේශ** නම් මෙමකාව්‍යය රචනාකරන්නමෝ පුරාතන සෛංහලීය සන්දේශ රීත්‍යනුගතව **සහශී** නම් වෘත්තයෙන් **සැරද අලුකොබෝසඳ** යනාදීන් ප්‍රාරම්භකෙළෙමු.

**අලුකොබෝ සඳ සැරද** යනු මෙහි ක්‍රියා කාරක පද සම්බන්ධයි, කෙබඳුගුණයෙන් විශිෂ්ටවූ අලුකොබෝ පක්ෂියෙක්ද යත්?–

හැමසුදන, සකල සජ්ජනයා; පියවන, ප්‍රණතයවන්නාවූ; සිවු මැලිව, සුකුමාරව; කළ, කරණලද්දාවූ; ගෙතුයම්වැනි, ගෙත්තමක් වැනිවූ; ගතිනි, ගාත්‍රයෙන්; මෙලොවැ, මේලෝකයෙහි; දිසි, දෘශ්‍යමානවූ; සකි, මිත්‍රවූ; අලුකොබෝ සඳ, අලුකොබෝ පක්ෂිරාජය; සැරද, චිරකාලයක් ජීවත්වේව නොහොත් ජීවත්වෙහිවා.

මෙසේ මේ ප්‍රථම ගීයේ මූලානතවර්ණයන්ගෙන් ඉෂ්ටදෙවතා සඞ්ඛ්‍යාත ශාක්‍යසිංහවූ සර්වඥයන්වහන්සේ වැඳ එම ගීයෙන් අලු කොබෝ පක්ෂිහුගේ ස්වභාවික ගුණය වර්ණනාකොට තදනනතරව අවශෙෂ රූපලාවණ්‍ය මිත්‍රසඞ්ගතිය සම්බන්ධ චිත්තප්‍රීතිය හඟවනු සඳහා **අලුකොබෝ හසුන** බලව යන මූලාක්ෂරයන්ගෙන් යුක්තවූ **උපජාති** නම් දසපදසැහැල්ලෙන් දූතයා විශෙෂයෙන් වර්ණනා කෙළෙමු.

2. අ රා හිඳ තුරු තිස – බලා යන දෙස රිසිවන
ලු හුගම නැති සැරයක සිරි සර දර ත
කො ඩලක පුරු ගෙළ ලෙල දෙන මදමදී ත
බෝ ලෙස උයන් කෙත් – නරඹා ගොදුරු සපයන
හ මන සුවඳ මඳ නල විඳ විඳ අර ණ
සු වෙන වසන සකිසඳ සොම්ගුණ දර ණ
න ර ඹ න හෙදන පිණවන තොප ගත දා රි ය
බ බ ල න විදිනි මෙන් පිය යුගල අසි රි ය
ල ද හ න ඇසිමෙන් දෙන තද සුම්හි රි ය
ව ර හ න විලස් ගෙණ නොනැවුද වී පි රි ය

2 තුරු තිස, වෘක්ෂමස්තකයන්ට; අරා, ආරූඪව; ඉඳ, තිෂ්ඨනව; රිසිවන, රුචිවන්නාවූ; දෙස, දිශාවි; බලා, නිරීක්ෂණයකොට; යන, ප්‍රයානයකරන්නාවූ; සැරයක, ගියක; සිරිසර, ශ්‍රීසාරය; දර ණ, ධාරණයකරන්නාවූ; ලුහු, සීඝ්‍රවූ; ගමන්ඇති, යාත්‍රාඇත්තාවූ; කොඩලකපුරු, කුණ්ඩලාභරණයක්මෙන්; මදමදින, මන්දමන්දව; ගෙළ, ග්‍රීවය; ලෙලදෙන, ලීලාදානයකරන්නාවූ; උයන්කෙත්, උද්‍යානක්ෂෙත්‍රයන්; බෝලෙස, බොහෝපරිද්දෙන්; නරඹා, නිරීක්ෂණය කොට; ගොදුරුසපයන, ගොචරසම්පාදනය කරන්නාවූ; අරණ, අරණ්‍යයෙහි; හමන, වහනයවන්නාවූ; සුවඳ මඳනල, සුගන්ධ මන්ද

මාරුතය; විඳිවිඳ, විඥනයකරමින්; සුවෙන, සැපයෙන්; වසන වාසයකරන්නාවූ; සොම්ගුණ, සෞම්‍යගුණය; දරණ, ධාරණය කරන්නාවූ; සකිසඳ, මිත්‍රොත්තමය; නරඹන, නිරීක්ෂණයකරන් නාවූ; නෙදන, අනෙකජනයා; පිණවන පිණනයකරවන්නාවූ; තොපගත, තොපගේශරීරය; දුරිය, තරුණ (ශ්‍රියා) ඇත්තේය නොහොත්; තොප, යුෂ්මත්හු; නරඹන, නිරීක්ෂණයකරන්නාවූ; නෙදන, අනෙකජනයා; පිණවන, පිණනයකරවන්නාවූ; ගත, ශරීරයක්; දරිය, ධාරණයකෙරෙහිය; බබලන, භ්‍රාජිතවන්නාවූ; විදිනිමෙන්, විජනිපත්‍ර යක්මෙන්; පියයුගල, පක්ෂද්වය; අසිරිය, ආශ්චර්‍ය්‍යය; ලදගහන, තරුණාඞ්ගනාවෝ; දෙන, (තාවිසින්) දානය කරන්නාවූ; සුමිහිරිය, අතිමාධුර්‍ය්‍යවූ; නද, නාදය; ඇසිමෙන්, ශ්‍රවණයෙන්; පිරියවී, ප්‍රියවී; වරගනවිලස්, වරාඞ්ගනාවිලාශය; ගෙණ, ග්‍රහනයකොට; නොනැවුද, නෘත්‍යග්‍රහණයනොකළෝද?–

3\. දිලේ වෙරළු මිණි බඳ තෑග දෙනෙත පිය
දිලේ පබල පලු බඳ තගෙ යුගල පිය
දිලේ මල් කැකුළු බඳ තගෙ තුඩද පිය
දිලේ අලුකොබෝ සඳ තගෙ විසිත් පිය

3 අලුකොබෝසඳ, අලුකොබෝ පක්ෂිරාජය; වෙරළුමිණිබඳ, වෛඩූර්‍ය්‍යමාණික්‍යයන් මෙන්;තගේ,යුෂ්මත්හුගේ;පියදෙනෙත ප්‍රිය වූ නෙත්‍රද්වය;දිලේ,ජ්වලිතවේ; පබළපලුබඳ,(රක්ත)ප්‍රවාලපල්ලවාකාරවූ; තගෙ, යුෂ්මත්හුගේ; පියයුගල, පාදයුග්මය; දිලේ, ජ්වලිතවේ; පිය, ප්‍රියවූ;තුඩද, චඤ්චුවද; මල්කැකුළුබඳ, පුෂ්පකලිකාවක්මෙන්; දිලේ, භ්‍රාජිතවේ; තගෙ, යුෂ්මත්හුගේ; විසිත්පිය, විචිත්‍රවූපක්ෂපත්‍ර (සමූහය); දිලේ, භ්‍රාජිතවේ.

4\. දුලා දුලා පියපත්යුග විදිනි රගේ
සලා සලා එනකල වැද ගුවන් මගේ
බලා බලා ලද සිඳහන සිරි තොපගේ
ලොලා වෙලා වටනොකළෝද පෙරමගේ

4\. විදිනිරගේ, විජනි පත්‍රාකාරයෙන්; දුලා දුලා, අතිශයින් බබලන්නාවූ; පියපත්යුග, පක්ෂපත්‍රයුග්මය; සලාසලා, චලනයකොට කොට; ගුවන්මගේ, ආකාශමාර්ගයට; වැද, ප්‍රවිෂ්ටව; එනකල, ආගමනයකරණ කාලයෙහි; තොපගේ, යුෂ්මත්හුගේ; සිරි, ශ්‍රියාව; ලද සිඳගත, තරුණ සිඞාඞ්ගනාවෝ, බලා බලා, නිරීක්ෂණය කරමින්; ලොලා වෙලා, ලොලව; පෙරමගේ, පටිපථයෙහිදී; වටනොකළෝද, ආවෘතනොකළෝද?–

5. වනසර වෙත වැස බුදිනා වනසර
වනසර පණිවා කරමින් වනසර
වනසර එතකල තොප පිය වනසර
වනසර පිය ලොබ නොකලොද වනසර

5. වනසර, වන තඩාගයන්ගේ; වෙත, සමීපයෙහි; වැස, වාසයකොට; පණිවාකරමින්, ප්‍රාණඝාත කරමින්; වනසර, මත්ස්‍යයන්ද; වනසර, වනයෙහි සචාරණය කිරීමෙන්; වනසර, මාංශද; බුදිනා, අනුභවකරන්නාවූ; වනසර, වනචරකයෝ (වැදිහු); පියවන, ප්‍රියවන්නාවූ; සර, නාදයෙන්යුක්තවූ; තොප, යුෂ්මත්හු; වනසර, වනමාර්ගයෙහි; එතකල, ආගමනය කරණ කාලයෙහි; වණ්ණසර, වර්ණසාරවූ; පිය, (තාගේ) පක්ෂපත්‍රයන්ට; ලොබ නොකලොද, ලොභනොකළෝද?–

6. දලදල තුරතුර සරමින් දලදල
දලදල සරසිය කැල රැඳී දලදල
දලදල වනයන කල දූක දලදල
දලදල දර නොසිතුද සකි දලදල

6. දළ අදළ, මහත්වූද කුඩාවූද; දලදල, පත්‍රයන්ගෙන් ගහණවූ; තුරතුර, වෘක්ෂයක්පාසා නොහොත් වෘක්ෂාන්තරයෙහි; සරමින්, සචාරණය කරමින්; දලදල, වහ්නිසිඛාමෙන්; දලදල, ජ්වලිත ජ්වලිතව හෙවත් අතිශයින් දිලිහි දිලිහී; වන, වනයෙහි; සියකැල, (යුෂ්මත්හුගේ) ඤාතිසමූහයා; යනකල, ගමනයකරණකාලයෙහි; දලදල, ජලයක්පාසා; රැඳී, රඤ්ජමානවූ; දල, ජ්වලිතවූ; දලසර, ජලචරයෝ (මත්ස්‍යයෝ); දූක, දර්ශනයකොට; දලදල, අතිශයින් බබලන්නාවූ; දලදර, (සන්ධ්‍යාකාලයෙහි) මෙසකූටයකැයි; සකි, මිත්‍රය; නොසිතුද, චින්තනය නොකළෝද?–

7. සරසර පිපි බිඟුබමණා සරසර
සරසර ලොබ හැර පියවන සරසර
සරසර වන තොප සා දිව සරසර
සරසර පිය නොවැඩුද පැණ සරසර

7. සරසර, තඩාගයක්පාසා; පිපි, පුෂ්පිතවූ; සරසර, පද්මයක් පාසා; සරසර, සචාරණය කරමින්; බමණා, භ්‍රමණයකරන්නාවූ; බිඟු, භෘඩගයන්ගේ; සර, යහපත්වූ; පියවන, ප්‍රියවන්නාවූ; සර,

නාදයෙහි; ලොබ, ආසාව; හැර, පහකොට; සරසර, උතුම සිඩා ඛගනාවෝ; වනසර, වන මාර්ගයෙහි; සර, සඤ්චාරණයකරන්නාවූ; පැණසර, ප්‍රඥසාරවූ; තොප, යුෂ්මත්හුගේ; සර, නාදය; අසා, ශ්‍රවණයකොට; දිවසර, දිව්‍යාප්සරාවන්ගේ; සර, නාදයකැයි; පියතොවැඩුද, ප්‍රියභාවය වර්ධනය නොකළෝද?–

8 පියා පියා පිය වනවැදි තව ලෙසය
පියා පියා පිය වඩනා එක ලෙසය
පියා පියා පිය නදදෙන වෙණ ලෙසය
පියා පියා පිය රඟ වණම් කෙ ලෙසය

6 පිය, භායඝාවද; පියා, අවශෙෂ ප්‍රියයන්ද; පියා, අත්හැර; වනවැදි, වනප්‍රවිෂ්ඨවූ; තවලෙසය, තාපසයෙකුමෙන්; පියා, පක්ෂින්; පියා, හැර; එකලෙසය, එකාකාරයෙන්; පියවඩනා, ප්‍රියවර්ධනය කරන්නාවූ; පියාපියා, පා හකුලාගෙණ; පියාපියා, පියාසරකොටකොට අවුත්; වෙණලෙසය, විණාවකට බඳුවූ; පිය නද දෙන, ප්‍රිය නාද දනයකරන්නාවූ; රඟ, ආකාරය; පිය, ප්‍රිය(මිත්‍රය); කෙලෙසය, කවරපරිද්දකින්; වණම්, වර්ණනා කරම්ද?–

9 සතර ලොවැ පතර වැණු සුහදය මිතුරු
සතර දෙන අතර බඳ උවකරු මිතුරු
සතර ගුණ නිතර ඇතියෙන් නුඹ මිතුරු
සතර හැ‍ෙහ පවර අප උවකරු මිතුරු

9 මිතුරු, මිත්‍රය; ලොවැ, (ත්‍රිවිධ) ලොකයෙහි; පතර, ප්‍රසිඬවූ; සතර, ශාස්තෘන්වහන්සේ; වැණු, වර්ණනාකළාවූ හෙවත් ගිහිවිනයෙහි"පමත්තං රක්ඛති"යනාදීන් වදාළාවූ; සුහදය මිතුරු සතර දෙන අතර, සුහෘද මිත්‍ර චතුෂ්ටයාගේ අන්තරයෙහි; උවකරු මිතුරුබඳ, උපකාර මිත්‍රයා සම්බන්ධවූ; සතරගුණ, (පමාවූවහු රැකීමය, පමාවූවහුගේ වස්තුව රැකීමය, භයවූවාහට පිළිසරණවීමය, කටයුතු පැමිණිකල ද්විගුණව ධනදීමය යන) චතුර්ගුණය; නිතර, නිරන්තරයෙන්; සතර, ස්ථිරසහිතව; නොහොත් සතර, ශාස්ත්‍රයක්මෙන්; ඇතියෙන්, විද්‍යමාන හෙයින්; නුඹ, යුෂ්මත්හු; අප, අස්මතුන්ගේ; පවර, උතුම්වූ; උවකරු මිතුරු, උපකාරමිත්‍රයයි; හැහේ, කල්පනාවේ.

10 මිතුරු මඳ තෙදින් පොබයන සරා සුරා
මිතුරු බඳ විමන් අලු දෙන තිරා සරා
මිතුරු හද සුරන් පිණ වන සරා සුරා
මිතුරු සඳ අසන් මවදන කරා දරා

10 සරා, පද්මයන්; පොබයන, ප්‍රබොධකරන්නාවූ; මඳතෙදින්, මන්දතෙජසින් යුක්තවූ; මිතුරුයුරා, සූර්‍ය්‍යා (බාලාර්කයා) වැනිවූද; විමන්, ගෘහයන්ට; නිරාසරා, ස්ථිරසාරවූ; අලූදෙන, ආලොක දානය කරන්නාවූ; මිතුරුබඳ, ප්‍රදීපාකාරවූද; මිතුරු, (තමන්) මිත්‍රවූ; සුර න්හද, දෙවියන්ගේ හෘදයන්; පිණවන, පිණනය කරවන්නාවූ; සරයුරු, දිව්‍යාප්සරාවන් වැනිවූද; මිතුරුසඳ, මිත්‍රොත්තමය; අදරු කර, ආදරකොට; මවදන, මාගේ වචනය; අසන්,ශ්‍රවණය කරන්.

11 ව ට ගොමු සු සැ දූ දෙ වි පුර සිරිල ද නො මිත
තොට ග මු වෙහෙර දෙ වි මැදුරටසෙ ද පැ මිත
සි ට හ මු නා ත දෙ වි හිමිදුක ත ද වෙ මිත
වි ට ස මු ලැබුන දෙ වි මෙහසුන්වැ ද පෙ මිත

11 වටගොමු, නුගපඳුරක් සමීපයෙහි; සුසැදු, සුසජ්ජිතවූ; නො මිත, බොහෝසෙසින්; දෙව්පුර, දිව්‍යපුරයෙහි; සිරි, ශොභාව; ලදා ලද්දාවූ; තොටගමුවෙහෙර, තීර්ථග්‍රාම විහාරයෙහි; දෙව්මැදුරට, (නාථ) දෙව මන්දිරයට; සෙද, වහා; පැමිණ, සම්ප්‍රාප්තව; නාතදෙව් හිමි, නාථදෙව ස්වාමීන්වහන්සේ; දුක, දර්ශනයකොට; නදවෙමින, සන්තුෂ්ටවෙමින්; හමු, අභිමුඛයෙහි; සිට, අවස්ථිතවැ; සමුලැබුන විට, අවසරලැබුනාවූ කාලයෙහි; මෙහසුන්, මේ සන්දෙශය; පෙමින, ප්‍රෙමයෙන්; වැඳ, නමස්කාරකොට; දෙව්, දානය කරව්.

12 මි යු රු ර ස බ සි න් නිම කර මෙම සඳෙ ස
සොඳු රු ලෙස ල සි න් මම පවසමි නොල ස
ඉ සු රු ය ස රු සි න් සැම පිය වන වෙසෙ ස
මි තු රු අ ස තොසි න් මෙම ගම පිහිටි ලෙ ස

12 මියුරු, මධුරවූ; රසබසින්, රසවත් වචනයෙන්; මෙම සඳෙස, එතත් සන්දෙශය; සොඳුරුලෙස, සුන්දරාකාරයෙන්; නිමකර, නිෂ්ඨාකොට; මම, අස්මත් ශබ්දවාච්‍ය තෙමේ; නොලස, අනලස්ව; ලසින්, සෙනහසෙන්;පවසමි, ප්‍රකාශකරමි; ඉසුරු. ඓශ්වර්‍ය්‍යයෙන් හා, යසරුසින්, යශොරාශියෙන්; සැම,සියල්ලන්; වෙසෙස, විශෙෂ යෙන්; පියවන, ප්‍රියවන්නාවූ; මෙම ගම, එතත් ග්‍රාමය; පිහිටිලෙස, ප්‍රතිෂ්ඨිතාකාරය; මිතුරු, මිත්‍රය; තොසින්, සන්තොෂයෙන්; අස, ශ්‍රවණයකර.

13 ස සි රි කොරටු දෙස දෙ ස නෙක තුරු ලියෙ නී
මැ දි රි දෙරටු යස ලෙස දිලි නව පැර නී
අ සි රි දැ ම් වූ රස බ ස යුතු දන ගිනි නී
තෙසිරි මෙ හි වූ යස රැ ස වණම් කෙලෙසි නී

13 දෙසදෙස, දෙශදෙශවලින් (ගෙණාවාවූ); නෙකතුරු ලියෙ නී, අනෙක වෘක්ෂලතාදියෙන් යුක්තවූ; කොරටු, කොෂ්ටයන්ගෙන්; සසිරි, සශ්‍රිකවූ; යසලෙස, යහපත් ආකාරයෙන්; දිලි, ජ්වලිතවූ; නවපැරණි, අභිනවවූද පෞරාණිකවූද; මැදිරි දෙරටු, මන්දිරයන් ගෙන් හා ගොපුරද්වාරයන්ගෙන් යුක්තවූ; අසිරි, ආශ්චර්යවූ; දැම්වූ, ධර්මිෂ්ඨවූ; රසබසයුතු, රසවත් වචනයෙන් යුක්තවූ; දන, ජනයා ගෙන්; ගිනිණි, ගහණවූ; තෙසිරි, අනෙකවිධ ඓශ්වර්යයෙන් යු ක්තවූ; මෙහි, මේ ග්‍රාමයෙහි; ඉටු, ඉෂ්ටවූ; යසරැස, කීර්තිසමූහය; කෙලෙසිනි, කවරආකාරයකින්; වණම්, වර්ණනාකරම්ද?–

14 ස පි රි තුනුරුවනැ බැති පෙමැති පඬි අ ග
ඉ ති රි සියලු සැපතින් පතළ දසදි ග
අ සි රි වන සැවැත්පුරටත් වැඩිය අ ග
තෙසිරි බර මෙසිරිලක තුළ දකුණු දි ග

14 තුනුරුවනැ,(බුඩාදි) ත්‍රිවිධරත්නය කෙරෙහි; බැතිපෙමැති, භක්තිප්‍රෙම ඇත්තාවූ; අගපඬි, අග්‍රපණ්ඩිතයන්ගෙන්; සපිරි, ස ම්පූර්ණවූ; සියලුසැපතින්, සකල සම්පත්තියෙන්; ඉතිරි, අතිරික්තවූ; දසදිග, දශදිශාවෙහි; පතළ, (එහෙයින්ම) ව්‍යාප්තවූ; අසිරිවන, ආ ශ්චර්යවන්තාවූ; සැවැත්පුරටත් වැඩිය, ශ්‍රාවස්තිපුරයටත් වඩා; අග, අග්‍රවූ; තෙසිරිබර, නෛකශ්‍රීයෙන් භාරවූ; මෙසිරිලකතුළ, මේ ශ්‍රී ලඞ්කාද්වීපාභ්‍යන්තරයෙහි; දකුණුදිග, දක්ෂිණ දිශාවෙහි–

15 සි ය ලු නගරගින් පිරිසැම දෙස පත ළ
ළ ක ලූ ගාලු නම් පුරවරට මනක ළ
ය හ ලු සක් පුරය විලිවැද වී වික ළ
ගියෙලු මෙර මුදුන විසුමට වෙමිනි ලො ළ

15 යහලු, මිත්‍රය; සියලු නගරගින්, සකලනගරාග්‍රයන්ගෙන්; පිරි, සම්පූර්ණවූ; සැමදෙස, සකල දිශාවෙහි; පතළ, ව්‍යාප්තවූ; ළක ලූ, අලඞ්කෘතවූ; මනකළ, මනඃකල්‍යවූ; ගාලු නම් පුරවරට, එනම් පුරප්‍රවරයට; සක්පුරය, ශක්‍රපුරය; විලිවැද, ලජ්ජා ප්‍රවිෂ්ටව; වික ළවී, විකලව; මෙර මුදුන, මෙරු මස්තකයෙහි; විසුමට, වාසය පිණිස; ලොලවෙමිනි, ආසාවෙමින්; ගියෙලු, ප්‍රයාතය කෙළේලු.

16. තු ගු ගණතර පඬෙර එම්පුර මහ පව් ර
තු ගු රණගිර වෙණු අලලත කිරිසයු ර
තු ගු වින් නැගි වෙරළ වැද සිටි රළපත ර
හැ ගු මට ලොවට මැව්වැනි තිවට සිතයු ර

16. වෙණු, විළුණුදිව්‍යරාජයා; තුඟු, (එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන්) උස්වූ; රණගිර, සවර්ණමෙරුපර්වතයෙන්; කිරිසයුර, ක්‍ෂීර සාගරය; අලලත, ආලොලනය කරණකල්හි; ඉන්, එයින්; නැගී, උද්ගතවූ; වෙරළ, මයතීදවෙහි; වැද, ඝට්ටිතව; තුඟුව, උත්තුඞ්ගව; සිටි, ස්ථිතවූ; රළපතර, තරඞ්ගපඞ්ක්තිය; ලොවට, ලොකයාට; හැ ඟුමට, අවබොධවීම පිණිස; තිවට, මහාබ්‍රහමයා විසින්; එම්පුර, ඒ ගාලු නගරයාගේ; තුඟු, උස්වූ; පඬෙර, පාණ්ඩරවර්ණවූ; ගණතර, ඝ නාඝනවූ; මහපව්ර,මහාප්‍රාකාරය;මැව්වැනි,නිර්මිත කළාක්වැන්න.

17. එ පු ර කල් යතුරු වැඹ සිව්මුවෙනි යු තී
එ පු ර බලනුවිත් සිටි බඹය කිය යු ති
එ ව ර වදින විලසද නෙක ලකර යු තී
එ පු ර සිරි වණනු වැනි බඹහු කිය යු ති

17. එපුර, ඒ (ගාලු) නගරයෙහි; සිව්මුවෙනි, චතුර්මුඛයෙන්; යුතී, යුක්තවූ; කල්යතුරු වැඹ, කාලයන්ත්‍රස්ථම්භය (ඔර්ලෝසු කණුව) කෙසේදයත්? එපුර, ඒනගරය; බලනු, බැලීමපිණිස; ඇවිත්, ආගමනයකොට; සිටි, අවස්ථිතවූ; බඹය, බ්‍රහ්මයායයි; කියයුතී, කථනය කළ යුත්තේය; නෙක ලකර යුති, නෛකාලඞ්කාරයෙන් යුක්තවූ; ඒ, ඒ කාලයන්ත්‍රස්ථම්භයෙහි; වරවදින විලසද, වාරඝට්ටන විලාසය (වේලාව වදිනසැටි) ද; බඹහු, බ්‍රහමයා; එපුර සිරි, ඒ නගරශ්‍රිය; වණනුවැනි, වර්ණනාකරන්නාක් වැනියයි; කියයුතී, කථනය කළ යුත්තේය.

18 දි ය ත දිසි පහන් වැඹ එහි තුඟු පල ට
අන ත වුත් සිටින වැනි එපුර දැකුම ට
දි මු ත කොඩිය කොඩිගසැ මිහි කත සැම ට
සි ය ත බලව් සලනෙව් මෙසිරි දිගුකො ට

18 එහි, ඒනගරයෙහි; දිසි, දෘශ්‍යමානවූ; දියත, ජගත්හි;පලට, ව්‍යාප්තවූ; තුඟු, උත්තුඞ්ගවූ;පහන්වැඹ,ප්‍රදීපස්ථම්භය(කෙසේදයත්); අනත, අනන්තනම් නාගරාජයා; එපුර, ඒනගරය; දැකුමට,දර්ශනය පිණිස; අවුත්, ආගමනයකොට; සිටිනවැනි, අවස්ථානය කරන් නාක් වැන්න; කොඩිගසැ, ධවජ වෘක්‍ෂයෙහි; දිමුත, දීප්තිමත්වූ;

කොඩිය, ධ්වජයකෙසේදයත්?. මිහිකත, මහිකාන්තාව; සැමට, සියලුදෙනාට; මෙසිරි, මේ ශ්‍රියාව; බලව්, නිරීක්ෂණයකරව්යයි; සියත, ස්වකීය හස්තය; දිගුකොට, දීර්ඝකොට; සලනෙව්, චලනයකරන්නාක්වැන්න.

19 ඉ තු රු  නොකර  නොසමත  නතද වණන  ට
ඉ සු රු  බර **ගාලු** නම් එම පුරවර  ට
උ තු රු  දෙසිනි දුර පස්ගව්ව පමණ  ට
සොඳු රු  ලෙස මුහුදුබඩ පිහිටි වනපු  ට

19 ඉතුරුනොකර, අතිරික්තනොකොට; වණනට, වර්ණනාකිරීමට; අනතද, අනන්තනම් නාගරාජයාද; නොසමත, අසමර්ථවූ; ඉසුරුබර, ඓශ්වර්යයෙන් භාරවූ; ගාලුනම්, තන්නාමකවූ; එම පුරවරට, ඒ උත්තම නගරයට; උතුරුදෙසිනි, උත්තරදිශාවෙන්; පස්ගව්වපමණට, පංචගාව්‍යුත ප්‍රමාණයට; දුර, දූරවූ; මුහුදුබඩ, සමුද්‍රාසන්නයෙහි; තුටවන, සන්තුෂ්ට එළවන්නාවූ; සොඳුරුලෙස, සුන්දරාකාරයෙන්; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ.

20 රන්දෙඹ  පසෙක්  සි  ඳ්  වා **පතිරජ** ඇම  ති
රන්දෙඹ  ර ම ක්  ස  ද  වා දනවත කැම  තී
රන්දෙඹ  ප ල ක්  පු  ද  ලැබුයෙන් දමෙනි යු  තී
* **රන්දෙඹ**  න ම ක්  සොඳ  මෙගමට එයි පැව  ති

20 පතිරජ ඇමති, ප්‍රතිරාජ අමාත්‍යතෙම; රන්දෙඹ, දෙඹ අරණ්‍යයෙක්හි; පසෙක්, (එක්) පාර්ශ්වයක්; සිඳවා, ඡේදනය කරවා; දන, ජනයා; කැමතිවන, සන්තුෂ්ටවන්නාවූ; රන්දෙඹ රමක්, එනමින් ආරාමයක් (මෙකල විහාරගොඩයි සේයි);සදවා, සජ්ජිතකරවා; දමෙනියුතී, (ස්වර්ණ) දමයකින් යුක්තවූ; රන්දෙඹ පලක්,ස්වර්ණ පූර්ණාග ඵලයක්; පුදලැබුයෙන්, පූජාලැබූ හෙයින්; මෙගමට, මේ ග්‍රාමයට; සොඳ, සුන්දරවූ; රන්දෙඹ නමක්, රන්දෙඹ යන නාමය; පැවති එයි, ප්‍රවෘත්තිතව එයි.

21 මෙ ර න්  දෙඹ නියම් ගම එකසෙ උදු  ල ය
තොරන්  දෙරටු කොත් වප් දිසි පහ පෙ  ල ය
නි ර න්  තර කරණ දනමුළු පින්ප  ල ය
ස ර න්  නට ඉදෙව් වැනි එව්මන් පෙ  ල ය

21 රන්දෙඹ, එනම්වූ; මෙනියම්ගම, මේ නිගමග්‍රාමයෙහි; එකසෙ, එකාකාරව; උදුලය, උජ්වලිතවූ; තොරන්, තොරණය;කොත්, ශෘංගය; වප්, ප්‍රාකාරය;(යනමේයින්);දිසි, බබලන්නාවූ;පහපෙළය,

* මුඛපරම්පරා කථාවකි.

ප්‍රාසාදපඞ්කතිතොමේ. (කෙසේදයත්); දනමුළු, (මෙගම්වැසි) ජන සමූහයා; නිරන්තර, අනවරතයෙන්; කරණ, (රැස්) කරන්නාවූ; පින්පලය, පුණ්‍යවිපාකය; සරන්නව, අනුසමරණයපිණිස; ඉද්‍රා ශ ක්‍රයා විසින්; එවි, එවනලද්දවූ; එවිමන්පෙළය වැනි, (දිව්‍ය) විමාන පඞ්කතියක් මෙනි.

22 දන් සිල් ඈ පින් නිති කරණා ලො ළය
නන් රට බස සත සිප් නිති හස ළය
මන් ලෙස තිලදුරු දිරි විකුමෙන් ප ළය
රන් කල ඳේ ඈ දනයුතු දන කෑ ළය

22 නිත්, නිරන්තරයෙන්; ලොළය, (විපාක) ලොභයෙන්; දන් සිල් ඈ, දනශිලාදිවූ; පින්, පුණ්‍යයන්; කරණ, (රැස්) කරණසුළුවූ; නන්රට, අනෙකරාෂ්ට්‍රයන්හි; බස සතසිප් නිතිහසළය, භාෂාශා ස්‍ත්‍ර ශිල්ප හා නීතිය පුරුදුකළාවූ; මන්ලෙස, සිත්වූ පරිද්දෙන්; තිලදුරු, ස්ථානාන්තරධාරිවූ; දිරිවිකුමෙන්, ධීරවික්‍රමයෙන්; පළය, ප්‍රකටවූ; රන්කලඳේ ඈ; ස්වර්ණකල ධෞතාදිවූ; දන, ධන ඇත්තා වූ; දනකෑල, ජනසමූහයාගෙන්; යුතු, (මේ ග්‍රාමයතෙමේ) යුක්තය.

23 තැන තැන දනන් ගෙණ ගණ කල් හල් යුතුය
දන මන නුවන් පිණ වන මල් පොල් වතුය
ගෙණ ගෙණ බිඟුන් රොණ යන මල් විල් යුතුය
දන ගණ නතින් යන එන සල් පිල් යුතුය

23 තැන තැන, ස්ථානයක්පාසා; දනන්ගෙණ, ජනයන්ගෙන්; ගණ, ගහණවූ; කල්හල්යුතුය, යහපත්ශාලාවන්ගෙන් යුක්තය; ද න, ජනයන්ගේ; මනනුවන්, මනොනෙත්‍රයන්; පිණවන, පිණනය වන්නාවූ;මල් පොල්වතුය,මල්වතුවලින් හා පොල්වතුවලින්යුක්ත ය; බිඟුන්, භෘඞ්ගයන් විසින්; රොණ ගෙණ ගෙණ, රෙණු ග්‍රහණය කොට කොට;යන, ගමනයකරන්නාවූ;විල්යුතුය, තඩාගයන්ගෙන් යුක්තය; දනගන, ජනසමූහයා; යන එන, ගමනාගමනය කරන් නාවූ; සල්පිල් යුතුය, ආපනශාලාවන්ගෙන් යුක්තය.

24 හෙරළු තල් කිතුල් කල් දඹ රඹ ගිර ඔ
වෙරළු දෙල් හොවල් මල් දෙඹ දෙඹ කොස ඔ
අරළු සල් ඉඹුල් වල් අඹ අඹ ඇට ඔ
යහළු කල් ලකල් සල් හඹ හඹ නර ඔ

24 නෙරළු, නාළිකෙරය; තල්, තාලය; කිතුල්, හින්තාලය; කල්, යහපත්වූ; දඹ, ජම්බූය; රඹ, රම්භාය; ගිරඹ, කීරාම්‍රය; වෙර

එ, වෙරළුය; දෙල්, ලකුජය; තොමල්, උදුම්බරය; මල්දෙඹ, පුෂ්ප පුන්නාගය; දෙඹ, පුණ්ණාගය; කොසඹ, නිම්බය; අරළු, හරිතකීය; සල්, සාලය; ඉඹුල්, සාල්මලීය; වල්අඹ, වනආම්‍රය; ඇටඹ, සේවතා මූය යන, ලකල්, අලඞ්කෘතවූ; සල්, වෘක්ෂයන්, කල්යහලු, කල්‍යාණ මිත්‍රය; හඹහඹ, වහවහා; නරඹ, නිරීක්ෂණයකරව.

25 මු ද අලු බීයෙහි රන්මිණි බරණ සො ද
සොඳ රුසිරු අබිසරු සරත රය න ද
න ද කර සලෙලු ලොලවල කෙළි නිබ ද
බ ද විදුලි දුල ලෙල බල යහළු න ද

25 සොඳ, සුන්දරවූ; රුසිරු, රූපශ්‍රීන්; නද, සන්තුෂ්ටවූ; අබිසරු, අභිසාරිකාවන්; රය, රාත්‍රියෙහි; අලුබීයෙහි, ආලොකභිත්තියෙන්, සොඳ, සුන්දරවූ; රන්මිණිබරණ, සුවර්ණමාණික්‍යාභරණයන්; මුඳ, ගලවාතබා; නිබඳ, නිරන්තරයෙන්; අවලකෙළි, ආකූල ක්‍රීඩාවෙහි; ලොල, ලොලවූ; සලෙලු, සලලාලයන්; නදකර, සන්තුෂ්ටකරමින්; සරත, හැසිරෙන කල්හි; දුල, ජ්වලිතවූ; ලෙළ, ලීලොපෙතවූ; විදුලිබඳ, විද්‍යුල්ලතාකාරවූ (ඒ අභිසාරිකාවන්); යහළු, මිත්‍රය; නඳ, සන්තොෂයෙන්; බල, අවලොකනයකර.

26 සු ර න් ලෙස පසන් අබරණ සරා දරා
නිති න් සුදු අසුන් යෙදු රිය අරා වෙරා
ද න න් යනෙන කල මෙහි සිරි සරා තිරා
බ ල න් නට අවුත් සුරකැන් සරා යුරා

26 සුරන්ලෙස, දෙවියන්මෙන්; වෙරා, ශරීරයෙහි; පසන්, ප්‍රසන්නවූ; අබරණ, ආභරණයන්; දරා, ධාරණයකොට; නිතින්, නිරන්තරයෙන්; සරා, සැරසී; සුදුඅසුන්, ශ්වෙතඅශ්වයන්; යෙදූ, යොජිතකළාවූ; රිය, රථයන්ට; අරා, ආරූඪව; දනන්, ජනයන්; යනෙනකල, ගමනාගමනය කරණ කාලයෙහි; සුරකැන්, දිව්‍යසමූහයා; මෙහි, මේ ග්‍රාමයෙහි; තිර, ස්ථිරවූ; සිරිසරා, ශ්‍රීසාරය; බලන්නට, බැලීමපිණිස; අවුත්, ආගමනයකොට; සරායුරා, සචාරණයකරණ ආකාරයි.

27 පො ර ණ මිනිස් ලොව පත් කප්තුරු මහ රු
තෙ ර එ තුරුවලට විලිවැද ගිය අයු රු
තෙ ර එ අතු සැලෙන නලවැද වැද සොඳු රු
සු ර න් හට එතුරු එවනට කියන යු රු

27 පොරණ, පුරාණයෙහි; මිනිස්ලොව, මනුෂ්‍යලොකයට; පත්, ප්‍රාප්තවූ; කප්තුරු, කල්පවෘක්ෂයෝ; මහරු, මහාර්ඝවූ; තෙරඑතුරු

වලට, නාළිකෙර වෘක්‍ෂයන්ට; විලිවැද, ලජ්ජාප්‍රාප්තව; ගියඅසුරු, (මිනිස්ලොව හැරපියා දෙව්ලොවට,)ගියාක්මෙනි; නළ, මාරුතය; වැදවැද, වැදිවැදී; සැලෙන, චලනයවන්නාවූ; සොඳුරු, සුන්දරවූ; නෙරළුඅතු, නාළිකෙර සාඛාවෝ; එතුරු, ඒ කල්පවෘක්‍ෂයන්; එව නට, එවීම පිණිස; සුරන්හට, දෙවියන්ට; කියනයුරු, කථනය කරණ ආකාරයි.

28 සි ය ලු  තුරු  වලට වැඩිඅගය නොමහ  ලූ
ල ක ලු  තුරු  නැතිව වට මල්පල බැබ  ලූ
සි ය ලු  තුරු  සැපත් දෙන නරනට මෙමු  ලූ
නෙරලු  තුරු  බලව කප්තුරු දිනු යහ  ලූ

28 යහළු, මිත්‍රය; සියලු තුරුවලට, සකල වෘක්‍ෂයන්ට; වැඩිඅගය, අධිකාග්‍රභාවය; නොමහළු, නොහැරියාවූ; අතුරු නැතිව, අන්තර රහිතව; වට, හාත්පස්හි; ලකළු, අලඞ්කෘතවූ; මල්පල, පුෂ්ප ඵලයන්ගෙන්; බැබලූ, භ්‍රාජිතවූ; මෙමුළු නරණට, මේසකල මනුෂ්‍යයන්ට; උතුරු, උත්තමවූ; සියලු සැපත්, සකලසම්පත්තිය; දෙන, දානයකරන්නාවූ; කප්තුරු, කල්පවෘක්‍ෂයන්; දිනූ, ජයග්‍රහණයකළාවූ; නෙරළුතුරු, නාලිකෙර වෘක්‍ෂයන්; බලව, නිරීක්‍ෂණය කරව.

29 වි ල් මුව කඳු තනවන මුහුලස ලක  ලී
ම ල් කැන්දසන විලිකුම් කෙම් පල දෙතො  ලී
පොල් කර මල්පල කරබරණ අතැඟි  ලී
දු ල් මෙම ගම්කත ගහ දිසි සිරිමුවෙ  ලී

29 විල්මුව, තඩාගනමැති මුඛ ඇති; කඳුතන, (කුඹා) පර්වත නාමැති පයොධර ඇති; ලකලී, අලඞ්කෘතවූ; වන මුහුලස, වනනාමැති කෙශකලාප ඇති; මල්කැන්දසන, පුෂ්පමඤ්ජරී නමැති දත්ඇති; විලිකුම්, විලික්ෂවිගියාවූ; කෙම්පල, කෙම්ගෙඩිනමැති; දෙතොලී, ඔෂ්ඨවය ඇති; පොල්කර, නාළිකෙරවෘක්‍ෂනමැති අත් ඇති; මල් පලකරබරණ, පුෂ්ප ඵල නමැති හස්තාභරණ ඇත්තාවූ; අතු ඇඟිලි, සාඛා නමැති ඇඟිලිඇත්තාවූ; මෙම ගම්කත, (රන්දෙඹා) නාමැති එනත්ග්‍රාම කාන්තාතොමෝ; දුල්, ජ්වලිතවූ; මෙවුලි සිරි ගහ, ගඞ්හා නමැති මෙඛලාශ්‍රිය; දිසි, දක්වී.

30 ම ලි න්  ගැවසී පිපිතුරු ලිය ලක  ලීය
නැතින්  නැන පෙණෙන කඳු ගැට බැබ  ලීය
බ ල න්  නට මෙ ගම මිහිකත නොසැ  ලීය
වි ටි න්  විට එසෙව් හීස සිරි ඉසි  ලීය

30 පිපි, පුෂ්පිතවූ; මලින්, පුෂ්පයන්ගෙන්; ගැවසී, සඤ්ජාත වූ; තුරුලිය, වෘක්ෂලතාවන්ගෙන්; ලකලිය, අලඞ්කෘතවූ; බැබලිය, භ්‍රාජිතවූ; තැතින් තැන, ස්ථානයක් පාසා; පෙණෙනා, දෘශ්‍යමාන වන්නාවූ; කදුගැට, කුඩා පර්වතයෝ කෙසේදයත්? මිහිකත, මහී කාන්තාතොමෝ; මෙ ගම, මේ ග්‍රාමය; බලන්නට, අවලොකනය පිණිස; නොසැලිය, අවචලව; විටින්විට, වාරයක් පාසා; එසෙවි, උද්ගතකලාවූ; හිසසිරි, ශීර්ෂයාගේ ශ්‍රියාව; ඉසිලීය, උද්වහනය කෙළේය.

තවද සිරිසර මෙගම්වර පින්සර පතිරජදෙව්මැතිවර කළ මනහර එඅරමැ තොරතුර සැකෙවින මෙහි දැන් පවසමි, මමිතුර හෙද තා දෙසවන් මිණි කොඬොල්ලකර කර.

නැවත ශ්‍රීසාරවූ එතන්ග්‍රාමප්‍රවරයෙහි පුණ්‍යසාරවූ ප්‍රතිරාජ දෙව අමාත්‍යාග්‍රමයන් කළ මනොහර ඒ ආරාමයෙහි විශෙෂ විභාග සංක්ෂෙපයෙන් මෙහි දැන් ප්‍රකාශකරමි, මාගේ මිත්‍රය එයද තාගේ කර්ණයුගලයෙහි මාණික්‍ය කුණ්ඩලාභරණකරව.

31 නරවර දෙවෙනි පැරකුම් හිමිඳු අනලෙ ද
වැලිතර තොටමුණට වුත් එම ඇමතිස ද
තිරතුර ලෝ සසුන් වැඩුමට සිතුපැහැ ද
තිරසර වෙහෙර රම් කරවන සඳ නොම ද

31 දෙවෙනි පැරකුම්නරවර හිමිඳු, ද්විතීය පරාක්‍රමබාහු නරෙන්‍ද්‍ර ස්වාමීන්‍ද්‍රයන්වහන්සේගේ; අනලෙද, ආඥාපරිද්දෙන්; එම ඇමති සඳ, එම අමාත්‍යොත්තම තෙම; වැලිතර තොටමුණට, එනම් ප්‍රදෙශයට: අවුත්, ආගමනයකොට; තිරතුරු, නිරන්තරයෙන්; සිතු පැහැද, චිත්තප්‍රසන්නව; ලෝසසුන් වැඩුමට, ලොකශාසනාභිවෘද්ධියපිණිස; වෙහෙරරම්, විහාරාරාමයන්; තිරසර, ස්ථිරසාරව; නොමද, බොහෝසෙයින්; කරවනසඳ, කරවනකාලයෙහි.

32 වැලිතර එතොටමුණ බඳ නොදෙස පුවත ර
පුවතර මෙරන්දෙඹ එක්පසෙකැ මතිව ර
මතිවර වෙහෙර කරවා සඟන තිතිව ර
තිතිවර විසීමට පුදකෙළෙලු මමිතු ර

32 මමිතුර, මාගේ මිත්‍රය; නොදෙස, අනෙක දිශාවන්හි; පුවතර, ප්‍රසිද්ධවූ; වැලිතර එතොටමුණ බඳ, ඒ වැලිතර තොටමුණයට සම්බන්ධවූ; පුවතර, ප්‍රසිද්ධවූ; මෙරන්දෙඹ, මේ රන්දෙඹ නම් ග්‍රාම

යෙහි; එක්පසක, එක්පාශ්වයෙක්හි; මනිවර, උතුම් ප්‍රඥව ඇත්තාවූ; ඇමතිවර, (ඒ ප්‍රතිරාජදෙව) අමාත්‍යානනාමතොම; වෙහෙර, විහාරයක්; කරවා, කාරාපිතව; නිති, නිත්‍යයෙන්; වර,(ගුණයෙන්) උතුම්වූ; සඟන, සඞ්ඝයාගේ; නිහිවර, නිත්‍යකාලයෙහි; විසීමට, වාසය පිණිස; පුදකෙලෙලු, පූජකෙළේලු.

33 වෙහෙර ගොඩ නමැතිවිය ඉන් එම පෙදෙ ස
වෙහෙර තුබුන තැන ගල් උළු ගඩොල් මි ස
වෙහෙර දූන් නොමැත මුනිදෙසු දහම් ලෙ ස
ස ක ර සැම දනුව මඹිතුර බැව් අනි ස

33 ඉන්, ඒ හෙතුවෙන්; එමපෙදෙස, තත්ප්‍රදෙශයට; වෙහෙර ගොඩ නම, තන්නාමය; ඇතිවිය, විද්‍යමානවිය; දූන්, අධුනා කාලයෙහි; වෙහෙර තුබුනතැන, විහාරය තිබුනු ස්ථානයෙහි; ගල්, පාෂාණ ඛාණ්ඩභා; උලුගඩොල්මිස, උලු ගඩොල් හැර; වෙහෙර, විහාරය; නොමැත,අවිද්‍යමානය; (එහෙසින්) මඹිතුර, මාගේ මිත්‍රය;මුනිදෙසුදහම්ලෙස,සර්වඥ දෙශිතධර්මය පරිද්දෙන්; සැමසකර, සියලු සංස්කාරයන්ගේ;අනිස බැව්,අනිත්‍ය භාවය; දනුව, විජානනයකරව.

34 ය සේ ය මෙහි සිරිසර තිනි දි සේ ය
ල සේ ය නොව අනනද ඇතිලෙ සේ ය
නොසේ ය වත වණනට කිවි බ සේ ය
කෙ සේ ය මම පවසමි තතුලෙ සේ ය

34 මෙහි, මේ ග්‍රාමයෙහි; නිති, නිරන්තරයෙන්; දිසේය, දෘශ්‍යමානවූ; යසේය, යහපත්වූ; සිරිසර, ශ්‍රීසාරය; ඇති ලෙසේය, විද්‍යමානාකාරයෙන්; ලසේය නොව, අනාලස්‍යව; වණනට, වර්ණනාකිරීමට; අනනද, අනන්ත නම් නාගරාජයාද; නොසේය වත, දක්ෂ නොවන කල්හි; මම, අස්මින්තෙමේ; කිවිබසේය, කාව්‍ය භාෂාවෙන්; තතුලෙසේය, තත්වාකාරය; කෙසේය, කවර ආකාරයකින්; පවසමි, ප්‍රකාශකරම්ද?

35 ර න් දෙඹ යසි පතළ අනුරුත් නමින් යු තු
න න් සිරිපිරි මෙගම කුදුගම් පසිනි යු තු
ඉ න් නොප පැමිණි මැදගොඩ සව්සිරිනි යු තු
සෙ න් නායක වලව්වද අපගෙ දන යු තු

35 කුදුගම් පසින් යුතු, ක්ෂුද්‍රග්‍රාම පවකයකින් යුක්තවූ; නන් සිරිපිරි, නානා ශ්‍රියෙන් පිරුණාවූ; මෙගම, මේ ග්‍රාමය; රන්දෙඹ යසි පතළ අනුරුත් නමින්යුතු, (උසනප්‍රකාරයෙන්) රන්දෙඹයසි

ප්‍රසිඬ අභාවිනාමයකින් යුක්තය; ඉන්, ඒ සක්‍ෂුද්‍රග්‍රාම පවකයෙන්; තොප, යුෂ්මත්හු; පැමිණි,සම්ප්‍රාප්තාවූ; අපගෙ,අස්මත්හුගේ; සෙන් නායකවලව්ඩද, සෙනානායක වලව්වද; සව්සිරිනි යුතු, සකල ශ්‍රී යෙන් යුක්තාවූ; මැදගොඩ, එනම් කුඩා ගමෙහියසි; දතයුතු, විජා නනය කළයුත්තේය.

36 තෙරුවනැ බැති පෙමැති–දන්පින් කරණ නිතියෙන්
සු ර තුරු ලිය යුග වන් ගුරු ගුණ සරු වන්
නි ර තුරු සිල් පිරු වන් දරු සැ ප සරු වන්
දිනෙස් මැන්දිස් එවි–කුම්රුවන සෙන්නායක
මූහ න් දිරම් මැති තුම හා කිස සුරු වන්
නද න් මුවෙන් නිති දුටු දන පිය කරු වන්
ව නි ග මුනි සුසානා මැන්දිස් විම ල
රුව න මැතිනි සඳ අප දෙගුරුන් මෙක ල
නය න ගමන වැඩ සිදුවනලෙස විපු ල
න ද න සිතින් සිහිකර පින්දී සත ල

36 සහල, යහලුව; තෙරුවනැ, ත්‍රිවිධරත්නය කෙරෙහි; බැති පෙමැති, භක්ති ප්‍රෙම ඇත්තාවූ; නිතියෙන්, නිරන්තරයෙන්; දන් පින්කරණ, දන්පින් කරන්නාවූ; සුරතුරු ලියයුගවන්, කල්පද්‍රැම කල්පලතායුග්මයක් බදුවූ; ගුරුගුණ සරුවන්, මාතෘ පිතෘ ගුණ යෙන්සාරවූ; නිරතුරු, නිරන්තරයෙන්; සිල්පිරුවන්, ශීලපූරණය ඇත්තාවූ; දරුසැපසරුවන්, පුත්‍රසම්පත්තියෙන් සාරවූ; කිස සුරු වන්, කෘත්‍යයෙහි සුරවූ; නිති, නිරන්තරයෙන්; නදන් මූවෙන්, ස තොෂ මුඛයෙන්; දුටුවන්, දක්නයකළ ජනයාට; පියකරුවන්, ප්‍රියඞ්කරවූ; දිනෙස් මැන්දිස් විකුම්රුවන සෙන්නායක, දිනෙස් මැන්දිස් වික්‍රමරත්න සෙනානායක නම්වූ; මූහන්දිරම් මැතිතුම හා, මුහන්දිරම් මන්ත්‍රීශ්‍රයා සහ; වනිගමුනි සුසානා මැන්දිස් විමල රුවන මැතිනිසඳ, වණිගමුනි සුසානා මැන්දිස් විමලරත්න මන්ත්‍රි ණියදයන; අප දෙගුරුන්, අපගේ මව්පිය දෙදෙනා; මෙකල, මේ කාලයෙහි; නයන ගමන, නායන්නාවූ ගමන; විපුල, මහත්වූ; වැඩ සිදුවනලෙස, අභිමතාර්ථ සංසිඞ්ඨපිණිස; නදන සිතින්, සනොෂ චිත්තයෙන්;සිහිකර,අනුස්මරණයකොට;පින්දී,ප්‍රාප්තිදානයකොට,

37 පරසිදු සලාගම-නම් යුත් කුල තිලකතුල
කි රි සි දු සකකිරි යුරු දස්දෙස නිම ල
ප ර සි දු **රදපස පරපුර** දිනු කොම ල

පිරිසිදු සැදුහැ බැති-පෙමැති තෙරුවන හැමකල

පිරිසිදු විලස පන්සිල් සුරකින ති ළි ය
පිරිසිදු කුළුණු මෙත් හිරොතප් ගුණ වෙ ළි ය

දු ගී ද න තො සා සඟ දන්දෙනු ති නි නී
ලැ ගී නො ව ල සා යුතු දෙවිය දේ නි නී
හැ ගී නු ව ණැ සා මාපිය වැඳ බැ නි නී
**මැ ගී ද සො සි සා රදපස** නම් මැ නි නී

37 පරසිදු, ප්‍රසිඬවූ; සලාගම නම්යුත්, ශාලාග්‍රාම යන නාම යෙන් යුක්තවූ; කුල, වංශයට; තිලකතුල, තිලකයක් වැනිවූ; කිරිසිදු සකකිරියුරු, ක්ෂීරසාගර සංඛක්ෂීරසේ; නිමල, නිර්මලවූ; දස දෙස, දශදිසාවෙහි; පරසිදු, ප්‍රසිඬවූ; රදපස පරපුර, රාජපක්ෂ පරම්පරාවෙහි; දිනු, ජනිතවූ; කොමල, මොලොක්ගුණ ඇති; තෙරුවන, රත්නත්‍රය කෙරෙහි; හැමකල, සදාකාලයෙහි; පිරිසිදු, පරිශුඬවූ; බැතිපෙමැති, භක්තිප්‍රෙමඇත්තාවූ; තිළිය, සන්තොෂයෙන්; පිරිසිදු විලස, පරිශුඬාකාරයෙන්; පන්සිල්, පචසීලය; සුරකින, මනාකොට රක්ෂාකරන්නාවූ; පිරිසිදු, පරිශුඬවූ; මෙත්, මෛත්‍රියෙන්ද; හිරොතප්ගුණ, හිරිඔත්තප්ප ගුණයෙන්ද; වෙළිය, වෙෂ්ටිතයවූ; (දුවටූනාවූ) දුගිදන, දුගීත ජනයාට හා; සඟ, සංඝයාවහන්සේට; තොසා, සන්තොෂයෙන්; නිතිනි, නිරන්තරයෙන්; දන්දෙනු, දන් දීම පිණිස; ලැගි, ලග්නවූ; අලසානොව, අනාලස්‍යව; දෙවිය, ධොවනය කරණලද; දේනිතියුතු, හස්තබන්ධයෙන් යුක්තවූ; හැගී නුව නැසා, වැටහෙන ඥනාක්ෂියෙන් යුක්තවූ; (සර්වතොචිත ප්‍රඥවෙන් යුක්තවූ) මාපිය, මාගේ ප්‍රියාවවූ; මැගී ද සොසිසා රදපස නම් මැනිනි, මැගී ද සොසිසා (විජයසිංහ) රාජපක්ෂ මන්ත්‍රිණීය; බැතිනි, භක්තියෙන්, වැඳ, නමස්කාරකොට.

38 එමැනිනිය ගුණනි වි
ගෙණව සරකර සුරැ කුම්
මෙහසුන් ගෙණප විසිතු රු
පල මෙසිව්පද අග වන්

38 ගුණහිමි, (යථොක්ත) ගුණයන් උස්වූ; එමැතිතිය; ඒ (**මැගී ද සොයිසා විජයසිංහ රාජපක්ෂ**) මන්ත්‍රීණියගෙන්; අවසරගෙණ, ඔකාශග්‍රහණය කොට; මෙසිව්පද, මේ පාදචතුස්කයෙහි; අගවන්, අනන්‍ය (චතුර්) වර්ණයෙන්; පළ, ප්‍රකටවූ; අප, අස්මත්හුගේ; විසිතුරු, විචිත්‍රවූ; මෙහසුන්ගෙණ, මේ සංදේශය ග්‍රහණයකොට; සුරකුම්කර, සුරක්ෂිතකොට.

39 ඉ ඳු තෙන ගු රු සඳ ය කිවි රිවි බලවෙමි න
ස ඳු දි න හි රු උ ද ය ලත් පුසය නැකති න
බු දු උ න ම රු බිඳ ය අප මුනි තුම බැති න
වැ ඳු මෙ න මු රු යද ය යනු මැන සිතතුටි න

39 ඉඳුතෙන, බුදහුය; ගුරු, බෘහස්පතිය; සඳය, චන්ද්‍රයාය; කිවි, සිකුරුය; රිවි, සූර්‍ය්‍යයාය යනමේ ග්‍රහයන්; බලවෙමින; (උච්චක්ෂේත්‍ර ස්වක්ෂේත්‍ර දිග්බල ශුභදෘෂ්ටි ආදියෙන්) බලවත්වෙමින්; (සිටිනකල්හි) සඳුදින, චන්ද්‍රවාරයෙහි; හිරු, සූර්‍ය්‍යයා; උදය, උදාවනකල්හි; ලත්, ලද්දාවූ; පුසය නකතින, පුෂ්‍යනී නක්ෂත්‍රයෙන්; මරුබිඳය, මාර පරාජයකොට; බුදුවුන, සර්වඥපදප්‍රාප්තවූ; අපමුනිතුමා, අපගේ මුනීන්ද්‍රොත්තමයන්වහන්සේ; බැතින, භක්තියෙන්; වැඳුමෙන, නමස්කාරකිරීමෙන්; මුරු, දෙවියන්ටද; යදය, යාඥකොට; තුටින, සන්තොෂයෙන්; යනුමැන, ගමනයකළහොත් මැනවි.

40 කොඳ සි ය ප ත් පුන් කුඹු ගණිමින් අති න
හැ ඳ හෙළව ත් රන් මිණි බරණින් හොබ න
න ද පැහැප ත් සන් සුන් විළසි න් යනෙ න
ල ඳ ය හ ප ත් යන් මග දකි මි න් කළ න

40 කොඳ, කුන්දය; සියපත්, ශතපත්‍රය; පුන්කුඹු, පූර්ණකුම්භය; (යනමේ ආදි වස්තූන්) අතින, හස්තයෙන්; ගණිමින්, ග්‍රහණය කොට; හෙළවත්, ශ්වෙතවස්ත්‍ර; හැඳ, අච්ඡාදනයකොට; රන්මිණි බරණින්, ස්වර්ණමාණික්‍යාභරණයෙන්; හොබන, ශොභමානවූ; නද, සන්තුෂ්ටවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; සන්සුන් විලසින්, ශාන්ත දාන්තවිලාසයෙන්; යනෙන, ගමනාගමනයකරන්නාවූ; යහපත්ලඳ, මනොඥ කාන්තාවන්; මග, පථිපථයෙහි; දකිමින්, දර්ශනයකොට කළණ, කල්‍යාණමිත්‍රය; යන්, ප්‍රයාණයකරන්.

41 සෙන් නායක වලව්වෙන් ගොස් පැළදිග ට
ම න් තොස සබඳ සපැමිණ මුහුදු වෙරළ ට
මි න් කැල බලා සමුදුර සිටි ඔබර කො ට
ය න් අලුකොබෝ සඳ වෙරළම දකුණත ට

41 සබඳ,මිතුවූ; අලුකොබෝසඳ,අලුකොබෝ පක්ෂිරාජය; සෙන් නායක වලව්වෙන්, සේනානායක වලව්වෙන්; පැළදිගට,පශ්චිම දිශාවට; මන්තොස, සන්තෝසයෙන්; ගොස්, ගමනයකොට; මුහුදු වෙරළට, සමුද්‍රතීරයට; සපැමිණ, සම්ප්‍රාප්තව; සමුදුර, සමුද්‍රයෙහි; ඔබරකොට, ඔබරකරමින්;සිටි,අවස්ථානයකළාවූ;මින් කැල,මත්ස්‍ය සමූහයා; බලා, නිරීක්ෂණය කරමින්: වෙරළම, තීරයෙහිම; දකුණතට, දක්ෂිණ දිශාන්තයට; යන්, ප්‍රයාතයකරන්.

42 කෙළ කෙළ මගට බැස පොත්පත් ගෙණ පැමි ණ
පෙ ල පෙල ගැසී දරුවන් වණපොත් කර ණ
කා ල බල නොවී යනකල ඉදුරෙන් පෙණෙ ණ
බ ල පාසැල කරවු අප දෙගුරුන් විසි ණ

42 පොත්, පුස්තකයන් හා; පත්, පත්‍රයන්; ගෙණ, ග්‍රහණය කොට; මගට, මාර්ගයට; බැස, අවතීර්ණව; පෙලපෙල ගැසී, පඞ්ක්ති පඞ්ක්තිව; පැමිණ, ප්‍රාප්තව; දරුවන්, දාරකයන්; වණපොත්කරණ, පාඩම්කරන්නාවූ; කලබලනොවී, සන්සුන්ව; යනකල, ගමනයකරණ කාලයෙහි; ඉදුරෙන්, නැගෙණහිර දිශාවෙන්; පෙණෙන, දර්ශනයවන්නාවූ; අප, අස්මත්හුගේ; දෙගුරුන් විසින්, මාතෘපිතෘ දෙදෙනා විසින්; කරවූ; කාරාපිතවූ; පාසැල, පාඨශාලාව; බල, නිරීක්ෂනයකරව

43 දූ ල දූ ල නැගි නැගී අද සෙද වෙරළ ර ල
පෙ ල පෙ ල වැ දි වැ දී ය න රඟ සසල ස ල
ලො ල ලො ල බි ඳි බි ඳී ප ණ රළ අබල බ ල
බ ල බ ල සි ඳී සි ඳී මි ය වැල වැදල ද ල

43 සල, චඤ්චලවූ; රළ, තරඞ්ගයන්; පෙල පෙල, පඞ්ක්ති පඞ්ක්තිව; දූල දූල, ජ්වලිත ජ්වලිතව; නැගි නැගී, උද්ගතවෙමින්; අද, අවුත්; බල, ශක්තිමත්වූ; වෙරළ, සමුද්‍රතීරයෙහි; වැදි වැදී; ඝට්ටනයවෙමින්; සසල, ඝෝෂාවඇතිව; සෙද,වහා; බිඳිබිඳී, භග්න භග්නව; යන, (විනාශ භාවයට) යන්නාවූ; රඟ, ආකාරය; බල, නිරීක්ෂණයකරව; (එසේම) ලොලලොල, අතිචඤ්චලවූ; අබල,අස්ථිර

වූ හෝ දුර්වලවූ; පණරළ, ප්‍රාණ (ජීවිතේන්‍ද්‍රිය) නමැති තරඞ්ගය; මියවැල, මරණ නමැති තීරයෙහි; වැද, සඞ්ඝට්ටනයව; සිඳිසිඳී, ජීර්ණ ජීර්ණව (යෙයි) හෙවත් විනාශව යෙයි; බල, (මේකරුණු නුවනැසින්) බලා; අද, ජීවිතයෙහි; අල, ආලය; අල, දුරුකර; (සමුද්‍රතීරයට පැමිණිකල තදුසන්නව පිහිටි අප දෙගුරුන්ගේ ශෛලමය සොහොන්කොත් දක්නා හෙයින් මනුෂ්‍ය ජීවිතයෙහි අනිත්‍යතාව දක්වනු පිණිස මේකව කියනලදි.)

44 සි ඳු රළපතර කෙතරම් වුවද බලව ත
බ ඳු එම පැන නොයන රහ වෙරළ බල ඉ ත
බු ඳු සව් ගිහි පැවිදි දන සික පද පණ ත
කු ඳු උවදිවි කරුණුකොටවත් පැන නොය ත

44 ඉත, මිත්‍රය; සිඳු, සාගරයාගේ; රළපතර, තරඞ්ග පඞ්ක්තිය; කෙතරම් බලවත්වුවද, කොපමණ බලවත්වුවත්; වෙරළ, මර්‍ය්‍යාදව; පැන, උල්ලඞ්ඝනයකොට; (ඉක්මවා) නොයනරඟ, නොයන්නාවූ ආකාරය; බල, නිරීක්ෂණයකර; එම්බඳු, එයාකාරයෙන්ම; බුදුසව්, බුඞ්ශ්‍රාවකවූ; ගිහි පැවිදි දන, ගෘහස්ථ ප්‍රව්‍රජිතජනයෝ; කුදු උව, ක්‍ෂුද්‍රවූනමුදු; සිකපදපණත, සික්‍ෂාපද ප්‍රඥප්තිය; දිවිකරුණුකොටවත්, ජීවිතය කාරණකොටගෙණ උවත්; පැන නොයත්, උල්ලඞ්ඝනයකොට නොයත්. (මතුකී සොහොන් කොත් දුටු ඉක්බිති ඉන් ඔබ්බෙහිපෙණෙන මහාම්බගලසමුද්‍රාරාමය දක්නාහෙයින් ගිහිපැවිද්දන් විසින් බුඞප්‍රඥප්තිය රැක්කයුතු ආකාරය දක්වනුපිණිස මෙය කියනලදී.)

45 බ ල නුවනොස සිඳු සැමි විලස පෙළ ගැ සී
කොල මූ හු ල ස මල් මුව බිඟු නෙතු ගැව සී
පු ල ම ද හ ස රොණඟරගා සුවඳ ඉ සී
දු ල වෙර ළ ස සිටි බල වැටකෝ දිගැ සී

45 සිඳුසැමි, සමුද්‍රනමැති ස්වාමියාගේ; විලස, විලාසය; නොස, සන්තොෂයෙන්; බලනුව, බැලීමපිණිස; වෙරළස, මර්‍ය්‍යාදව සමීපයෙහි; පෙළගැසී, පඞ්ක්තිව; සිටි, අවස්ථානයකළාවූ; කොලමුහුලස, පත්‍ර නමැති කෙශකලාප ඇති; මල්මුව, පුෂ්පනමැති මුඛඇත්තාවූ; බිඟුනෙතු ගැවසී, භෘඞ්ග නමැත නෙත්‍රවලින් ගැවසීගත්තාවූ; පුල මදහස, (පුෂ්පයන්ගේ) ඵුල්ලභාවය නමැති මන්‍දහාස්‍යඇති; රොන් අඟර, රේණු නමැති අඞ්ගරාගයන්; ගා, ආලෙපකොට; සුවඳඉසි, සුගන්ධ සෙවනයකළාවූ; දුල, ජ්වලිතවූ; වැටකෝ දිගැසී, කෙතකී වෘක්‍ෂ නමැති දීර්ඝාක්‍ෂිකාවන්; බල, අවලොකනයකර.

46 හැම කල් සත්රුවන් රැස්කරණ සිඳුර ද
සුවිසල් මෙගම රන්මිණි ගැණුමට පැහැ ද
එකතුල් රළ අතින් තද පහර දී සෙ ද
කඳු සෙල් දියකරණ රඟ බලව අනුබ ද

46 හැමකල්, සදාකාලයෙහි; සත්රුවන්, සප්තවිධරත්නය; රැස්කරණ, රාශිභූතකරන්නාවූ; සිඳුරද, සමුද්‍රරාජතෙම; සුවිසල්, අතිවිශාලවූ; මෙගම, මේ ග්‍රාමයෙහි; රන් මිණි, සුවර්ණ මාණික්‍යයන්; ගැණුමට, ගැණීමපිණිස; පැහැද, ප්‍රසන්නව; එකතුල්, එකාකාරව; රළඅතින්, තරඞ්ග නමැති හස්තයෙන්; තදපහර, ගාඪබද්ධ ප්‍රහාරය; සෙද, සීඝ්‍රව; දී, දානයකොට; අනුබද, නිරන්තරයෙන්; කඳු සෙල් දියකරණ රඟ, මැටිකඳු හා පර්වත දියකරණ ආකාරය; බලව, නිරීක්ෂණය කරව.

47 යන සඳ බලබලා සිඳු සිරි වෙරළනී
සුරරද කිරුළ වන් මහසැය ඉදුරෙනි
දුටු සඳ හැරීගොස් මංසලට සපැමි ණී
සකි සඳ බලන් බත්මූළුගල ගිජිඳු වැ නී

47 සිඳුසිරි, සමුද්‍රයාගේ ශ්‍රිය; බලබලා, අවලොකනය කරමින්; වෙරළතිනි, වෙලාන්තයෙන්; යනසඳ, ප්‍රයාතයකරණ කාලයෙහි; සුරරද, ශක්‍රයාගේ; කිරුළවන්, කිරීටාකාරවූ; මහසැය, මහාචෛත්‍යය; ඉදුරෙනි, පූර්වදිශාවෙන්; දුටුසඳ, දර්ශනයකළකාලයෙහි; හැරී, ආවෘත්තව; ගොස්, ගමනයකොට; මංසලට, මාර්ගසන්ධියට; සපැමිණී, සම්ප්‍රාප්තව; ගිජිඳුවැනි, ගජේන්ද්‍රයෙක්වැනිවූ; බත්මූළුගල, එනම් පර්වතය; සකිසඳ, මිත්‍රොත්තමය; බලන්, නිරීක්ෂණයකරව.

48 යනඑන නොයෙක් දන මහමග ඉදුරුදෙ ස
ඉම්කොට නැතක් දන වැයමෙන් උතුරුදෙ ස
අරමට අරක් ලෙස කළ පවර දනරැ ස
බල මැන මදක් කල් සිට සකි නොව අල ස

48 නොයෙක්දන, අනෙක ජනයා; ඉදුරුදෙස, ඉන්ද්‍රදිශාවට; යනඑන, ගමනාගමනයකරන්නාවූ; මහමග, මහාමාර්ගයෙන්; උතුරුදෙස, උත්තරදිශාව; ඉමකොට, සීමාකොට; දනරැස, ජනසමූහයා; නැතක්, අප්‍රමාණවූ; දනවැයමෙන්, ධනව්‍යයෙන්; අරමට, ආරාමයට; අරක්ලෙස, ආරක්‍ෂාපරිද්දෙන්; කළ, කළාවූ; පවර, ප්‍රාකාරය; මදක්කල්, ස්වල්පකාලයක්; සිට, අවස්ථානයකොට; අලස නොව, අනාලස්‍යව; බලමැන, දර්ශනයකළහොත් මැනවි.

49

එ ම මහ අරමදිපතිවවිසූ පෙර කුළුණැතිසඳසරතෙරිඳුසු රු
න ම දිනුවස්වැඩිකලලකකිරුලෙව්සමන්කුළයසිරිපාතුඹු රු
එ ම පදසටහනගෙණැවිත්බත්මුළුගලමතකොටවූයෙන්සොඳු රු
හැ ම දන්ටම වැඳ පිදුමට එමගල සමනලකුළසිරිගත්මහ රු

49 පෙර, පූර්වයෙහි; එම මහඅරමදිපතිවවිසූ,එමමහාආරාමයෙහි අධිපතිව වාසයකළාවූ; කුළුණැති, කරුණාවන්තවූ; සුරු, සූරවූ; සඳසරතෙරිඳු, චන්‍ද්‍රසාරස්ථවිරොත්තමයන්වහන්සේ; ලකකිරුලෙ ව්, ලඞ්කාකිරීටායමානවූ; සමන්කුළය, සමන්තකූටයෙහි; සිරිපාත ඹුරු, ශ්‍රීපාද පද්මය; නමදිනුවස්, නමස්කාර කරණුපිණිස;වැඩිකල, ගමනයකළ කාලයෙහි; සොඳුරු, සුන්දරවූ; එම පදසටහන, එම පා ද ලාඤ්ඡනය; ගෙණ, ග්‍රහණයකොට; ඇවිත්, ආගමනයකොට; බත්මුළුගලමත, එනම් ශෛලමස්තකයෙහි; කොටවූයෙන්, අඞ්කිත කරවූහෙයින්; එමගල, එම පාෂාණය; සැමදනට ම, සකලසජ්ජන යාගේම;වැඳපිදුමට,වන්‍දනමානනයපිණිස;මහරු,මහාර්ඝවූ; සමනල කුළසිරි, සමන්තකූටශ්‍රිය; ගත්, ග්‍රහණයකෙළේය.

50

සුග ත සසුන දද විනයැදුරුදම් ලකර බිදන් නායක යති ඳු
නිය ත මරුගෙ මුවපත්සඳ දූවිමලගත අලුගෙණ ඩක් සැරුගිජ්ඳු
පිට තතබාවැලිතොටසොහොනේසිටපෙළහරකින්ගෙණැවිත්පසිඳු
අන ත පිදුම්කොට නිදන්කෙළෙන්එම බත්මූළුගලමතුවැනිගිජ්ඳු

50 සුගතසසුනදද විනය ඇදුරු දම් ලකර බිදන්නායක යතිඳු, සුගතසාසනධජ විනයාචරිය ධම්මාලඞ්කාර නම් යතීන්‍ද්‍රයන්වහන් සේ; නියත. නියතව; මරුගෙ, මාරයාගේ; මුවපත්සඳ, මුඛප්‍රාප්තවූ කල්හි; දූවි, ඝාපනයකළාවූ; මලගත, මෘතශරීරයාගේ; අලු අඬක්, භස්මඛණ්ඩයක්; ගෙණ,ග්‍රහණයකොට;සැරු,සජ්ජිතකළාවූ;ගිජ්ඳුපිටත, ගජේන්ද්‍රයෙකු මස්තකයෙහි; තබා, ස්ථාපනයකොට; වැලිතොට සොහොනේසිට, එනම් සුසානභූමියෙහි සිටලා; පසිඳු, ප්‍රසිඬවූ; පෙ ළහරකින්, ප්‍රාතිහාර්‍ය්‍යකින්; ගෙණ, ග්‍රහණයකොට; ඇවිත්, ආග මනයකොට; අනත, අප්‍රමානව; පිදුම්කොට, පූජකොට; එම බත්මූ ළුගලමතු, එනම් පාෂාණමස්තකයෙහි; නිදන්කෙළෙන්, නිධානකළ හෙයින්; ඒ ගිජ්ඳුවැනි, ගජේන්ද්‍රයාවැනිවිය.

51 එතතින් ගොසිස්බක් ඉඳුරට හැරි වම ට
සුසැදුන් කළ අරම් දොරටුව ඉදිරිපි ට
ඉඳිමින් විඩාහැර නැග තෙරළුතුරක ට
බලමින් මුනි පුදට යනෙනා දන සතු ට

51 එතතින්, ඒ (බත්මුළුගල පිහිටි) ස්ථානයෙන්; ඉස්බක්, උස්සප්‍රමාණයක්; ඉඳුරට, ඉශාන්‍යදිශාවට; ගොස්, ගමනයකොට; වමට, වාමපාර්ශ්වයට, හැරී, ආවෘතව; සුසැදුම්කළ, සුසජ්ජිතකළාවූ; අරම් දොරටුව ඉදිරිපිට, (ඒ) ආරාමවාරය අභිමුඛයෙහි; තෙරළුතුරකට, නාළිකෙර වෘක්ෂයකට; නැග, ආරූඪව; ඉඳිමින්, නිසීදනයකොට; විඩාහැර, විඩාපහකොට; මුනිපුදට, බුද්ධපූජාවපිණිස; යනෙනා, ගමනාගමනය කරන්නාවූ; දන, ජනයා; සතුට, සන්තොෂයෙන්; බලමින්, නිරීක්ෂණයකරමින්.

52 බඳුව මහ ලකල් සුරපුර පහ සඹ ර
සැදුව පහ නිමල් වට කර මහ පව් ර
මුදුව යහ තෙපුල් නද කර සුහ දව ර
වදුව මහ මඟුල් සමුදුර මහ වෙහෙ ර

52 සුරපුර, දිව්‍ය පුරයෙහි; මහ, විශාලවූ; ලකල්, අලඞ්කෘතවූ; නිමල්, නිර්මලවූ; පහසඹර, ප්‍රාසාද සමූහයකට; බඳුව, සමානව; මහ පව්ර, මහාප්‍රාකාරයකින්; වටකර, ආවෘතකොට; සැදුව, සජ්ජිත කළාවූ; මහමඟුල් සමුදුර මහවෙහෙර, මහාමඞ්ගල සමුද්‍රාරාම මහා විහාරයට; සුහදවර, මිත්‍රොත්තමය; යහ තෙපුල්, යහපත් වචන; මුදුව, මෘදුව; නදකර, නාදකොට; (සාධුකාර ශබ්ද පවත්වා) වදුව, ප්‍රවෙශවෙව.

53 නිතොර තර සපිරි සිරි දුක අසිරි ත ර
පැතිර යා නොදෙනු සඳහා ලෝ ඇජ ර
ලකර මවාලූ කලඤ්වප් අයු ර
පතර තුඟු බලව එවෙහෙර බැඳි පව් ර

53 නිතොර, නිරන්තරයෙන්; තර, ඝනව; සපිරි, සම්පූර්ණවූ; අසිරිතර, අතිශයින් ආශ්චර්‍ය්‍යවූ; සිරි, ශ්‍රියාව; දුක, දර්ශනයකොට; පැතිර, ප්‍රසාරිව; යා නොදෙනු සඳහා, යා නොදීමපිණිස; ලෝ ඇජර, මහාබ්‍රහ්මයා; මවාලූ, නිර්මිතකොට ලූවාවූ; ලකර, අලඞ්කෘතවූ; කලඤ්වප් අයුර, කලධෞතප්‍රාකාරයක් බඳුවූ; එවෙහෙර, ඒවිහාර යෙහි; බැඳි, බන්ධනය කරණලද්දාවූ; තුඟු, උත්තුඞ්ගවූ; පතර, මහත්වූ; පව්ර, ප්‍රාකාරය; බලව, අවලොකනයකරව.

54 ඉ න් බැස දෙරටුවෙන් පෙරදිග නුදුරුව න
ම න් ලෙස පැමිණි දන මල් අෑවනකර න
පැ න් කොපුවෙන් රැගෙණ කර නමුව දෑව න
ය න් මහමලුව සැරසිලි සැම බලාගෙ න

54 ඉන්,ඒබහිබාරයෙන්;බැස,අවතීර්ණව;පෙරදිග දෙරටුවෙන්; පූර්වදිශාවෙහිවූ බාරයෙන්;නුදුරුවන,සමීපවූ; පැමිණි,(ඒවිහාරයට) සම්ප්‍රාප්තවූ; දන, ජනයා; මන්ලෙස, සිත්වූපරිද්දෙන්; මල්අෑවන කරණ,පුෂ්පධොවනයකරන්නාවූ;කොපුවෙන්, කූපයෙන්(ලිඳෙන්); පැන්රැගෙණ,ජලග්‍රහණයකොට;නමුවදෝව නකර,නාගේමූබධොව නයකොට; මහමලුව, මහාමාලකයෙහි; සැම සැරසිලි, සියලු අලඞ්කාරයන්; බලාගෙණ, නිරීක්‍ෂණයකරමින්; යන්, ප්‍රයානයකරන්.

55 ස ව ණ පුදට වන් දෙව් නාරදෙකු මෙ න
ප හ න පෙණ පහන් සිළුකටමිණ තෙවු න
තොරණ හමු නිසෙනිමුල අප පිය විසි න
ප හ ණ මුවා දිවිටැඹ කරවූ බල න

55 සවණ, සර්පයන්වහන්සේට; පුදට, පූජාකිරීමපිණිස; වන්, ප්‍රවිෂ්ටවූ; පහණපෙන, ප්‍රදීපනමැතිඵෙණයෙන්ද; සිළුකටමිණ,සිඛානමැති කණ්ඨමාණික්‍යයෙන්ද; තෙවුන, විරාජමානවූ; නාරදෙකු මෙන,නාගරාජයෙක්වැනිවූ;තොරණ,බහිබාරය; හමු,සමීපයෙහි;නිසෙනිමුල,නිසෙසණිමූලයෙහි; අපපියවිසින, අපගේපියාණන්විසින්; කරවූ, කරවනලද්දාවූ; පහණමුවාදිවිටැඹ, ශෛලමයප්‍රදීපස්ථම්භය; බලන, නිරීක්‍ෂණයකරව.

56 ස ව් සිරිපිරි දුටුදන මනනද ක ර ණ
දෙව් රද අණින් විස්කම් දෙව් බැස දෙ ර ණ
දෙව් ලොව තොරන් මෙන් එහි පිළිමිණි තො ර ණ
මැ ව් විලසට දිස බල සකි ගුණ ද ර ණ

56 සව්සිරිපිරි, සකලශ්‍රීයෙන් පිරුණාවූ; දුටුදන, දර්ශනයකළ ජනයාගේ; මනනදකරණ, චිත්තසන්තුෂ්ටිය කරන්නාවූ; දෙව්රද, ශක්‍රයාගේ; අණින්, ආඥවෙන්; විස්කම්දෙව්, විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින්; දෙරණ, ධරණීයට; බැස, අවතිර්ණව; දෙව්ලොවතොරන් මෙන්, දිව්‍යලොකයෙහි තොරණයන් මෙන්; මැව්වලසට, නිර්මිතකළ ආකාරයට; එහි, ඒ විහාරයෙහි;දිසි, දෘශ්‍යමානවූ;පිළිමිණිතොරණ, ස්ඵටිකමාණික්‍ය ප්‍රාකාරය; ගුණදරණ, ගුණදරන්නාවූ; සකි, මිත්‍රය; බල, අවලොකනයකරව.

57 සු දු බුදුරැස් සැලඹක් පැතිර වෙහෙරි නී
රැ දු නෙව් එහි වට සිව් තුරුවැද යෙහෙ නි
සැදු මොනවට සුණුකම් කොට තර ලෙසි නී
කුදු පවුරද බබලයි මලුවෙහි තිනි නි

57 සුදු බුදුරැස් කලඹක්, ශ්වෙත බුද්ධරශ්මි කදම්බයක්; වෙහෙරිනි, බුද්ධනිවාසයෙන්; පැතිර, ව්‍යාප්තව; එහි, ඒ විහාරයෙහි; යෙහෙනි, යහපත් ආකාරයෙන්; සිව්, සතරවූ; තුරු, වෘක්ෂයන්ගේ; අවට, හාත්පස්හි; වැද, ඝට්ටනයව; රැදුනෙව්, රඤ්ජිතවූවාක් වැනිවූ; සුණුකම්කොට, සුධාකර්මයකොට; තරලෙසිනි, ස්ථිර ආකාරයෙන්; මොනවට, යහපත් කොට; සැදු, සජ්ජිතකළාවූ; මලුවෙහි, මාලයෙහිවූ; කුදුපවුරද, ක්ෂුද්‍රප්‍රාකාරයද; තිනිනී, නිරන්තරයෙන්; බබලයි, භ්‍රාජිතවෙයි.

58 මෙන් ඬකසිටුතුමා අපරාජිත කා ල
පි න් පලතකා කරවූ කුංජර සා ල
මෙන් දිසි එහි ගඳකිළි හමු සුවිසා ල
ම න් තොස තරඹ දෙමහල් කුංජර සා ල

58 මෙන්ඬකසිටුතුමා, මෙණ්ඩක සෙට්ඨි උත්තමයා විසින්; අපරාජිතකාල, අපරාජිතව උපන්කාලයෙහි; පින්පල, පුණ්‍යඵලය; තකා, තර්කනයකොට; කරවූ, කරවනලද්දාවූ; කුංජර සාලමෙන්, කුංජරශාලාව බඳුවූ; එහි, ඒ විහාරයෙහි; ගඳකිළිහමු, ගන්ධකුටිකා සම්මුඛයෙහි; දිසි, දෘශ්‍යමානවූ; සුසාල, ඉතා විශාලවූ; දෙමහල්කුංජරසාල, ද්විභූමක කුංජරශාලාව; මන්තොස, චිත්තසන්තොෂයෙන්; බල, නිරීක්ෂණයකරව.

59 ර න් ගිරිමුදුනැ සිළුමිණි සෑය පුරඳ රා
පෙ න් වන පිණිස නරනට එහි මැවූ පු රා
ප න් සාළිස් රියන් උස මහ සෑය ව රා
ම න් කලබල ගඳකිළි වරුණැ නෙත්පු රා

59 රන්ගිර, ස්වර්ණමේරු පර්වතරාජයාගේ; මුදුනැ, මස්තකයෙහි (පිහිටි); සිළුමිණිසෑය, සිඛාමාණික්‍යචෛත්‍යය; නරනට, මනුෂ්‍යයන්ට; පෙන්වනපිණිස, දක්වනුසඳහා; එහි, ඒවිහාරස්ථානයෙහි; පුරඳරා, ශක්‍රයාවිසින්; මැවූපුරා, මාපිතාකාරවූ; ගඳකිළි, ගන්ධකුටිකාවෙන්, වරුණැ, පශ්චිම දිශාවෙහිවූ; පන්සාළිස් රියන් උස, පංචචත්වාළිසප්‍රමාණ උස්වූ; වරා, උතුම්වූ; මනකල, මනඃකල්‍යවූ; මහසෑය, මහාචෛත්‍යය; නෙත්පුරා, නෙත්‍ර පූරණයකොට; බල, අවලොකනය කරව.

60. සි තු මි ණි සත එසැ රන්වන් කො තේ යා
පි ළි මි ණි අඳුරු දුරලන සැම අ තේ යා
ද කි මි ණි තොප අරමුණුවුව දෙනෙ තේ යා
නු බ මි ණි වැද කඩක් රැඳුනසි සි තේ යා

60. සත, සත්ත්වයන්ට; සිතුමිණි, චින්තාමාණික්‍යයක්වූ; එසැ, ඒ (මහා) චෛත්‍යයාගේ; සැමඅතේයා, සියලුදිශාවන්හි; අඳුරු දුරලන, අන්ධකාරය දුරීභූතකරන්නාවූ; පිළිමිණි, ස්ඵටිකමාණික්‍යයෙන් යුක්තවූ; රන්වන්, සුවර්ණවර්ණවූ; කොතේයා, ශෘඞ්ගය; තොප, යුෂ්මතුන්ගේ, දෙනෙතේයා, නෙත්‍රවයෙන්; දකිමින්, දර්ශනයකොට; අරමුණුවුව, ආරම්මණ වුවහොත් (කල්පනාවට ගත හොත්); නුබමිණි, නභොමණිහු (සූර්‍ය්‍යයා); වැද, (චෛත්‍යමස්තකයෙහි) ඝට්ටනයව; කඩක්, (ඒ සූර්‍ය්‍යමණ්ඩලයෙන්) අංශක්; රැඳුනසි, රඤ්ජිතවූයේයසි; සිතේයා, චින්තනයවෙසි.

61. ම හ මිණිටැඹ අවරදිග පිහිටි තොරණ ට
ම හ බඹවුත් සිටිනවැනි සිරිගණ පුද ට
ම හ මිණ එහි ගසනකල මුනිඳු ගුණ තු ට
ම හ බඹ සිට වණනවැනි අටඟ සරකො ට

61. තොරණට, බහිද්වාරයට; අවරදිග, අපරදිශාවෙහි; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; මහමිණිටැඹ, මහා ඝණ්ටාස්තම්භය කෙසේදයත්?— මහ බඹ, මහාබ්‍රහ්මයා; සිරිගණපුදට, බුද්ධපූජාව පිණිස; අවුත්, ආගමනයකොට; සිටිනවැනි, අවස්ථානය කරන්නාක් වැන්න; එහි, ඒ මහා ඝණ්ටාස්තම්භයෙහි; මහමිණ, මහාඝණ්ටාව; ගසනකල, ප්‍රහාරදනයකරණ කාලයෙහි; මහබඹ, මහා බ්‍රහ්මයා; සිට, අවස්ථානය කොට; මුනිඳුගුණ, මුනීන්ද්‍රයන්වහන්සේගේ ගුණය; තුට, සන්තොෂයෙන්; අටඟසරකොට, අෂ්ටාඞ්ගස්වරයකොට; වණනවැනි, වර්ණනාකරන්නාක් වැන්න.

62. එවෙහෙර මලුව දාගැප් ගඳකිළි අව ට
ම න හ ර සෙල් පහන් ටැම් දිසි එකලෙස ට
නි ර තු ර පහන් සුදනන් රැගෙණ හිසපි ට
ම මි තු ර සිටිනවැනි පුදනුව තෙරුවන ට

62. එවෙහෙර මලුව, ඒ විහාරාඞ්ගනයෙහි; දාගැප්ගඳකිළි, ධාතුගර්භ ගන්ධකුටිකාවන්ගේ; අවට, හාත්පස්හි; එකලෙසට, එකාකාරයෙන්; දිසි, දෘශ්‍යමානවූ; මනහර, මනොහරවූ; සෙල් පහන්ටැම්,

ශෛලමය ප්‍රදීපස්ථම්භා කෙසේදයත්?– මිතුර, මාගේ මිත්‍රය; සුද නන්, සජ්ජනයන්; නිරතුරු, නිරන්තරයෙන්; පහන්, ප්‍රදීපයන්; හිසපිට, ශිම්මස්තකයට; රැගෙණ, ග්‍රහණයකොට; තෙරුවනට, රත්නත්‍රයට; පුදනුව, පූජාකරණු පිණිස; සිටිනවැනි, අවස්ථානය කරන්නාක් වැන්න.

63. තොසේ සිතින් අප මුනිගුණ මෙනෙහි කො ට
මෙ සේ අනෙක විසිතුරු නිරඹනා වි ට
ඇ සේ ලත් පලය සකි මෙම අත්බව ට
ය සේ ලෙස ලැබුනබැව් වැටහේය ත ට

63. අප මුනි, අපගේ සර්වඥයන්වහන්සේගේ; ගුණ, ගුණයන්; තොසේ සිතින්, සන්තොෂ චිත්තයෙන්; මෙනෙහිකොට, අනුස්මරණයකොට; මෙසේ, මෙයාකාරයෙන්; අනෙක විසිතුරු, අනෙක විචිත්‍රයන්; නිරඹනාවිට; නිරීක්ෂණය කරණකාලයෙහි; මෙම අත්බවට, මෙම ආත්මභාවයට; ඇසේ, නෙත්‍රය; ලත්පලය. ලැබුනු ප්‍රයොජනය; යසේලෙසලැබුනබැව්, යහපත් ආකාරයෙන්ලැබුනබව; සකි, මිත්‍රය; තට, යුෂ්මත්හට; වැටහේය, කල්පනාවේ.

64. ස ගු න් වෙතින් පන්සිල් පළමුකොට ගෙ ණ
සොඳි න් සියලු වත් පිළිවෙත් කොට එත ණ
පැති න් සුවඳමල් දෝවනකර බැති ණ
පු ද න් තෙසැයට සකි පතමින් නිව ණ

64. පළමුකොට,ප්‍රථමකොට; සඟුන්වෙතින්,සංඝයාසමීපයෙන්; පන්සිල්, පචශිලය; ගෙණ, ග්‍රහණයකොට; එතන, ඒස්ථානයෙහි; සියලුවත් පිළිවෙත්, සැමවත්හා පිළිවෙත්; සොඳින්, සුන්දරාකාරයෙන්;කොට, කොටනිමවා; සුවඳපැනින්, සුගන්ධ ජලයෙන්; මල්, පුෂ්පයන්; දෝවනකර,ධෝවනයකොට; සකි, මිත්‍රය; නිවණ, නිර්වාණය; පතමින්, ප්‍රාර්ථනාකරමින්; තෙසැයට, ත්‍රිවිධ චෛත්‍යයට; බැතින, භක්තියෙන්; පුදන්,පූජාකරන්.

65. සිහිනොට තෙරුවන් ගුණ මහිම නොමඳි න
ස ත හ ට නිවන් සගසැප ගෙණදෙන නිති න
සැය ව ට තෙවරක් පැදකුණුකොට සොඳි න
හි ද අ ට නැනක සකිසඳ වඳිනු පසගි න

65. සතහට, සත්වයාට; නිවන්සගසැප, ස්වර්ගමොක්ෂසම්පත්තිය; නිත්‍ත, නිරන්තරයෙන්; ගෙණදෙන,ගෙණදෙන්නාවූ; තෙරුවන්, රත්නත්‍රයෙහි; ගුණමහිම, ගුණ මහිමය; නොමඳින, බොහෝ සෙයින්; සිහිකොට, ස්මරණයකොට;සැයවට,චෛත්‍යය හාත්පස; තෙවරක්, වාරත්‍රයක්; සොඳින, සුන්දරාකාරයෙන්; පැදකුණුකොට, ප්‍රදක්ෂිණාකොට; අටතැනක, අෂ්ටස්ථානයක; හිඳ,නිසිදනයකොට; සකිසඳ, සබිඳුය; පසගින, පඤ්චාඞ්ගයෙන්; වඳිනු, නමස්කාරකරව.

66. එතතින පෙර   දිගට ගොස් මදක් ඇඹ   ර ය
පද වි ති හ ර   අනුසස් සිහිකර ක   ර ය
සිතතොසකර   වැද මහ ගඳකිළි තු   ර ය
පැමිණඅ න ර   ගැබ නොතරව ගරුක   ර ය

66. එතතින, ඒ ස්ථානයෙන්; මදක් ඇඹරය; ස්වල්පයක් ආවර්තව; පෙරදිගට, පූර්වදිශාවට; ගොස්, ගමනයකොට; පදවිතිහරඅනුසස්, පදවීතිහාරානිසංසය; සිහිකරකරය, අනුස්මරණය කරමින්; සිතතොසකර, චිත්තප්‍රීතිකොට; මහ ගඳකිළිතුරය, මහා ගන්ධකුටිකාභ්‍යන්තරයට; වැද, ප්‍රවෙශව; අතරගැබ, අභ්‍යන්තර ගර්භයට; නොතරව, සීඝ්‍රව; පැමිණ, සම්ප්‍රාප්තව; ගරුකරය, ගෞරවකොට.

67. පෙර   මොහොතෙහි පැසුලුයම එවිඩා දුර   ලා
ව ර   දම් රස විඳවිඳ දම් සිහිකර   ලා
පෙර   බිතු බඳ සක්මන් කරණ රහ පැ   ලා
ම ර   රුපු එමුනි රූ වඳු දූක නෙත්පුර   ලා

67. පැසුලුයම, පශ්චාත්යාමයෙහිවූ; පෙර මොහොතෙහි, ප්‍රථම මුහුර්තයෙහි; එවිඩා, (දෙවියන්ට ධර්මදෙශනා කිරීම් ආදියෙන්වූ) ඒ ශ්‍රාන්තය; දුරලා, දුරීභූතකොට; දම්, ධර්මය; සිහිකරලා, අනුස්මරණයකොට; වරදම්රස, උත්තම ධර්මරසය; විඳවිඳ,විඳිනයකරමින්; සක්මන්කරණ රහ, චඞ්ක්‍රමනාකාරය; පැලා, දක්වා; පෙරබිතු, පූර්වදිශාවෙහිවූ භිත්තියෙහි; බඳ, බන්ධනයකරණලද; මරරුපු, මාරශත්‍රුවූ; එමුනිරූ, ඒසර්වඥරූපය; නෙත්පුරලා, නෙත්‍රපුරණයකොට; දූක, දර්ශනයකොට; වඳු, නමස්කාරකරව.

68. පැ සු මි   යම දෙවෙනි මොහොතෙහි ගඳකි   ළී ය
ගොයුම්   ගොත් මුනිඳු සැතපෙන රහ දි   ලි ය
හැ ගුම්   කරණ ඔත් පිළිරුව මතක   ලි ය
සැ දු මි   කල උතුරු බිතු සකි වඳු නි   ළි ය

68. පැසුම්යම, පශ්චිම යාමයෙහි; දෙවෙනිමොහොතෙහි; ද්විතීය මුහුර්තයෙහි; ගොයුම්ගොත්, ගෞතම ගොත්‍ර ඇත්තාවූ; මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේ; ගඳකිළිය, ගන්ධකුටිකාවෙහි; සැතපෙන රඟ, සැතපෙන්නාවූ ආකාරය; හැඟුම්කරණ, සංඥාපනය කරන්නාවූ; උතුරුබිතු, උත්තර භිත්තියෙහි; සැදුම්කළ, සජ්ජිතකළාවූ; මනකලිය, මනඃකල්‍යවූ; දිලිය, ජ්වලිතවූ; ඔත් පිළිරුව, සැතපෙන ප්‍රතිමා ස්වාමීන්වහන්සේ; සකි, මිත්‍රය; තිළිය, සන්තොෂයෙන්; වඳු, නමස්කාරකර.

| | | |
|---|---|---|
| 69. එම | යම තෙවෙනි මොහොතෙහි පලසමවති | න |
| සම | තැස් මුනිඳු ගඳකිළිතුල වැඩහිඳී | න |
| එම | රඟ හඟවන පැළදිග බිතු රඳ | න |
| නම | කරවැඩ හිඳින මහ පිළිම හිමිඳු | න |

69. එමයම, එම (පශ්චිම) යාමයෙහි; තෙවෙනි මොහොතෙහි, තෘතිය මුහුර්තයෙහි; සමතැස් මුනිඳු, සමන්තාක්ෂිවූ සර්වඥයන්වහන්සේ; පලසමවතින, ඵලසමාපත්තියෙන් යුක්තව; ගඳකිළිතුල, ගන්ධකුටිකාභ්‍යන්තරයෙහි; වැඩහිඳින එමරඟ, වැඩඉන්නාවූ එමආකාරය; හඟවන, සංඥාපනයකරන්නාවූ; පැළදිග බිතු, පශ්චිම දිශාභිත්තියෙහි; රඳන, බබලන්නාවූ; වැඩහිඳින මහපිළිව හිමිඳුන, වැඩහිඳින මහාප්‍රතිමා ස්වාමීන්වහන්සේ; නමකර, නමස්කාරකර.

| | | |
|---|---|---|
| 70. නැගිට | මහ කුළුණු සමවතිනි අලු | යම |
| ලොවට | අප මුනිඳුසෙත් දෙනමෙන එ | යම |
| රඟට | සිරි සුසැදි ගඳකිළිය සිතු | යම |
| සතුට | සිරි පිළිමහිමි වඳුව බිතු | යම |

70. අපමුනිඳු, අපගේමුනීන්ද්‍රයන්වහන්සේ; ලොවට, ලොකයට; සෙත් දෙනමෙන, ශාන්තිදානය කරණ විධානයෙන්; එයම, ඒ පශ්චිම යාමයෙහි; අලුයම, ප්‍රත්‍යූෂකාලයෙහි; මහකුළුණු සමවතිනි, මහාකරුණා සමාපත්තියෙන්; නැගිට, උත්ථිතව; සිරිරඟට, සපිත්‍යාකාරයට; සිතුයම, චිත්‍රකර්මයෙන්; සුසැදි, සුසජ්ජිතකළාවූ; ගඳකිළිය, ගන්ධකුටිකාවෙහි; යමබිතු, දක්ෂිණ භිත්තියෙහි; සිරි පිළිම හිමි, වැඩසිටි ප්‍රතිමාස්වාමීන්වහන්සේ; සතුට, සන්තොෂයෙන්; වඳුව, නමස්කාරකරව.

71. ස පු රණ කොට සමතිස් පෙරුමන් මහ රු
වි හ රණ තුසිතයෙන් යම බිතු බඳ සොඳු රු
වි ව රණ සිරි ලබනට විත් සිටිනයු රු
එ ව රණ මෙත් බෝසත් පිළිම වඳු ග රු

71. මහරු, මහාවූ; සමතිස් පෙරුමන්,සමත්‍රිංශත් පාරමිධර්මයන්; සපුරණකොට, සම්පූර්ණකොට; විහරණ, වාසයකරන්නාවූ; තුසිතයෙන්, තුෂිත දිව්‍යලොකයෙන්; විවරණසිරි ලබනට, ව්‍යාකරණ ශ්‍රී ලැබීමපිණිස; ඇවිත්, ආගමනයකොට; සිටිනයුරු, සිටින ආකාරයට; සොඳුරු, සුන්දරවූ; යමබිතු, දක්ෂිණදිශාවෙහිවූ භිත්තියෙහි; බඳ, බන්ධනය කරණලද; ගරු, ගරුවූ; එවරණමෙත්බෝසත් පිළිම, ඒ උත්තම මෛත්‍රෙය බොධිසත්වයන්වහන්සේගේ ප්‍රතිමාව; වඳු, නමස්කාරකරව.

72. සිරි ගන සසුන් යුහු කිස විත නැග දිමු ත
සිරි ගන පුදට මදවී දෙඅත සිවි අ ත
සිරි සර ලෙස මැවුමෙන් බඳ දකුණු බි ත
සිරි පති පිළිම රුව දක පින්දෙව මිතු ත

72. මිතුත, මාගේ මිත්‍රය; සිරිගන සසුන්, ශ්‍රීඝන ශාසනයාගේ; යුහුකිස, සිඝ්‍රකෘත්‍ය සඳහා; දිමුත, දීප්තිමත්වූ; විත, ගරුඩ වාහනයට; නැග, ආරූඪව; සිරිගනපුදට, ශ්‍රීඝන පූජාව පිණිස; දෙඅත, හස්තවන්දය; මදවී, මන්දව; සිව්අත, හස්ත චතුෂ්ටයක්; සිරිසර ලෙස, ශ්‍රීසාරාකාරයෙන්; දකුණුබිත, දක්ෂිණභිත්තියෙහි;මැවුමෙන්, නිර්මිතකලාක්වැනිවූ; බඳ, බන්ධනය කරණලද්දවූ; සිරිපති පිළිමරුව, ශ්‍රීපති (විෂ්ණු) ප්‍රතිමාවද; දක, දර්ශනයකොට; පින්දෙව, ප්‍රාප්තිදනයකර.

73. වැ ඳ පු දා බවා මෙත් පිටුනොපා මෙ සේ
නා ද හ දා අතුරු ගැබිනවුදින් නොල සේ
ඉ ඳ ම දා එගැබ ඉදිරිය ගැබ සක සේ
සොඳ කා දා කුමර සිරි ඇ දකු සිත සේ

73. මෙසේ, උක්තප්‍රකාරයෙන්; වැඳපුදා, වන්දනමානන කොට; මෙත් බවා, මෛත්‍රී භාවනාකොට;පිටුනොපා, (ප්‍රතිමාරූපයන් දෙසට) පෘෂ්ඨය නොදක්වා; නදහදා, නන්දනහෘදයෙන් යුක්තව; අතුරුගැබින්, අන්තර ගර්භයෙන්; අවුදින්, (පිටතට) ආගමනයකොට; ඒගැබ, ඒ අනන්තර ගර්භයට; ඉදිරිය ගැබ, අභිමුඛ ගර්භයෙහි; නොල

ෂේ, අනලස්ව; මඳ, මන්‍දකාලයක්; සකසේ, සකස්ව; ඉඳ, නිසිදන සකොට: සොඳ, සුන්‍දරවූ; කඳකුමරසිරි අෑ, ස්කන්‍ධකුමාරශ්‍රී ආදිය; ඝනසේ, සිත්මි පරිද්දෙන්; දකූ, දර්ශනයකරව.

74. න ර ඕනෙව් එසිරි දෙළසැස් මවා ගෙ ණ
කා ර දෙළසක් මුනි පුදනුව මවා ගෙ ණ
පෙර දිග මුහුණලා සිටි සිකි අරා ගෙ ණ
ස ර යොන් පිළිරුවද දකූ සිතු නිවා ගෙ ණ

74. එසිරි, ඒ (විහාර)ශ්‍රිය; නරඹනඑව්, නිරීක්‍ෂණයකරණමෙන්; දෙළසැස්, අක්‍ෂිවාදසයක්; මවාගෙණ, නිර්මිතකොටගෙණ; මුනි, සම්බුද්ධයන්වහන්සේට; පුදනුවඑව්, (අනෙක පූජාවස්තූන්) පුජාවට මෙන්; කරදෙළසක්, වාදශහස්තයක්; මවාගෙණ, නිර්මිතකොට ගෙණ; සිකිඅරාගෙණ, මයුරවාහනාරූඪව; පෙරදිග, පූර්වදිශාවට; මුහුණලා, මුඛයහෙලා; සිටි, අවස්ථිතවූ; සරයොන් පිළිරුවද, ස්කන්ධකුමාර ප්‍රතිමාවද; සිතු, චිත්තය; නිවාගෙණ, සංසිඳුවාගෙණ; දකූ, දර්ශනයකරව.

75. බඹලොව තොරන් පැරයූ උතුරු බිතුබ ද
මුවර තොරන් සහ දෙරපල් රූද සො ද
ඉදුරු දකුණු බිතු ඇඳි එසොළොස් තැන් ද
නරඹ උතුම් සිදුහත් කුමර උපත ද

75. උතුරු බිතු, උත්තරදිශාවෙහිවූ භිත්තියෙහි; බද, බන්ධනය කරණලද්දවූ; බඹලොව, බ්‍රහ්මලොකයෙහි; තොරන්, තොරණයන්; පැරයූ, පරාජයකළාවූ; මුවරතොරන්සහ, මකරතොරණහා; සොඳ, සුන්‍දරවූ; දෙරපල්රූද, වාරපාලරූපයන්ද; ඉදුරුදකුණුබිතු, පූර්ව දක්‍ෂිණ දිශාභිත්තීන්හි; ඇඳි, අඳිනලද්දවූ; එසොළොස්තැන්ද, ඒ සොළොස්මස්ථානද; උතුම්, උත්තමවූ; සිදුහත්කුමර උපතද, සිද්ධා ර්ථ කුමාරොත්පත්තියද; නරඹ, නිරීක්‍ෂණයකර.

76. නගොසි න් පෙර දෙරටුවෙන් එහි වටහල ට
බ ල මි න් දු සුර බඹලෝ නිරාව ට
සි ත මි න් පින් පව් පලදෙන රහ සත ට
තොලසි න් මිතුරු සඳ පැදකුණු කර තොසි ටි

76. එහි, ඒ ගර්භයෙහි; පෙරදෙරටුවෙන්, පූර්වදිශාවෙහිවූ දෙරටු වෙන්; වටහලට, අ වෘත ශලාවට; මිතුරුසඳ, මිත්‍රොත්තමය; න ගොසින්, නා ගමනයකොට; අවට, හාත්පස්හි; දුසුරබඹලෝ නිරා,

ජාතක දිව්‍යලොකබ්‍රහමලොක නරක යන මොවුන්;බලමින්,තිරීක්‍ෂ ණය කරමින්; සතට, සත්‍වයාට; පින්පව් පල, පුණ්‍යපාප ඵලයන්; දෙනරඟ, දෘෂ්‍යකරණ ආකාරය; සිතමින්, චින්තනයකරමින්; නොසිට, අවස්ථානය නොකොට; නොලසින්, අනාලස්‍යයෙන්; පැදකුණුකර, ප්‍රදක්‍ෂිණාකරව.

77. සූ වි සි මුනි දවස බුදුකුරු තුමා තු මා
සූ වි සි අත්බවෙහි පිද මිතු රමා ර මා
සූ වි සි විවරණ ලත් රඟ පෙමා පෙ මා
සූ වි සි මුනි පිළි මරු දිසි නමා න මා

77. බුදුකුරු තුමා, බුඩාඞකුරොත්තමතෙම; උතුමා සූවිසි මුනිදවස, උත්තාම චතුර්විංශත් බුඬකාලයෙහි; සූවිසි අත්බවෙහි, චතුර්විංශත් ආත්මභාවයෙහි; ඉපිද, ජනිතව; සූවිසිවිවරණ, චතුර්විංශත් ව්‍යාකරණය; ලත්, ලැබුවාවූ; රඟ, ආකාරය; දිසි, දක්වන්නාවූ; සූවිසිමුනි පිළිමරු, චතුර්විංශත් බුඩ ප්‍රතිමාරූපයන්; පෙමා පෙමා, අතිශය ප්‍රෙමයෙන්; නමා, අවනතව; නමා, නමස්කාර කරව.

78. සමන් බ දු රු දු ක මගපත් පළමු නො සේ
සමන් ඇදු රු ල ක කිරුලෙව් රැඳි වෙසෙ සේ
සමන් කපු රු නෙක පුදලබන තිසිලෙ සේ
සමන් පිළි රු දු ක පින් දෙනු සකි නොල සේ

78. සමන්බදුරු, සමන්තභද්‍රවූ සර්‍වඥයන්වහන්සේ; දූක, දර්‍ශනයකොට; පළමුමගපත්, ප්‍රථම මාර්ගප්‍රාප්තියෙන්; නොසේ, සන්තුෂ්ටවූ; ලකස්රුලෙව්, ලඞකාකිරීටායමානවූ; සමන් ඇදුරු, සමන්තකූටයෙහි; වෙසෙසේ, විශෙෂයෙන්; රුඳි, රඤ්ජිතවූ; සමන්, ජාතිසුමනය; කපුරු, කර්පූරය යනාදීවූ; නෙකපුද, අනෙක පූජාවන්; තිසිලෙසේ, යොග්‍යපරිද්දෙන්; ලබන, ලබන්නාවූ; සමන්පිළිරු, සුමනදෙවයාගේ ප්‍රතිමාරූපයන්;දූක, දර්‍ශනයකොට; සකි,මිත්‍රය; නොලසේ, අනාලස්‍යව; පින්දෙනු, ප්‍රාප්තිදානයකර.

79. සතර දිනූ දින සිට අරකට නිතො ර
සතර කඩු රැගෙණ සිටි අයුරු නොම හැ ර
සතර දෙර සිටින රැකවලට එවෙහෙ ර
සතර වරම් මහරජ රු බල මිතු ර

79. සතර, ශාස්තෘන්වහන්සේ; දිනූ දින සිට, ජනිතවු කාලයේ
පවත්; අරකට, ආරක්ෂාවපිණිස; සතරදෙර, චාරචතුෂ්කයෙහි;
සතරකඩු, ඛඞ්ගචතුෂ්කයක්; රුගෙණ, ග්‍රහණයකොට; නිතොර,
නිරන්තරයෙන්; සිව්අයුරු, සජිත්‍යාකාරය; නොමහැර, පහනො
කොට; එවෙහෙර, ඒ විහාරයෙහි; රුකවලට, ආරක්ෂාවරණයපිණි
ස; සිටින, අවස්ථානයකරන්නාවූ; සතරවරම් මහරජරු, සතරව
රම් මහරජදරුවන්ගේ රූපයන්; මිතුර, මිත්‍රය; බල, අවලොකනය
කරව.

80. බු දු  ම ගු ල්  දවසැ බඹ සුරඟණ අ  හ ස
පි දූ  එ ම ල්  විලස පෑ අනෙක සුව  හ ස
සැ දූ  ලක ල්  සිතිය මින් මල් වියන  හ ස
වි දු  ලිතු ල්  ගමන්යුත් සක් බල ස  හ ස

80. බුදුමගුල් දවසැ, බුද්ධමඞ්ගල්‍ය දිනයෙහි; බඹසුරගණ, බ්‍රහ්මා
මරසමූහයා; අහස, ආකාශයෙහි; පිදූ, පූජකළාවූ; අනෙකසුවහස,
අනෙකසහස්‍රගණන්; එමල්, ඒ පුෂ්පයන්ගේ; විලස, විලාසය; පෑ,
ප්‍රකාශකළාවූ; ලකල්, අලඞ්කෘතවූ; සිතියමින්, චිත්‍රකර්මයෙන්; සැදූ,
සජ්ජිතකළාවූ; මල්වියනහස, (ඒ විහාරයෙහි) උත්තම මාලාවිතා
නය; විදුලිතුල්, විද්‍යුල්ලතාවක් වැනිවූ; ගමන්යුත්, ගමනින් යුක්තා
වූ; සකි, මිත්‍රය; සහස, වහා, බල, අවලොකනයකරව.

81. රන්  කම්කළ දද කොඩි දන ළපිණව  න
රන්  රසු දූල් පවනින් මිහි රි නද දෙ  න
රන්  තිර සෙමර සේසත් තැන තැන තෙවු  න
රන්  රසවන් මඹිතුර නරඹ මනමෙ  න

81. දන, ජනයාගේ; ළපිණවන, හෘදය පිණනය වන්නාවූ; රන්
කම්කළ, ස්වර්ණකර්ම කළාවූ; දද කොඩි, ධ්වජ හා කෙතුද; පවනින්,
මාරුතයෙන්; මිහිරි නදදෙන, මධුර නාද දානයකරන්නාවූ; රන්
රසු දූල්, ස්වර්ණ කිංකිණික ජාලාවන්ද; තැනතැන, ස්ථානයක් පා
සා; තෙවුන, භ්‍රාජමානවූ; රන්තිර, ස්වර්ණමය ජවනිකාද; සෙමර,
චාමරද; සේසත්, ශ්වෙතච්ඡත්‍රද; රන්රසවන්, ස්වර්ණපාරදකාරවූ;
ඔඹිතුර, මාගේ මිත්‍රය; මනමෙන, සිත්වූ පරිද්දෙන්; නරඹ, නිරීක්ෂ
ණයකර.

82. මෙ සේ දෙනා වෙහෙරද පරයන විල සේ
වි සේ සයෙන් මෙවෙහෙර සිරිසර නොල සේ
ද සේ නොවන වණනට නනද නතුලෙ සේ
කෙ සේ මම වණම් එකමුවකින් නිදෙ සේ

82. මෙසේ, උක්තප්‍රකාරයෙන්; දෙනාවෙහෙරද, ජේතවන විහාරයද; පරයන විලසේ, ජයග්‍රහණයකරණ ආකාර ඇති; මෙවෙහෙර, මේ විහාරයෙහි; සිරිසර, ශ්‍රීසාරය; නතුලෙසේ, තත්‍ත්වාකාරයෙන්; විසේසයෙන්, විශෙෂවශයෙන්; නොලසේ, අනාලස්‍යව; වණනට, වර්ණනාකිරීමට; නනද, අනන්තනම් නාගරාජයාද; දසේ නොවන, දක්‍ෂනොවන කල්හි; මම, අසමත් ශබ්දවාචීතෙමේ; එකමුවකින්, එක්මුඛයකින්; නිදෙසේ, නිර්දෙෂව; කෙසේ, කවර ආකාරයකින්; වණම්, වර්ණනාකරම්ද?–

83. පමාතොව මෙහසු න
අගවණින් දිසි කුළුණැ ති
දෙනුවස් මමිතුරි ඳු
යව පෙරදෙරින් පිටන ට

83. මමිතුරිඳු, මාගේ මිත්‍රොත්තමය; කුළුණැති, කරුණාවන්ත් වූ; අගවණින්, (මේ ගීයෙහි) අනන්‍යවර්ණයන්ගෙන්; දිසි, දෘශ්‍යමානවන්නහුට; මෙහසුන, මේ සංදේශය; පමානොව, අප්‍රමාදව; දෙනුවස්, දීමපිණිස; පෙරදෙරින්, පූර්වදිශාඬාරයෙන්; පිටනට, බාහ්‍යයට; යව, ප්‍රයානයකරව.

84. ලොල් වන පින්කිරියට තලියක් මිහි කල්
දු ල් සුවිසල් ගෙණ හිස සිටිනෙව් හැම කල්
ම ල් දෙවනට පිරිසිදු පැන් තබන ල කල්
සෙ ල් පැන්තාලිය බල මමිතුර මන කල්

84. පින්කිරියට, පුණ්‍යක්‍රියාවට; ලොල්වන, ලොලවන්නාවූ; මිහිකල්, මහිකාන්තාතොමෝ; තලියක්, ථාලියක්; හිස, ශීර්ෂයට; ගෙණ, ග්‍රහණයකොට; හැමකල්, සදාකාලයෙහි; සිටිනඑව්, අවස්ථානයකරන්නාක්වැනිවූ; මල්දෙවනට, පුෂ්පධොවනයට; පිරිසිදු, පරිශුද්ධවූ; පැන්තබන, ජලය තබන්නාවූ; දුල්, ජ්වලිතවූ; සුවිසල්, අතිවිශාලවූ; ලකල්, අලඞ්කෘතවූ; සෙල් පැන්තාලිය, ශෛලමය පැන්තාලිය; මනකල්, මනඃකල්‍යවූ; මමිතුර, මාගේ මිත්‍රය; බල, අවලොකනයකරව.

85. වෙහෙර හ ණින් පිටවී පෙර දෙරටුවෙ න
වි ස ර වි සි න් මෙම රමැ දම් සිරිවඩ න
අ ද ර බැ ති න් කරවන දෙමහල් සොබ න
මි තු ර බ ල න් පොහොගේ වම්පස පෙණෙ න

85. වෙහෙරහණින්, විහාරාඞ්ගණයෙන්; පෙරදෙරටුවෙන, පූර්‍ව දිශාවාරයෙන්; පිටවී, බාහ්‍යව; මෙමරමැ, මෙමආරාමයෙහි; **දම්සිරි වඩනවිසරවිසින්, ධර්‍ම ශ්‍රීවර්‍ධන** සමිතිය විසින්; අදරබැතින්, ආදර භක්තියෙන්; කරවන, කරවන්නාවූ; දෙමහල්, විභූමකයකින්; සොබන, ශොභමානවූ; වම්පසැ, වාමපාශ්වයෙහි; පෙණෙන, දෘශ්‍ය මානවන්නාවූ; පොහොගේ, උපොසථාගාරය; මිතුර,මිත්‍රය; බලන්, නිරීක්‍ෂණයකරන්.

86. සැදුම් කළ විසල්ලෙස පෙරදෙසෙහි සො ද
ස දම් අසන දන රැස්වී මුනිඳු ස ද
එ ද මී හලය නරඹන සැමදන සබ ද
සු ද ම් සබාසලයයි නොම පවසා ද

86. සබඳ, මිත්‍රය; පෙරදෙසෙහි, පූර්‍වදිශාවෙහි; විසල්ලෙස, විශාලාකාරයෙන්; සැදුම්කළ, සජ්ජිතකළාවූ; දන, ජනයා; රැස්වී, රාශීභූතව; මුනිඳුසඳ, මුනීන්‍ද්‍රොත්තමයාගේ; සොඳ, සුන්‍දරවූ; සදම්, සද්ධර්‍මය; අසන,ශ්‍රවණයකරන්නාවූ; එදම්හලය, ඒධර්‍මශාලාව; නරඹන, නිරීක්‍ෂණයකරන්නාවූ; සැමදන, සකලජනයා; සුදම් සබාසලයයි, සුධර්‍මානම් සභාශාලාවයයි; නොමපවසාද, ප්‍රකාශනොකෙරේද?–

87. අ සා ඉ ඳ දහම් සිතු අදර බැතියෙ න
නො සා වැ ඳ ගෙණවසර දම්කතිඳු ගෙ න
බැ සා සෙද පහන මලුවට පඩිපෙළි න
දෙ සා න ද මියුරු සභවස් බලනුමැ න

87. දහම්, ධර්‍මය; සිතු අදර බැතියෙන, චිත්තාදර භක්තියෙන්; අසා, ශ්‍රවණයකොට; ඉඳ, නිසීදනයකොට; නොසා, සන්තොෂ යෙන්; වැඳ, නමස්කාරකොට; දම්කතිඳුගෙණ, ධර්‍මකථිකයාගෙන්; අවසරගෙණ, ඔකාශග්‍රහණයකොට; පඩිපෙළින, නිශ්‍රෙණිපඞ්ක්ති යෙන්; පහනමලුවට; අධොමාලයකට;සෙද,සීඝ්‍රව;බැසා,අවතීර්‍ණව; මියුරුනදදෙසා, මධුරනාද දෘනයකොට; සභවස්, සභාවාසයන්; බලනුමැන, අවලොකනය කළහොත් මැනවි.

88. පු න් වට දසරියන් සලපතරෙහි දි ලි ය
පු න් කුඹු සොළොස් ගන්නා ගල් පැන්සැ ලි ය
තු න් සිතු පැහැද අප දෙගුරුන් මනක ලි ය
දු න් පුදකර සඟනට තරඹන් ති ළි ය

88. පුන්වට, සම්පූර්ණවෘත්තය; දසරියන්, දශරතන ප්‍රමාණවූ; සලපතරෙහි, ශෛලමයපුවරුවක; දිලිය, ජ්වලිතවූ; අපදෙගුරුන්, අපගේ මව්පියන්විසින්; තුන්සිතු, ත්‍රිවිධචිත්තය; පැහැද, ප්‍රසන්න ව; මනකලිය, චිත්තසන්තොෂයෙන්; සඟනට, සඞ්ඝයාට; පුදකර, පූජාකොට; දුන්, දත්තයකළාවූ; පුන්කුඹුසොළොස්, (ජල) පූර්ණකුම්භ සොඩෂයක්; ගන්නා, ග්‍රහණයකරන්නාවූ; ගල්පැන්සැලිය, ශෛලමය ජලස්ථාලිය; තිළිය, සන්තොෂයෙන්; තරඹන්, නිරීක්ෂණය කරන්.

89. විමල් ගුණැති නා හිමිඳුට දම්ලක ර
විපුල් සියම් කම්බොජ බුරුම නරව ර
කිරුල් සන් තබා එවූ පුදපඬුරුක ර
එසල් තුල තරඹ පටසිවුරු පිරික ර

89. විමල් ගුණැති, (ශීලාදි) නිර්මල ගුණඇත්තාවූ; දම්ලකර නා හිමිඳුට, (සුගත සාසන ධජ විනයාචරිය යන සංඥානිය ගරු නා මොපලක්ෂිතවූ) ධම්මාලඞ්කාර නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේට; විපුල්, විශාලවූ; සියම් කම්බොජ බුරුම නරවර, සියම් කාම්බොජ බුරුම නරෙන්ද්‍රයන් විසින්; කිරුල්සන් තබා, කිරීට සංඥ ස්ථාපනය කොට; පුදපඬුරුකර, පූජාපණ්ණාකාර කොට; එවූ, ප්‍රෙරණය කළාවූ; එසල්තුල, ඒ ශාලාභ්‍යන්තරයෙහි; (විද්‍යමානවූ) පටසිවුරු පිරිකර, පට්ටචීවර හා පරිෂ්කාරයන්; තරඹ, නිරීක්ෂණයකරව.

90. වැඩි තැන් උවසු දෙදෙනෙකු සහ අප දෙගු රු
බැති යෙන් තෙරුවනට මොක්සැප පතා ග රු
තර යෙ න් කරවූ ගල් සුණුකම්හි සිරිස රු
ත ර ඹ න් අවස පෙරදිග මලුවෙ මම්තු රු

90. වැඩිතැන්, වෘද්ධස්ථාන ප්‍රාප්තවූ; උවසු දෙදෙනෙකුසහ, උපාසකයන්දෙදෙනෙකුසමග; අපදෙගුරු, අපගේමාතෘපිතෘන්විසින්; තෙරුවනට, රත්නත්‍රයට; බැතියෙන්, භක්තියෙන්; ගරු, ගරුවූ; මොක්සැප, මොක්ෂසෞඛ්‍යය; පතා, ප්‍රාර්ථනාකොට; මලුවේ, මාලකයෙහි;

පෙරදිග, පූර්වදිශාවෙහි; ගල්සුණුකමින්, පාෂාණසුධාකර්මයෙන්; තරයෙන්, ස්ථිරයෙන්; කරවූ, කරවනලද්දාවූ; සිරිසරු, ශ්‍රීසාරවූ; අවස, (සංඝා) වාසය; මමිතුරු, මාගේ මිත්‍රය; නරඹන්, නිරීක්ෂණය කරන්.

91. සංවර සිල් සියැ ස
මෙන් සුරකිනා හැමව ර
දිසි මෙපද අගව ණ
තෙරිඳු වදු මෙම අරම පල්

91. සංවරසිල්, සංවරශීලයන්; සිය ඇසමෙන්, ස්වකීයාක්ෂිය මෙන්; හැමවර, සදකාලයෙහි; සුරකිනා, මනාකොට ආරක්ෂාකරන්නාවූ; මෙපද, මේපදයන්ගේ; අගවණ, අනන්‍යවර්ණියන්ගෙන්; දිසි, දක්නාවූ; මෙම අරම පල්, මෙම ආරාමය ආරක්ෂාකරන්නාවූ; තෙරිඳු, ස්ථවිරොත්තමයන්වහන්සේ; වඳු, නමස්කාරකරව.

92. විනය ඇදුරු සොඳ පරපුරෙනි පැවතෙ න
විනය ගැඹුරු ප ද රුත් නැනිනි විසඳ න
විනය ඇසුරු පු දැ ලත් පෙමිනි සඟගෙ න
විනය ඇදුරු සු ද සුන් තෙරනිඳු වඳි න

92. සොඳ, සුන්දරවූ; විනයඇදුරු පරපුරෙනි, විනයාචාර්යපරම්පරාවෙන්; පැවතෙන, ප්‍රවෘත්තිතවූවන්නාවූ; විනය, විනයධර්මයෙහි; ගැඹුරුපද අරුත්, ගම්භීර පදාර්ථයන්; නැනිනි, ඥානයෙන්; විසඳන, විසඳන්නාවූ; විනය ඇසුරු, විනයාශ්‍රය හේතුකොටගෙණ; සඟගෙණ, සංඝයාගෙන්; පුදැ, (ගරුනාමාදි) පූජාවන්; පෙමිනි, ප්‍රේමයෙන්; ලත්, ලැබූවාවූ; විනය ඇදුරු සුදසුන් තෙරනිඳු, විනයාචාර්යසුදර්ශනස්ථවිරොත්තමයන්වහන්සේ; වඳින, නමස්කාරකරව.

93. දිනු සලාගම කුල – රන්දෙණ පියස මනහර
සඳ සර මහතෙරිඳුට සිසුව පැවි දිව
නිරතුර සිල්රැසින් හෙලිකළ මෙලක් දිව
දිරනඳ තෙරිඳු ගෙණ – තෙවළා ඉගෙණ මනමෙන
මෙසඳ පැමිණි සීමා සංකරය ගැ න
විසඳ විනයනය කළ හිමි නයදප න
සිරිසර සැමිසොඳ රදපස මුදලි ව ර
වැලිතර කරවූ කප්පින මුදලිඳු වෙහෙ ර
සිතයුර විසූ නායක හිමි දම්ලක ර
මමිතුර කලක් විසුබව දනු මෙම වෙහෙ ර

93. මනහර, මනොහරවූ; රත්දෙඹපියස, එනම් ප්‍රදෙශයෙහි; සලාගමකුල, ශාලාග්‍රාම ගොත්‍රයෙහි; දිනු, ජනිතවූ; **සඳසර** මහතෙරිඳුට, (රත්දෙඹේ මහාමඞ්ගල සමුද්‍රාරාමාධිපතිව විසූ දූවේ) **චන්ද සාර** මහාසථවිරයන්වහන්සේට; සිසුව, ශිෂ්‍යව; පැවිදිව, ප්‍රව්‍රජිතව; සිල්රුසින්, ශීලනමැති රශ්මියෙන්; මෙලක්දිව, මෙම ලඞ්කාවීපය; නිරතුරු, අතරක්නැතිව; හෙලිකළ, ආලොකකළාවූ; **දිරනඳ**තෙරිඳුගෙණ,(**සිරිසද්ධම්මවංසපාල ලංකාගොඩ**)**ධීරානන්ද** (නායක)සථවිරොත්තමයන් වහන්සේගෙන්; තෙවලා, ත්‍රිපිටකය; මනමෙන, සිත්වූපරිද්දෙන්; ඉගෙණ, උද්ග්‍රහණය කොට; මෙසඳ, මේකාලයෙහි; පැමිණී, පැමිණියාවූ; සීමා සංකරයගැණ, ගිමාසංකරය සඳහා; විනයනය, විනයක්‍රමයන්; විසඳ, විස්තාරකොට; හිම්නයදපන, සීමානය දර්පනය; කළ, කළාවූ; සිරිසර, සම්පත්තියෙන් සාරවූ; **සැම්සොන්රදපස** මුදලිවර,**සැම්සොන් ද ආබෲව් විජයගුණරත්නරාජපක්ෂ** රජවාසල මුදලිමනාත්‍රීශ්වරයන් වහන්සේ විසින්; වැලිතර, එනම් ග්‍රාමයෙහි; කරවූ, කරවනලද්දාවූ; **කප්පින මුදලිඳු** වෙහෙර, (මහා)**කප්පිනමුදලින්ද්‍රාරාම** විහාරයෙහි;සිතයුර,සිත්වූපරිද්දෙන්; විසූ, වාසයකළාවූ; **දම්ලකර** නායකහිමි, (සුගතසාසනධජ විනයාචරිය) **ධම්මාලඞ්කාර** නායක ස්වාමීන්වහන්සේ; කලක්, කාලයක්; මෙමවෙහෙර, මෙම (මහාමඞ්ගල සමුද්‍රාරාම) විහාරයෙහි; විසූබව, වාසයකළ බව; මමිතුර, මාගේ මිත්‍රය; දනු, විජානනයකරව.

94. පියුම් නොවම සිය පිය කල් සමග පියුම්
පියුම් ගැබ හු සිය සිය සරණ ගෙණ පියුම්
පියුම් අත් උ දය සිය රුසිති පිපි පියුම්
පියුම් වි ල ස කිය පිය මග නෙත් නො පියුම්

94. පියුම් ගැබහු, විෂ්ණුදිව්‍යරාජයා; සියපියකල්, ස්වකීය ප්‍රියභාර්‍ය්‍යාවූ; පියුම්සමග, ශ්‍රීකාන්තාව හා; පියුම්නොවම, වියොගනොවීම; පියුම්ගෙණ, පද්මග්‍රහණයකොට; සියසිය, අනවරතයෙන්; සරණ, සචාරණය කරන්නාවූ; පියුම්විල (මහාමඞ්ගල සමුද්‍රාරාමාසන්නයෙහි පිහිටි) පද්මතඩාගයෙහි; පියුම්අත්, සූර්‍ය්‍යදිව්‍යරාජයා; උදය, උදාවනකල්හි; සියරුසිති, ස්වකීය රශ්මියෙන්; පිපි, පුෂ්පිතවූ; පියුම්, පද්මයන්; නෙත්නොපියුම්, නෙත්‍රපිදහනය නොකොට; පිය සකිය, ප්‍රිය මිත්‍රය; මග, නිරීක්ෂණයකරව.

95. නුඹ නුබ නැගහඞා – ඉම්ගල නරඹ නරඹා
අම්බලම්ගොඩදෙස – යන සඳ පියඹ පියඹා.

95. නුඹ, පුෂ්පමත්හු; නුබ,ආකාශයට; හඹා, වහා; නැග; ආරූඪ වූ; ඉම්ගල, (රන්දෙඹා අම්බලම්ගොඩ යන ග්‍රාමවයෙහි) ශීමාශෛලය; නරඹ නරඹා, නිරීක්ෂණය කොටකොට; අම්බලම්ගොඩදෙස, එනම්(ග්‍රාමය) දිශාවට; පියඹ පියඹා, පක්ෂප්‍රසාරණය කොටකොට; යනසඳ, ප්‍රයානයකරණ කාලයෙහි.

96. ඉඳු කුල පහ න වැනි ලත් පින්බෙලෙන් ඉඳු
ඉඳු ර න් ද ම න කර බුදුවූන සුගත් ඉඳු
ඉඳු නිල් මු දු න සමනළ තැබූ එපද ඉඳු
ඉඳු ගජ ලෙසි න ඊසානෙන් පෙණේ ඉඳු

96. ඉඳුකුල. ක්ෂත්‍රියවංශයට; පින්බෙලෙන්, පුණ්‍යබලයෙන්; ලත්, ලැබූනාවූ; ඉඳුපහනවැනි, උත්තම ප්‍රදීපාකාරවූ; ඉඳුරන්, (චක්ෂුරාදි)ඉන්ද්‍රියයන්;දමනකර, දමනයකොට; බුදුවූන,සර්වඥපදප්‍රාප්තවූ; සුගත්ඉඳු, සුගතෙන්ද්‍රයන්වහන්සේගේ; ඉඳුපද, උත්තම ශ්‍රීපාදය; තැබූ, ස්ථාපනයකළාවූ; ඉඳුනිල්, ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් යුක්තවූ; සමනළමුදුන, සමන්තකූට පර්වතමස්තකය; ඉඳුගජ ලෙසින, ඓරාවණ හස්තිරාජයාමෙන්; ඊසානෙන්, ඓශානදිශාවෙන්; ඉඳු, ඍජුව; පෙණේ, දෘශ්‍යමානවේ.

97. නුබ හි රු ලෙසම සිරි ල ක එ ක ලෙස දි ලි ය
සුබ දු රු අ ර ම සිරි දැ ක දැ ක යන ක ලි ය
අ බ තු රු මෙගම සිරි නෙක නෙක මන ක ලි ය
නුබ තු රු නැගම පිරි දැ ක දැ ක ව නු නි ළි ය

97. නුබ, ආකාශයෙහි; හිරුලෙසම, සූර්‍ය්‍යයා පරිද්දෙන්ම; සිරිලක, ශ්‍රී ලඞ්කාද්වීපයෙහි; එකලෙස, එකාකාරයෙන්; දිලිය, ජ්වලිතවූ; සුබදුරු අරම, සුභද්‍රාරාම යෙහි; සිරි, ශ්‍රිය; දැක දැක, දර්ශනය කොට කොට; යනකලිය, ප්‍රයානයකරණ කාලයෙහි; මෙගමඅබතුරු, මේ (අම්බලම්ගොඩනම්) ග්‍රාමාභ්‍යන්තරයෙහි; පිරි, පරිපූර්ණවූ; මනකලිය, මනඃකල්‍යවූ; නෙකනෙකසිරි,නොයෙක්නොයෙක්ශ්‍රිය; නුබතුරුනැගම, ආකාශාභ්‍යන්තරයට උද්ගතවම; දැකදැක, දර්ශනයකොට කොට; නිළියවනු, සන්තුෂ්ටවනු.

98. නොමද සිරිබරින් බට සුරවිමන ලෙ ස
සු න ද රම පිවිස නරඹා නෙසැ ය ස
නැ ම ද සිතුබැතින් දැක සල්පිල් දෙප ස
ස බ ද වීඩාහැර නානායම නොල ස

98. නොමද, අමඳුවූ; සිරිබරින්, ශ්‍රීභාරයෙන්; බට, (භූමියට) අවතීර්ණවූ; සුරවිමනලෙස, දිව්‍යවිමානයක්වැනිවූ; සුනඳරම,සුනන්දාරාමයට; පිවිස, ප්‍රවිෂ්ටව; යස, යසපත්වූ; තෙසෑ, ත්‍රිවිධචෛත්‍යය; නරඹා, නිරීක්ෂණයකොට; සිතුබැතින්, චිත්තභක්තියෙන්; නැමද, නමස්කාරකොට; සල්පිල්දෙපස, උභයපාර්ශ්වයෙහිවූ ආපනශාලාවන්; දැක, දර්ශනයකොට; සබඳ, මිත්‍රය;නානායම, විශ්‍රාමශාලාවෙහි; නොලස, වහා; විඩාහැර, ශ්‍රාන්තය දුරුකොට.

99. දත් හෙළු මගද සකු – දම් වෙදගණිත පිරිසිඳු
රන් කොත් වෙහෙර සෝගත විදුහල දිප ති
පින් ස රු ස ත ර සංවරසිල් සුරැකි නි ති
සිදත්සේකර නම් – කළ මහ අරුත් වියකත
වැ ලි ගම එසිරි සුමගුල් නා හිමි සම ග
හෙ ලි කළ සියනකය යසරැසිනි එකර ඟ
ස ත් ද ත් විසු සෙල්බිඹු අරම විසිතු රු
පි න් ව ත් පියරතන නායක හිමිඳු ග රු
එ ක් ස ත් සඟණ විනෙකම් කරවූ මහ රු
යත් හොත් මැනවි සීමාගෙය දැක මිතු රු

99. හෙළු මගද සකු; සිංහල මාගධ සංස්කෘත හා; දම්, ධර්මයද; වෙදගණිත, වෛද්‍ය හා ගණිතයද; පිරිසිඳු, පරිශුද්ධව; දත්, විජානනය කළාවූ; රන්කොත් වෙහෙර, පානදුරේ පිහිටි එනම් විහාරයෙහි; සෝගතවිදුහලදිපති, සෞගත විද්‍යාලයාධිපතිවූ, පින්සරු, පුණ්‍යසාරවූ; සතරසංවරසිල්, චතුපාරිශුද්ධි ශීලය; නිති, නිරන්තරයෙන්; සුරැකි, මොනවට රක්ෂාකළාවූ; සිදත්සේකර නම්, (මුග්ධබොධ ව්‍යාකරණයට) සිද්ධාන්තශෙඛරය නම්වූ; මහඅරුත්වියකත, මහාඅර්ථ ව්‍යාඛ්‍යානය; කළ, කළාවූ; වැලිගම එසිරිසුමගුල් නාහිමි සමග, වැලිගම ශ්‍රී සුමඞ්ගලාභිධාන ඒ නායකස්වාමින්වහන්සේ හා; යසරැසිනි, කීර්තිනමැති රශ්මියෙන්; සියනකය, ස්වකීය නිකාය; එකරඟ, ඒකාකාරව; හෙලිකළ, ආලොකකළාවූ; විසිතුරු, විචිත්‍රවූ; සෙල්බිඹුඅරම, (දෙඩන්දූවේ) ශෛලබිම්බාරාමයෙහි; විසූ, වාසය කළාවූ; සත්දත්, ශාස්ත්‍ර දැනගත්තාවූ; පින්වත්, පුණ්‍යවන්තවූ; ගරු, ගරුවූ; පියරතන නායක හිමිඳු, පියරතන නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ; එක්සත්, එක්සත්වූ; සඟණ, සංඝයා ලවා; මහරු, මහාර්ඝවූ; විනෙකම් කරවූ; විනයකර්ම කෙරෙව්වාවූ; සීමාගෙය, උදකොක්ෂෙප සීමාගෘහය; මිතුරු, මිත්‍රය; දැක, දර්ශනයකොට; යත් හොත් මැනවි, ප්‍රයානය කළහොත් මැනවි.

100. සිරි අර ඹා සි කි මෙන් දෙන මියුරු හ ඬ
සිරි සර ඹා හැකි න න් පැටි ගහ දෙගො ඬ
සිරි පුර ඹා ර කි මි න් සිල් වැසි නොකා ඬ
සිරි තරඹා ස කි ය න් අම්බලම්ගො ඬ

100. සිරි අරඹා, ශ්‍රීමත් අරණ්‍යයන්හි; සිකි මෙන්, මයූරයන් මෙන්; මියුරුහඬ දෙන, මධුරනාද දෘනයකරන්නාවූ; සිරිසරඹා, ශ්‍රීමත් සරඹයෙහි; හැකි, සමර්ථවූ; ගහදෙගොඩ, ගඟා උභයපාර්ශ්වයෙහි; නන්පැටි, නානා පොතකයන්ගේද; නොකඩ, අඛණ්ඩව; සිල්රකිමින්, ශීල සංරක්‍ෂණය කරමින්; වැසි, වාසයකරන්නාවූ; පුරඹා, පුරාංගනාවන්ගේද; සිරි, ශ්‍රීය; සිරිසකි, ශ්‍රීමත්මිත්‍රය; තරඹා, නිරීක්‍ෂණයකොට; අම්බලම්ගොඩ, එනම් ග්‍රාමයෙන්; යන්, ප්‍රයානයකරන්.

101. මහදම්පා නය ලොල් සුදනන් නිසැ දී
මහදම්පා යක් කර නම ලද පෙර දී
මහදම්පා තල් දෙල් පොල් කිතුල් සැ දී
* **මහදම්පා** ගම සිරි දැක වඩින් සු දී

101. පෙරදී, පූර්වකාලයේදී; මහදම්පානය, මහාධර්ම පානයට; නිසැදී, නිරන්තරයෙන්; ලොල්, ලොලවූ; සුදනන්, සජ්ජනයන් විසින්; මහදම්පායක්, මහාධර්මප්‍රාශාදයක්; කර, කිරීමෙන්; නම, තනනාමය; ලද. ලද්දාවූ; මහදම්, මාදම්ය; තල්, තාලය; දෙල්, ලබුජය; පොල්, නාළිකෙරය; කිතුල්, හින්තාලයයන; පා, වෘක්‍ෂයන්; සැදි, සජ්ජිතවූ; මහදම්පා ගම, එනම් ග්‍රාමයෙහි; සිරි, ශ්‍රීය; දැක, දශිනයකොට; සුදි, සත්පුරුෂය; වඩින්, ප්‍රයානයකරන්.

102. වදිමින් **සිරිවඩන අරමට දේවගො** ඬ
විදිමින් නළ හම න ගත ගිම්හැර නොඅ ඬ
වඳිමින් තෙසැ ම න මෙන බැති නොකොටක ඬ
ඉඳිමින් පසෙක දු න මැන සකි මියුරු හ ඬ

102. දේවගොඩ. එනම් ප්‍රදෙශයෙහි, සිරිවඩන අරමට; ශ්‍රී වර්ධනාරාමයට; වදිමින්, ප්‍රවිෂ්ටව; හමන, හමනයවන්නාවූ; නළ, මන්ද මාරුතය, විඳිමින්, විඳිනයකොටකොට; ගත, ශරීරයෙහි; ගිම්, ග්‍රීෂ්මය; නොඅඬ, අඬනොව; හැර, පහකොට; බැති, භක්තිය; කඩ නොකොට; අඛණ්ඩව; මනමෙන, සිත්වූපරිද්දෙන්; තෙසැ, ත්‍රිවිධ චෛත්‍යය; වඳිමින්, නමස්කාරකොට; පසෙක, එක්පාර්ශ්වයෙක්හි; හිඳිමින්, නිසීදනයකොට; සකි, මිත්‍රය; මියුරු හඬ, මධුර නාදය; දුනමැන, දෘනයකළහොත්මැනවි.

---

* විල්ලිහිණි සන්දේශයේ 8 වෙනි කවිය බලනු.

103. රකිත සංවර සිල් – පිරිසිඳුව සියපණසේ
**සිරි දම් කඳරද ගුරු හිමිඳු සිසුව** ත
**සිරි සුමනස රද ගුරු** හිමි වෙත වැඩු ත
අප ඇඳුරිඳු පසන් – කුළුණු ගුණයෙන් සපිරුණු
සෙදදත් හෙළු මගද දම් විනයෙන් වොරැ දී
සඟ දත් ගරු නමැති **සිරිපවර සස** සු දී
සිරිමත් දම් තිලක සියසඟ නළල සැ දූ
සිරිමත් දම් තිලක වැඩුමට සිතු පැහැ දූ
සිරිමත් **දම්තිලක නායක** මහතෙරි දූ
සිරිමත් දම් තිලක රැඳි සකිසඳ නම දූ

103. සංවරසිල්, (ආජීව පාරිශුද්ධි ආදි සතර) සංවරශීලය; සිය පණසේ, ස්වකීය ප්‍රාණයමෙන්; පිරිසිදුව, පරිශුද්ධව; රකිත, රක්‍ෂාකරන්නාවූ; සිරිදම්කඳ රදගුරුහිමිඳු, (සද්ධම්මවංසපාල මහාධම්මරාජාධිරාජගුරු කපුගම) සිරිධම්මක්ඛන්ධ නායකස්වාමීන්ද්‍රයන්වහන්සේගේ; සිසුවන, ශිෂ්‍යවන්නාවූ; සිරිසුමනය රදගුරුහිමිවෙත, ස්‍වර්ණාලඞ්කාර සිරිසුමනමහාධම්මරාජගුරු නායකස්වාමීන්ද්‍රයන්වහන්සේගේ සමීපයෙහි; වැඩුන, වර්ධනයවූ; අප, අශ්මත්ශබ්දවාච්‍යහුගේ; ඇඳුරිඳු, ආචාර්‍ය්‍යොත්තමවූ; පසන්, ප්‍රසන්නවූ; කුළුණු ගුණයෙන්, කරුණාගුණයෙන්; සපිරුණු, සම්පූර්ණවූ; සෙද, වහා; දත්, විජ්ඤානයකළාවූ; එළු මගද දම් විනයෙන්, එළු පාලි ධර්මවිනය යනමෙයින්; වොරැදී, විරාජමානවූ; සඟදත්, සංඝයාවිසින් දෙනලද; සිරිපවරසසුදී, ගරුනමැති, සිරිපවර යසපණ්ඩිතයන ගරු නාමයක් ඇත්තාවූ; සිරිමත්, ශ්‍රීමත්වූ; දම්තිලක, ධර්ම නමැති තිලකය; සියසඟ, ස්වකීය (සද්ධම්මවංස නිකායික) සඞ්ඝයාගේ; නළල, ලලාටයෙහි; සැදූ, සජ්ජිතකළාවූ; සිරිමත්, සර්වඥයන්වහන්සේගේ; දම්, ධර්මය; තිලක, ත්‍රිලඞ්කාවෙහි; වැඩුමට, වර්ධනයට; සිත, චිත්තය; පැහැදූ, ප්‍රසන්නකළාවූ; සිරිමත්, ශ්‍රීමත්වූ; දම්තිලක නායකමහතෙරිඳු, ධම්මතිලක නායක මහා ස්ථවිරොත්තමයන්වහන්සේ; සිරිමත්, ශ්‍රීමත්වූ; දම්තිලක, ධර්ම නමැති තිලකයෙහි, රැඳී, රඤ්ජිතවූ; සකිසඳ, මිත්‍රොත්තමය; නමදූ, නමස්කාරකර.

104. සි ත් ග ත් ද න න් පලබරයෙන් නොවි යු ත් ත
කෙත් ව ත් තැනින් තැන දිසිවන සිරි යු ත් ත
ස ත් ද ත් ප ඩි න් ගෙන් උනුනොවනා නිත් ත
ය ත් හොත් මැ න වි එම ගම නරඹා මි ත් ත

104. පලබරයෙන්, ඵලභාරයෙන්; නොවියුත්ත, වියොගනොවූ; දතන්සිත්ගත්, (එහෙයින්ම) ජනයාගේ චිත්තග්‍රහණයකළාවූ; සිරි යුත්ත, ශ්‍රීයෙන් යුක්තවූ; තැනින්තැන, ස්ථානයක්පාසා; දිසිවන, දෘශ්‍යමානවන්නාවූ; කෙත්වත්, ක්ෂෙත්‍රවස්තු ඇත්තාවූ; සත්දත්, ශාස්ත්‍රදත්තාවූ; පඬින්ගෙන්, පණ්ඩිතයන්ගෙන්; නිත්ත, නිරන්තරයෙන්; උනුනොවනා, ඌනනොවන්නාවූ; එමගම, එම මහදම්පාග්‍රාමය; නරඹා, නිරීක්ෂණයකොට; මිත්ත, මිත්‍රය; යත්හොත්, ප්‍රයානය කරනහොත්; මැනවි, යහපති.

105. වි ය තු න් පැසසුකළ වනවිනිසය ස න් න
කි මි දු න් දිනූ දිරනඳ සිල්ගුණපු න් න
සු දු ව න් අකුරු පහළෙව් කිරි සයුරෙ න් න
ගුව නි න් වඩින් ලංකාගොඩ බලමි න් න

105. වියතුන්, ව්‍යක්තයන් විසින්; පැසසූ, ප්‍රශස්තකළාවූ; වනවිනිසයසන්න, විනය විනිශ්චය සන්නය; කළ, කළාවූ; සිල්ගුණපුන්න, ශීලගුණසම්පූර්ණවූ; දිරනඳකිමිඳුන්, ධීරානන්ද (නායක) ස්වාමීන්ද්‍රයන් වහන්සේ; දිනූ, ජනිතවූ; කිරිසයුරෙන්න, ක්ෂීරසාගරයෙන්; පහළෙව්, ප්‍රාදුර්භූතවූවාක්වැනිවූ; සුදුවන්, ශුභ්‍රවර්ණවූ; අකුරු, ගල් කැට ඇත්තාවූ; ලංකාගොඩ, එනම් ග්‍රාමය; බලමින්න, නිරීක්ෂණය කරමින්; ගුවනින්, ආකාශයෙන්; වඩින්, ප්‍රයානය කරන්.

106. න න් ස කු දු ල ග ලි න් ග ල වැදඑනනිසැ දී
ඉ න් නෙකු ණ ල ප ලි න් ප ල මියුරු රැව්දී දී
මෙ න් ය කු කැල පෙළි න් පෙළ වැටකේ සුසැ දී
ය න් අ කු ර ල වෙලි න් බ ල මින් සියන්සු දී

106. උදුල, උජ්වලිතවූ; නන්සක්, අනෙකවිධසඞ්ඛයන්; ගලින්ගල, පාෂාණයෙන් පාෂාණය; වැද, ඝට්ටනයවී; නිසැදි, නිරන්තරයෙන්; එන, ආගමනයවන්නාවූ (පාවෙන්නාවූ;) පලින්පල, තන්තිනන්හි; මියුරු රැව්දිදී, මධුරනාදදනයකොටකොට; නෙකුණල, අනෙකකුණාලයන්; ඉන්, නිශ්දෘශ්‍යකරන්නාවූ; වැටකේ, කෙතකීවෘක්ෂයන්; යකුකැලමෙන්, (කෙස්විදහාගත්) යක්ෂසමූහයාමෙන්; පෙළින්පෙළ, පංක්තියෙන්පංක්තිය; සුසැදි, සුසජ්ජිතවූ; අකුරලවෙලින්, එනම්ප්‍රදෙශයෙන්; සියන්, ස්වකීය (නෑයන්;) බලමින්, නිරීක්ෂණයකරමින්; යන්, ගමනයකරන්.

107. ගු රු ව න  වියත් නායතිඳුට **විමල්ස** ර
ම නමෙ න  උගත් පෙරදිගබස දම්සත ර
දූ වූ ද න  පිනන **ඤාණනඳ** යතිඳු ගුණස ර
ද නු මැ න  මිතුර දිනුබැව් **කහව** සිරිස ර

107. පෙරදිගබසසතර; සිංහල සංස්කෘතාදිපූර්වදිගභාෂාශාස්ත්‍රභාදම්, ධර්මයද; මනමෙන, සිත්වූපරිද්දෙන්; උගත්, උද්ග්‍රහණයකළාවූ; දූවූදන, දර්ශනයකළජනයා; පිනන, පිණවන්නාවූ; ගුණසර ගුණයෙන්සාරවූ; වියත්, ව්‍යක්තවූ; **විමල්සර** නායතිඳුට, **විමලසාර නායක** යතීන්ද්‍රයන්වහන්සේට; ගුරුවන; ආචාර්‍ය්‍යවන්නාවූ; **ඤාණනඳ**යතිඳු, (සද්ධම්මවරජෝතිපාල) **ඤාණානන්ද** යතීන්ද්‍රයන්වහන්සේ; සිරිසර, ශ්‍රීසාරවූ; කහව, එනම්ග්‍රාමයෙහි; දිනුබැව්, ජනිතභාවය; මමිතුර, මාගේමිත්‍රය; දනුමැන, ජානනයකළහොත්මැනවි.

108. ගොඩ බි ම ස මැ ති පොල් ව තු නු දු රු තැ න තැනේ
ම ඩ බි ම ස සැ ති හෙල් යුතු සොඳු රු ව න ව නේ
වැ ඩ නි ම නොමැ ති පොල් අතු මැ දු රු ගැ න ගැ නේ
**ගොඩ ගම** පැ හැ ති ක ල් සිතු මි තු රු පි ණ මි නේ

108. ගොඩගම, එනම් ග්‍රාමයෙහි; සමැති, සමවූ; ගොඩබිම, ඵලභූමියෙහි; තැනතැනේ; තන්හිතන්හි; නුදුරු, ආසන්නවූ; පොල්වතු, නාළිකෙරවස්තූන්; සසැති, ශෂ්‍යඇත්තාවූ; හෙල්යුතු, හෙල්වලින්යුක්තවූ; මඩබිම, කදීමභූමිද; සොඳුරුවන සුන්දරවන්නාවූ; වනේ, අරන්‍යද; වැඩනිමනොමැති, කර්තව්‍යනිෂ්ඨානොවූ; පොල්අතුමැදුරු, නාළිකෙරශාඛාවන්ගෙන් කරණලද මණ්ඩපද; ගැනගැණේ, සංඛ්‍යාකරමින්; කල්සිතු, යහපත්සිත්ඇත්තාවූ; මිතුරු, මිත්‍රය; පිණමිනේ, පිණනයවෙමින්.

109. තෙ ල් තිත්තේ ගැණු ම ට වෙහෙරට පො ර ණ
පො ල් යුත්තේ තැ නු ව ට මොන වට න ර ණ
**තෙ ල් වත්තේ** ය නු ඉ ට නි ග ම ට නොමි ණ
**ස** ල් මත්තේ ය නු තු ට ලැගු මට ල සි ණ

109. පොරණ, පුරාණයෙහි; නරණ (සතරවෙනි පරාක්‍රමබාහු) රජහුවිසින්; වෙහෙරට, තීර්ථග්‍රාමවිහාරයට; තිත්තේ, නිරන්තරයෙන්; තෙල්ගැණුමට, (පහන්දැල්වීම පිණිස) තෙල්ගැණීමට; වට, (ඒ විහාරය) හාත්පස; තැනු, තනනලද්දාවූ (රෝපනය කරණ ලද්දාවූ); පොල්යුත්තේ, (පන්දහසක්)පොල්ගස්වලින් යුක්තවූ; තෙල්

වත්තේයනු, තෙල්වත්තයයි කියත; නොමිත, බොහෝසෙයින්; ඉට, යහපත්වූ; නිගමට, නිගමග්‍රාමයෙහි; සල්මත්තේ, වෘක්ෂයක් මස්තකයෙහි; ලැගුමට, නිවාසග්‍රහණයපිණිස; ලසින, සෙමින්; යනු, යාත්‍රාකරව.

110. වෙමින් ලොල් නිත්ත පින් කර එකහ මුව
දූ මින් සිල් ගත්ත පින් සර දන සු මුව
න මින් තෙල් වත්ත දූන් තිර යස නු මුව
නොමින් කල් මිත්ත දන් පෙර තොටග මුව

110. නිත්ත, නිරන්තරයෙන්; පින්කර, පින්කොට; එකහමුව, එක්වී; ලොල්වෙමින්, ආසාවී; දූමින්, නික්මීමෙන්; සුමුව, ව්‍යපසමනයවු ඉන්ද්‍රියයන් ඇතිව; සිල්ගත්ත, සිල්ගත්තාවූ (සිල් සමාදන් වූ); පින්සර, පුණ්‍යසාරවූ; දන, ජනයාගෙන් යුක්තවූ; පෙර, පූර්වයෙහි; නොමින්, බොහෝසෙයින්; තිර, ස්ථිරවූ; යසනුමුව, කීර්තියෙන් යුක්තවූ; තොටගමුව, එනම්ග්‍රාමය; දූන්, අධුනාකාලයෙහි; තෙල්වත්ත, එනම් ග්‍රාමයයි; කල්මිත්ත, කල්‍යාණමිත්‍රය; දන්, විජ්ඥනයකරන්.

111. සල් සපු නා පනා දුනුකේ කොලොම් තුරු
දෙල් පොල් තල් කිතුල් මිරිකුළුද බෙලි තුරු
කල් අඹ දඹ ඇටඹ දෙඹ කරඹ රඹ තුරු
මල් පල දිලෙන බලමැන මෙගම මමි තුරු

111. මෙගම, මේ (තෙල්වත්ත නම්) ග්‍රාමයෙහි; මල්පලදිලෙන, පුෂ්පඵලයන්ගෙන් බබලන්නාවූ; සල්, සාලය; සපු, චම්පකය; නා, නාගය; පනා, කොස්ය; දුනුකේ, රාජකෙතකිය; කොලොම්, කදම්බය යන; තුරු, වෘක්ෂයන්ද; දෙල්, ලබුජය; පොල්, නාළිකෙරය; තල්, තාලය; කිතුල්, හින්තාලය; මිරිකුළු, මුරුඬගාය; බෙලි, ශ්‍රීඵලයයන; තුරුද, වෘක්ෂයන්ද; කල්, යහපත්වූ; අඹ, ආම්‍රය; දඹ, ජම්බුය; ඇටඹ, ශෛවතාම්‍රය; දෙඹ, පුන්නාගය; කරඹ, කරමදීකය; රඹ, රම්භාය යන; තුරු, වෘක්ෂයන්ද; මමිතුරු, මාගේ මිත්‍රය, බලමැන, අවලොකනය කළහොත් මැනවි.

112. පොහො දින දුල හැලීය හැඳිපි ලීය
බොහො ගුණ කුල පැලීය මතක ලීය
දෙහො තින හෙළ ම ලීය ගෙණ ති ලීය
අ හො යත කල පෙළීය බලපෙ ලීය

112. පොහොදින, උපොසථදිනයෙහි; දූල, ජ්වලිතවූ; හැ ලිය පිළිය, ශ්වෙත්වස්ත්‍ර; හැඳි, අවිඡාදනයකළාවූ; මනකලිය, මනඃකල්‍යවූ; බොහෝගුණ, බොහෝගුණඇත්තාවූ; කුලපැලිය, වංශවත්ස්ත්‍රීහු; හෙළමලිය, ශ්වෙත පුෂ්පයන්; දෙහොතින, හස්තවන්දයෙන්; තීලීය, සන්තොෂයෙන්; ගෙණ, ග්‍රහණයකොට; පෙළීයපෙළීය, පඞ්කතිපඞ්කතිව; යනකල, ප්‍රයානයකරණකාලයෙහි; බල, නිරීක්ෂණයකරව; අහො, හේ ආශ්චර්ය්‍යයි.

113. අදර බිඹුපලෙව් දිසි තුනු ගෑ අහර
අමර ගන සදිසි කුලඟන යුත් අදර
අවර ගිර සහස් රැස් පත්සඳ අසර
අඳුර හරණ සසඳර තුරු වැනි අඹර

113. තුනු, ශරීරයෙහි; අහර, අඞ්ගරාගයන්; ගෑ, ආලෙප කළාවූ; බිඹුපලෙව්, කෝවක්කාඵලමෙන්: දිසි, දෘශ්‍යමානවූ; අදර, තොල්ඇත්තාවූ; අමරගන සදිසි, දිව්‍යාඞ්ගනාවන් වැනිවූ; අදරයුත්, ප්‍රෙමාන්විතවූ; කුලඟන, කුලාඞ්ගනාවෝ; අවරගිර, අපරපර්වතයට; සහස්රැස්, සූර්ය්‍යයා; පත්සඳ, ප්‍රාප්තවූකල්හි; අඹරඅසර, ආකාශමාර්ගයෙහි; අඳුරහරණ, අන්ධකාරය දුරුකරන්නාවූ; සසඳරතුරුවැනි, චන්ද්‍රතාරකාවන්වැනිය.

114. එ හි සලෙලා හැසිරෙන විලි වෙ ළාය
දූකකොමලා කුලඟන මනක ළාය
බිය වැ දි ලා පලඟට සොම් දූ ළාය
විමන් තු ලා රැඳි සිරිපැය ක ළාය

114. මනකලාය, මනඃකල්‍යවූ; කොමලා, කොමලවූ; කුලඟන, කුලාඞ්ගනාවෝ; එහි, ඒග්‍රාමයෙහි; හැසිරෙන, සඤ්චාරණයකරන්නාවූ; සලෙලා, සල්ලාලයන්; දූක, දර්ශනයකොට; විලිවෙළාය, ලජ්ජාවී; දූළාය, ජ්වලිතවූ, සොම්, චන්ද්‍රයා; පලඟට, රාහු අසුරෙන්ද්‍රයාට; බියවැදිලා, භයප්‍රවිෂ්ටව; විමන්තුලා, විමානාභ්‍යන්තරයෙහි; රැඳි, රැඳුනාවූ; සිරි, ශ්‍රීය; පැයකළාය, ප්‍රකාශකළෝය.

115. න ළ ලා අඩසඳෙව් අලකය සස රුව ලා
දෙතොලා රතු පුලෙව් නෙතු සුවලනිලුපු ලා
සු ව ලා රන්තැඹිලි තනබඳ රන්රුව ලා
ස ළෙ ලා උමතුවන වරගන බල සහ ලා

115. අඩසඳෙව්, අර්ධචන්ද්‍රාකාරවූ; නළලා, ලලාටයක්ඇති; සසරුවලා, සසරූපයබඳුවූ; අලකය, කියඹුවැලින්යුක්තාවූ; රතුපුලෙව්,

රත්කොනාත්එලබඳුවූ; දෙතොලා, උභයොෂ්ඨඇති, තිලුපුලා, නීලොත් පලාකාරවූ; නෙතුයුවල, නෙත්‍රයුග්මයක්ඇති; රන්තැඹිලි, සවර්ණසන්නිර (යුග්මයක්) වැනිවූ; තනයුවලා, පයොධරයුග්ම යක්ඇති; රන්රුවලා, සවර්ණරූපාකාරවූ; බඳ, දෙහයක්ඇති; ස ලෙලා, සලීලාලයන්; උමතුවන, උන්මත්තවන්නාවූ; වරඟන, වරාඞ්ගනාවන්; සහලා, මිත්‍රය; බල, අවලොකනයකරව.

116. රන් ගිර පෙණ සත්කුළදරණ රළබ ලා
සඳ හිර නෙත් වළබමුව දිව් වලබන ලා
සිඳු උර රද සිව්දිගදළ යුදකර ලා
වන් යුර මෙගම වරඟන ගෙණයනසෙ ලොලා

116, රන්ගිරපෙණ, සවර්ණමෙරුපර්වතනමැති ඵෙණයක්ඇති; සත්කුළදරණ, (යුගන්ධරාදී) සප්තකූටපර්වතවලලුනමැති භොගාව ලීන් යුක්තවූ; රළබලා, තරඞ්ගනමැති සෙනාඇති; සඳහිරනෙත්, චන්ද්‍රසූර්‍යයනමැති නෙත්‍රඇති; වළබමුව, වඩබා මුඛනමැති මුඛඇති; වලබනලාදිව්, වඩබාග්නිනමැති ජිහ්වාඇති; සිව්දිගදළ, චතුර්දිශා නමැති දංෂ්ට්‍රාඇති; සිඳුඋරරද, සාගරනමැති උරගරාජතෙම; යුද කරලා, යුඬකොට; මෙගම, මේග්‍රාමයෙහි; වරඟන, වරාඞ්ගනාවන්; ගෙණයනසෙ, ග්‍රහණයකොටයනපරිද්දෙන්; ලොලා, ආසාවෙන්; වන්යුර, සම්ප්‍රාප්තවූවාවැන්න.

117. කො සේ මෙහිවෙරල සුපිහිටි සඳපහ න
දි සේ දහම් කතිඳුට දම්හලවඩ න
ය සේ තරුමලෝලඹු සෙවලා විය න
තොසේ මග හෙළු හෙළ පියවිලියමෙ න

117. මෙහි, මේග්‍රාමයෙහි; සුපිහිටි, මනාකොටපිහිටියාවූ; සඳප හනදිසේ, චන්ද්‍රකාන්තියෙන් බබලන්නාවූ; වෙරල, මයහිංදුව; කොසේ, කොසේදයත්; දම්හලවඩන, ධර්මශාලාවට වඩින්නාවූ; දහම්කතිඳුට, ධර්මකතිකයාට; යසේ, යහපත්වූ; තරුමලෝලඹු, තාරකානමැති පුෂ්පාවලම්බඇත්තාවූ; සෙවලාවියන, සුදුවලාකුල්න මැති වියනින්යුක්තවූ; මග, මාර්ගයෙහි; තොසේ, සන්තොෂයෙන්; හෙළු, එලනලද්දවූ; හෙළපියවිලියමෙන, සුදුපාවාඩයක්වැන්න.

118. මු හු දු දලවැටී බබලන සඳපහ න
දි නි දු රැස් විදුරුහී නැගි කැළුම්මෙ න
මු හු දු තුලපෙණෙන පිළිබිඹු තරුදිලු න
තොමදු ලෙසපිහිටි නෙරුවන් පානමෙ න

118. සඳපහන, චන්ද්‍රකාන්තිය; මුහුදුදල, සමුද්‍රජලයෙහි; වැටී, පතිතව: බබලන, භ්‍රාජිතවනකල්හි; දිනිඳුරුස්, සූර්‍ය්‍යරශ්මිය; විදුරු,වජ්‍රමණ්ඩකයෙහි, හී, පතිතව; නැගී, ඉන්උද්ගතවූ; කැළුම්මෙන, කාන්තියවැන්න; මුහුදුතුල, (එම) සමුද්‍රාභ්‍යන්තරයෙහි; දිලුන, දීප්තිමත්වූ; තරු, තාරකාවන්ගේ; පිළිබිඹු, ප්‍රතිබිම්බයන්; පෙණෙන, දෘශ්‍යමානවනකල්හි; නොමදුලෙස, අමන්දාකාරව; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ, නෙරුවන්, නානාවිධරත්නයන්; පානමෙන, දක්වන්නාක් වැන්න.

119. නී ත් පාවනවනා පීණා සඳ එ ලි ය
සි ත් ලෙස දැක කැසුබුසුමුගොඩ එනක ලි ය
වෙ ත් සිව්පලුපතින් පැද පැද එනවෙ ලි ය
සි ත් නොමකරත් ඔරුපාරුයමනක ලි ය

119. කැසුබුසුමු, කච්ඡපසමූහයා; සඳඑලිය, චන්ද්‍රාලෝකය; දැක, දර්ශනයකොට; සිත්ලෙස, සිත්වූපරිද්දෙන්; නිත්; නිරන්තරයෙන්; පාවනවනා, පාදචලනයකරමින්; පීණා, තරණයකොට; ගොඩඑනකලිය, ගොඩටඑනකාලයෙහි; සිව්පලුපතින්, හබල්පත් සතරකින්; පැදපැද, පාජනයකොටකොට; වෙලියවෙත්, මර්‍ය්‍යාද වසම්පයට; එන, ආගමනයකරන්නාවූ; මනකලිය, මනඃකල්‍යවූ; ඔරුපාරුය, ද්‍රෝණීහාපාදද්‍රෝණීයයි; සිත්නොමකරන්, මෙනෙහි නොකරව.

120. තෙ රතිඳු රහත්පත් – සියක් වැඩසිටියෙන් පෙර
ව රතමින් රහත්පත් පතළ ලකතු ර
ලා බ ති න් නොසිස්කල සැදූනි නරව ර
ව තලලොව යසසිරි – සගුන්වැඩසිටි බෝකල්
ද [illegible] න් නෙකදෙසින් පුදපඬුරු තිසිලෙ සේ
නි හි න් එනරුගෙණ තෙරුවන පුදදිනො සේ
සු ර න් පිරි[illegible]රා පින්රුස්කරණය සේ
රූ ව න් මිණිබරණ හෙළසළු හැඳවෙසෙ සේ
ඩි ම න් මැද අරාසිහසුන සුරිඳුලෙ සේ
ජ යෙ න් ජයවඩන නනිසුරුරදන තො සේ

120. පෙර, පූර්වකාලයෙහි; පන්සියක් රහත්තෙරනිඳු; පන්සියයක් රහත්ස්ථවිරයන්වහන්සේලා; වැඩසිටියෙන්, අවස්ථානයකල හෙයින්; ලකතුර, ලඞ්කාභ්‍යන්තරයෙහි; රහත්පත්, රහත්පත්හෙවත් රත්පත්යන; වරතමින්, උපාං.ම නාමයකින්; පතළ,ව්‍යාප්තවූ;

සැදූනි, ශ්‍රද්ධාවගතවූ; නරවර,නරශ්‍රෙෂ්ඨයන්විසින්; ලාබතින්, සලාභතානයෙන්; නොසිස්කළ, ශූන්‍යනොකළාවූ; ලොව, ලොකයෙහි; යසසිරි, කීර්තිශ්‍රීයෙන්යුක්තාවූ; සඟුන්; සංඝයා; බෝකුල්, බොහෝකාලයක්මුළුල්ලෙහි; වැඩසිටි, අවස්ථානයකළාවූ, දනන්, ජනයා; නෙකදෙසින්, අනෙකදිශාවලින්; පුද පඬුරු, පූජාපණ්ණාකාරයන්; තිසිලෙසේ, යොග්‍යපරිද්දෙන්; තෙරුවනපුදට, රත්නත්‍රයටපිදීම පිණිස; තොසේ, සන්තොෂයෙන්; රැගෙණ, ග්‍රහණයකොට; නිතින්, නිරන්තරයෙන්; එන, ආගමනයකරන්නාවූ; යසේ, යසහපත්වූ; සුරන්. දෙවියන්; පිරිවරා,පරිවාරකොටගෙණ; පින්රැස්කරණ, පුණ්‍යසචයකරන්නාවූ; රුවන්මිණිබරණ, රත්නමාණික්‍යාභරණද; හෙළසළු, ශ්වෙතසාටකද; වෙසෙසේ, (පරිවාරදෙවියන්ට) විශිෂටනායෙන්;හැඳ, අවඡාදනයකොට; විමන්මැද, විමානමධ්‍යයෙහි;සිහසුනඅරා, සිංහාසනාරූඪව; සුරිඳුලෙසේ, ශක්‍රයාමෙන්; ජයෙන්ජයවඩන, ජයෙන් ජයවර්ධනයකරන්නාවූ;නතිසුරු,නාථදෙවෙන්ද්‍රයා; තොසේ, සන්තොෂයෙන්; රඳන, රඤ්ජමානවූ.

121. ස හ අසුන්කළරැව් – සැළලිහිණිකව්සේකර
බ ඹ ගු රු නැතින් කළපව්කපදිප ය ත
පි වි තු රු ස ගු න් තුරුමැද පුන්තරිඳුමෙ න
රි විමග සසුන මුනි – පොබයකළ දනමනකොඳ
වෙ නු පු ත් ලෙසින් දසදෙස එකලෙස පසි ඳු
න ය ස ත් සොඳින්දන් ලැබවරය සවනි දු
දි න ක ර අයුරු මිසදිටු ගණඅඳුරුහ ළු
ප ර තෙ ර සබසසපැමිණි පරම්සුරුප ළු
හි ර ස ර විකුම් පැරකුම්නිරිඳු ඇතික ළු
සි රි ස ර මහිමිවිසු දිනු එකඳවුරුකු ල

121. සහ, යහපත්වූ; කළරැව්අසුන්, පාරාපතසඞ්ඝයද; සැළලිහිණිඅසුන්, ශාරිකාසඞ්ඝයද; කව්සේකර, කාව්‍යශෙඛරයද; පව්කපදිපයන, පඤ්චිකාප්‍රදීපයද යනමේ ග්‍රන්ථයන්; බඹගුරුනැතින්; බ්‍රහස්පතිගේ ඥානයවැනි ඥානයෙන්; කළ, කළාවූ; මුනිසසුනරිවිමග, සර්වඥශාසන නමැති ආකාශයෙහි; පිවිතුරු, පවිත්‍රවූ; සඟුන්තුරුමැද, සංඝනමැති තාරකාමධ්‍යයෙහි;දනමනකොඳ, ජනයන්ගේ සිත්නමැතිකෞමුදයන්; පොබයකළ, ප්‍රබොධකළාවූ; නරිඳුමෙන, චන්ද්‍රයාවැනිවූ; වෙනුපුත්ලෙසින්, මහාබ්‍රහ්මයාමෙන්; දසදෙස, දශදිශාවෙහි; එකලෙස, එකාකාරයෙන්, පසිඳු, ප්‍රසිද්ධවූ; සවනිඳු, ස්කන්ධකුමාරයාගෙන්; වරයලැබ, වරයක්ලබාගෙණ; නයසත්,

න්‍යාය ශාස්ත්‍රයන්; සොඳින්, සුන්දරාකාරයෙන්; දත්, දැනගත්තාවූ; දිනකර අයුරු, සූර්‍ය්‍යයාමෙන්; මිසදිටු ගණඳුරු, මිථ්‍යා දෘෂ්ටි නමැති ඝනාන්ධකාරය; හළ, පහකළාවූ; සබස, ෂඩ්භාෂාවෙහි; පර තෙර, පරතීරයට; සපැමිණි, සම්ප්‍රාප්තවූ; පරම්සුරු, (එහෙයින්ම) පරමේශ්වරයයි; පළ, ප්‍රසිද්ධවූ; තිරසර විකුම්, ස්ථිරසාර වික්‍රමාන්විතවූ; පැරකුම් නිරිඳු, (සවෙනි) ශ්‍රී පරාක්‍රමබාහු නරේන්ද්‍රයා විසින්; ඇතිකල, (පුත්‍රස්ථානයෙහි තබා) වර්ධනයකළාවූ; එකඳවුරුකුල, ඒකස්කන්ධාවාරවංශයෙහි; දිනු, ජනිතවූ; සිරිසර, ශ්‍රීසාරවූ; මහිමි, (ශ්‍රී රාහුල සංඝරාජ) මහා ස්වාමීන් වහන්සේ; විසූ, වාසයකළාවූ–

122. රි පු වරණ මිසදිටු – දප බිඳී කෙසර විකුමැති
ර දහසුන් තෙරට පුද පඬුරුද නොමි — න
හු දිදනන් සඟුන් පබුදනගෙන් තිති — න
ල ද නමද තෙවලා – වදතිසුරුදුරු සඟගෙණ
හි ක්කඩුවේ සිරි සුමඟුල් එයතිප — ති
මි හිරිය නැනැති සංවරසිල් සුරැකි නි — ති
තු මුල සියම් නකයෙහි ගාලු කෝර — ළ
මා හිමි කොළඹ නවකෝරළ සමන්කු — ළ
වි දුදය පිරිවෙණ දිපති මුළුලොව පත — ළ
සු ගතිඳු සසුන පැවද්ව විසුතුරුණුක — ල

122. රිපු, (සර්‍වඥශාසනයට) ශත්‍රුවූ; මිසදිටුවරණ, මිථ්‍යාදෘෂ්ටි නමැති හස්තීන්ගේ; දප, දර්පය (ආඩම්බරය); බිඳී, භේදකළාවූ; කෙසරවිකුමැති, (එහෙයින්) කේශරවික්‍රමාන්විතවූ; තෙරට, අනෙක රාෂ්ට්‍රයන්හි; රදහසුන්, රාජසන්දේශද; හුදිදනන්, සුධිජනයාගෙන්ද; සඟුන්, සඞ්ඝයාගෙන්ද; පබුදනගෙන්, ප්‍රභූජනයාගෙන්ද; නොමිත, බොහෝසෙයින්; පුදපඬුරුද, පූජාපණ්ණාකාරද; සඟගෙණ, සඞ්ඝයාගෙන්; තෙවලා වදතිසුරු ඇදුරු, ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍යත; නමද, නාමයද; ලද, ලද්දාවූ; මිහිරිය නැනැති, ගම්භීර ඥානය ඇත්තාවූ; සංවරසිල්, සතර සංවරශීලය; නිති, නිරන්තරයෙන්; සුරැකි, මනාකොට ආරක්ෂාකළාවූ; තුමූලසියම්නකයෙහි, (ලඞ්කාවෙහි සියලුනිකාය අතුරෙන්) මහත්වූ ස්‍යාම නිකායෙහි; ගාලුකෝරළ, ගාලුකෝරළයෙහිද; කොළඹ නවකෝරළ, කොළඹනවකෝරළයෙහිද; සමන්කුළ, සමන්තකූටයෙහිද; මාහිමි, මහාස්වාමිවූ; මුළුලොව, සමස්තලොකයෙහි; පතළ, ව්‍යාප්තවූ; විදුදය පිරිවෙණදීපති, විද්‍යොදයපරිවෙණාධිපතිවූ; හික්කඩුවේ සිරිසුමඟුල් එයතිපති, හික්

කඩුවේ ශ්‍රීසුමඞගල නම් ඒ යතිඥයන්වහන්සේ; සුගතිඳු සසුන, සඞ්ඝ ශාසනයෙහි; පැවිදිව, ප්‍රව්‍රජිතව; තුරුණුකල, තරුණ කාලයෙහි; විසූ, වාසයකළාවූ.

123\. තො රන් පහපෙළිනා – දනන් මන නෙත් පිණනා
ට ඹින් පහන් පව්රෙන් පිළිමිණෙන් සැ දූ
ශ බින් නිදන් කළ ද කැළුමෙන් තිසි ඳු
මු නි මැදුර පොරණා – දිසා පිළිහිමි වැඩළුන්
වෙ නනව පිළිමගෙය නෙක සිතියම්ති දි සී
හෙ ළ ඹළු පියුම් දිනදින පුදලබන නි සී
ර ද මැති තුමන් මතු පවතිනසෙ නිරස ර
ට ඹ සෙල් රුසින් කරවූ අරම මනහ ර
ශ හ සකි සැදූහැ වඩමින් නිති කර අද ර
ව ඳු නරඹා මේ සිව්සැහැලි මූලකු ර

123\. දනන්, ජනයන්ගේ; මනනෙත්, මනොනෙත්‍රයන්; පිණනා, පීණනයවන්නාවූ; තොරන් පහපෙළිනා, තොරන්වලින් හා ප්‍රාශාදපඞක්තියෙන්ද; පිළිමිණෙන්, ස්ඵටික මාණික්‍යයෙන්, සැදූ, සාදනලද්දාවූ; පහන්ටඹින්, ප්‍රදීපස්ථම්භයන්ගෙන් හා; පව්රෙන්, ප්‍රාකාරයකින්ද; තිසි, යොග්‍යපරිද්දෙන්; හෙළඹළු, ශ්වෙතශාලූක පුෂ්ප හා; පියුම්, පද්මයන්ද; දිනදින, දවසක්පාසා; පුදලබන, පූජාලබන්නාවූ; කැළුමෙන්, කාන්තියෙන්; තිසිඳු, චන්ද්‍රයා වැනිවූ; දා නිදන්කළ, ධාතු නිදන්කළාවූ; ශබින්, ගර්භයකින්ද; දිසා පිළිහිමි, දිශා ප්‍රත්මාසවාමීන්වහන්සේ; වැඩළුන්, වැඩහුන්නාවූ; පොරණ මුනිමැදුර, පුරාණ සඞ්ඝමන්දිරයද; වෙත, ඒසමීපයෙහි (පිහිටියාවූ) නෙකසිතියම්ති, අනෙක චිත්‍රකර්මයෙන්; දිසි, බබලන්නාවූ; නව පිළිමගෙය, අභිනවප්‍රතිමාගෘහයද; රදමැතිතුමන්, රාජමන්ත්‍රීන්‍ද්‍රයන් විසින්; මතු, අනාගතකාලයෙහි; නිරසර, සර්වකාලයෙහි; පවතිනසෙ, ප්‍රවෘත්තිතවනපරිද්දෙන්; කරවූ, කරවනලද්දාවූ; සෙල්ටඹරුසින්, ශෛලස්ථම්භ රාශියකින්ද; මනහර, මනොහරවූ; අරම, ආරාමය; මේසිව්සැහැලි, මේ සැහැලි චතුස්කයේ; මූලකුර, මූලාක්ෂරයන්; **(තෙවලාවදනිසුරු විජයබා පිරිවෙණාධිපති ශිරිරගුල ගිමිතුමාවිශු කොටගමු වෙහෙරට යව)** නරඹා, නිරීක්ෂණයකොට; යහසකි, යහපත් මිත්‍රය; සැදූහැවඩමින්, ශ්‍රද්ධාව වර්ධනයකරමින්; නිති, නිරන්තරයෙන්; අදරකර, ආදරකොට; වඳු, නමස්කාරකර.

124. ඉඳු නිල් මිණෙව් බට සුරපුරෙනි මෙලොව ට
මන කල් අඳුන්වන් වඹ රුසිනි වටකො ට
සැදි කල් එහි දෙවොලවැද සිරි බලනවි ට
පැහැදුල් එවිජයොත් පහ සිහිවෙසි තොප ට

124. මෙලොවට, මේලොකයට; සුරපුරෙනි, දිව්‍යපුරයෙන්; බට, අවතීර්ණවූ; ඉඳුනිල්මිණෙව්, ඉන්ද්‍රනීල මාණික්‍යාකාරවූ; මනකල්, මනඃකල්‍යවූ; අඳුන්වන්, අඤ්ජනවර්ණවූ; වඹරුසිනි, සර්මහරාශියෙන්; වටකොට, ආවෘතකොට; එහි, ඒවිහාරයෙහි; සැදි, සැදුවාවූ; කල්, සහපත්වූ; දෙවොල, දෙවාලයට; වැද, ප්‍රවිෂ්ටව; සිරි, (එහි) ශ්‍රිය; බලනවිට, නිරීක්ෂණයකරණකාලයෙහි; පැහැදුල්, ප්‍රභාවෙන් දිලිහෙන්නාවූ; එවිජයොත්පහ, ඒ විජයොත්පහය; තොපට, යුෂ්මත්හට; සිහිවෙසි, අනුසමරණයවෙසි.

125. බැඳි රන්රසුදැල් රන්දද පෙළිනි යු තී
ඇඳි සිතුයම් බිතුසහ මල් වියන් පෙ තී
සැදි මුතුලැල් තුරුපෙළ නන් කැළම් ඇ තී
සුදි නරඹන් විසිතුරු එවිමන දිමු තී

125. බැඳි, බන්ධනයකරණලද්දාවූ; රන්රසුදැල්, ස්වර්ණකිංකිණිකජාලායෙන්ද; රන්දද පෙළිනි, ස්වර්ණධ්වජ පඞ්ක්තියෙන්ද; යුතී, යුක්තවූ; සිතුයම්, චිත්‍රකර්මයන්; ඇඳි, අඳිනලද; බිතුසහ, භිත්තිහා; මල්වියන්පෙති, පුෂ්පවිතානපඞ්ක්තිද ඇත්තාවූ; නන්කැළම්ඇති, අනෙකවිධ කානාහිඇත්තාවූ; මුතුලැල්තුරු පෙළ, තාරකා පඞ්ක්ති වැනි මුක්තාලතිකාවන්ගෙන්ද; සැදි, සජ්ජිතකලාවූ; දිමුතී, දීප්තිමත්වූ; එවිමන විසිතුරු, ඒ (නාථදෙවෙන්ද්‍රයාගේ) දිව්‍යමන්දිරයෙහි විචිත්‍රය; සුදි, සත්පුරුෂය; නරඹන්, නිරීක්ෂණයකරන්.'

126. ගවසා සුපුල්මල් සිකිපිල් වරල් බැ ඳ
සරසා කණත බබලන රන්තෝඩු සො ඳ
දෙඇසා අඳුන් ඇඳ අත රන්වලලු ස ඳ
සතොසා ගී රැඟුම් දෙනඟන බල තොම ඳ

126. සුපුල්, සුත්ඵුල්ලවූ; මල්, පුෂ්පයන්ද: සිකිපිල්, මයූරපිඤ්ඡයන්ද; ගවසා, ආකූලකොට; වරල්, කෙශකලාපයන්; බැඳ, බන්ධනයකොට; සොඳ, සුන්දරවූ; බබලන, භ්‍රාජිතවන්නාවූ; රන්තෝඩු, ස්වර්ණතාඩඞ්කයන්ගෙන්; කණත, කර්ණාන්තය; සරසා, අලඞ්කෘතකොට; දෙඇසා, නෙත්‍රමයෙහි; අඳුන්, අඤ්ජනයන්; ඇඳ, අඤ්ජන

යකොට; අත, හස්තය; රන් වළලු, ස්වර්ණ වලයාභරණයන්ගෙන්; සද, සජ්ජිතකොට; සතොසා, සන්තොෂයෙන්: නොමද, අමන්දව; ගිරහුම්දෙන; ගීතිකා හා නෘත්‍යදානයකරන්නාවූ; .අඟන, අඞ්ගනාවන්; බල, අවලොකනය කරව.

127. ගා නා මියුරු සත්සරයුතු වීණා ද
නා නා සක් කොම්බු හොරණෑ වස්දඬු ද
පා නා රඟුම් නළඟන තාලයට න ද
පේ නා කලට සුරඟනයසි නොසිතේ ද

127. මියුරු, මධුරවූ; සත්සරයුතු, ශඩ්ජස්වරයෙන් යුක්තවූ; ගා නා, ගායනාකරන්නාවූ; වීණාද, විපඤ්චිකාවන්ගේද; නානා සක් කොම්බු හොරණෑ වස්දඬුද, නානාවිධ සඞ්ඛ කොම්බු හොරණෑ වස් කුලල් ආදීන්ගේද; නද, නාදයෙහි; තාලයට, වෘත්තයට; රඟුම්, නෘත්‍යය; පානා, දක්වන්නාවූ; නළඟන, නාටිකාඞ්ගනාවන්; පේ නාකලට, දෘෂ්‍යමානවනකාලයෙහි; සුරඟනයසි, දිව්‍යාඞ්ගනාවෝය සි; නොසිතේද, චින්තනයනොවේද?–

128. වයනා දවුල් තම්මට්ටම් සිරිවස් ද
ගසනා තරුණ දන කස්තල ලාලී ද
අඟනා පිඹින කලගෙඩි උඩදමමින් ද
බලනා මෑනවි නතිසුරු විමන මනන ද

128. මනනද, මනොනඥනවූ; නතිසුරුවිමන, නාථෙශ්වරයා ගේ විමානයෙහි; තරුණදන, තරුණජනයා විසින්; වයනා, වාද්‍ය කරන්නාවූ; දවුල්, එනම් විතතද; තම්මට්ටම්, එනම් ආනතද; සිරි වස්ද, ශ්‍රිවත්ස (උඩැක්කි) ද; ගසනා, ඝට්ටනයකරන්නාවූ; කස්ත ලද, කංසතාලද; ලාලිද, ලිකෙළිද; අඟනා, අඞ්ගනාවන්විසින්; උඩ දමමින්, උඩවීසිකරමින්; පිඹින, ධමනයකරන්නාවූ; කලගෙඩිද, කුම්භද; බලනාමෑනවි, අවලොකනය කරනහොත්මෑනවි.

129. වෙන් මෙන් නි නි න් දුල බ රණින් සරා ග න
උ න් ස න් නො සින් කල සුරසෙන් පුරා වෙ න
ම න් මෙන් රු ඞි න් කල දෝව න් වරා ඉ න
ස න් සු න් වෙ මි න් බ ල නති දුන් පුරා නෙත

129. වෙන්මෙන්, විජුළුදිව්‍යරාජයා මෙන්; දුල, ජ්වලිතවූ; බර ණින්, ආභරණයන්; ගත, ශරීරය; නිනින්, නිරන්තරයෙන්; සරා, සරසාගෙණ; කලසුරසෙන්, යහපත් දිව්‍යසෙනාව; වෙන, (තමන්) සමීපයෙහි; මන්මෙන්, සිත්වූ පරිද්දෙන්; පුරා, පූරණයකොට

ගෙණ; වරා, උත්තමවූ; සැලදෝවන්රුවින්, සල ඉඩෑතුව ණි රූප යෙන්යුක්තාව; සන්තොසින්, චිත්තප්‍රීතියෙන්; උන්, නිෂ්ද්‍රයකළාවූ; නතිඳුන්, නාථෙන්‍ද්‍රයන්; ඉත, මිත්‍රය; සන්සුන්වෙමින්, ශාන්ත දශාතවෙමින්; නෙත්පුරා, නෙත්‍රපූරණයකොට;බල, නිරීක්‍ෂණය කරව.

130. මන් මෙන් විපුල කිරණින් ය ස ලොවඳුක ල
මන් යොන් නිමල රුසිරෙන් ද ස දෙස පත ළ
පින් ව න් උදුල නතිඳුන් හි ස දූරු කිරු ළ
රන් ව න් තුමුල සෑමෙන් තොස වෙමින් බ ල

130. දසදෙස, දශදිශාවෙති; පතළ, ව්‍යාප්තවූ; විපුල, මහත්වූ; යසකිරණින්, කීර්තිනමැති රශ්මියෙන්; මන්මෙන්, සිත්වූ පරිද් දෙන්; ලොවඳුකල, ලොකය ආලොකකළාවූ; නිමල, නිර්මලවූ; රුසි රෙන්, රූපශ්‍රියෙන්; මන්යොන්, (පුෂ්)අනඞ්ගයා වැනිවූ; පින්වන්, පුණ්‍යවන්තාවූ; නතිඳුන්, නාථෙන්‍ද්‍රයාගේ; හිස, ශිර්ෂයෙහි; දූරු, ධාර ණයකළාවූ; තුමුල, මහත්වූ; සෑමෙන්, චෛත්‍යයක් වැනිවූ; රන් වන්, සවර්ණවර්ණයෙන්; උදුල, උජ්වලිතවූ; කිරුළ, කිරීටය; තොස වෙමින්, ප්‍රීතිවෙමින්; බල, අවලොකනයකරව.

131. රිසි විලසින් උන් විට අස්න සුවිපු ල
නිසි ලෙසරන් වන් පට වනින සුලක ල
දිසි නතිඳුන් රන් පට බැඳින ලල්න ල
සිසි අඩවන් මන් තුට වඩන සකිබ ල

131. සුවිපුල, අතිවිශාලවූ; අස්න, ආසනයෙහි;රිසිවිලසින්, තමන් රුච්වූ පරිද්දෙන්; උන්විට, නිශද්‍යයකළ කාලයෙහි; රන්වන්, සවර්ණවර්ණවූ; පටවනින, පට්ටවස්ත්‍රයෙන්; නිසිලෙස, යොග්‍යාකාර යෙන්; සුලකල, අත්‍යලඞ්කෘතවූ; නතිඳුන්, නාථෙන්‍ද්‍රයාගේ; තලල් තල, ලලාටස්ථලයෙහි; බැඳී, බන්ධනයකළාවූ; මන්තුටවඩන, චිත්ත සන්තොෂවර්ධනයකරන්නාවූ; සිසිඅඩවන්,අර්ධචන්ද්‍රාකාරව; දිසි,දෘශ්‍ය මානවූ; රන්පට, සවර්ණපට්ටය; සකි, මිත්‍රය; බල, නිරීක්‍ෂණයකරව.

132. බ ල න සැමදනන් පියවඩවන තිය ත
ලෙලෙන රන්තෝඩු යුගනතිඳුගෙ කණ ත
වි ම න බරම් ලඹමිණි පහණෙව් දිමු ත
නොමිහ කෑළුම් දසදෙස පැතිරෙයි සත ත

132. බලන, නිරීක්ෂණයකරන්නාවූ; සැමදනන්, සකලජනයන්ට; නියත, නිශ්චයෙන්; පියවඩවන, ප්‍රීතිය වඩනයකරවන්නාවූ; නතිඳුගෙ, නාථෙන්ද්‍රයාගේ; කණත, කර්ණාන්තයෙහි; ලෙලෙන, ලීලොපෙතවූ; රන්තොඩුයුග, ස්වර්ණතාඩඞ්ක යුග්මයෙහි; කැළුම්, කාන්තිය; බරම්විමන, මහාබ්‍රහ්මයාගේවිමානයෙහි; ලඹ, ලම්බමානවූ; දිමුත, දීප්තිමත්වූ; මිණිපහන්එව්, මාණික්‍යප්‍රදීපයන්මෙන්; නොමින, බොහෝසෙයින්; දසදෙස, දශදිශාවෙහි; සතත, නිරන්තරයෙන්; පැතිරෙයි, ව්‍යාප්තවෙයි.

133. අ ග නා මිණිරුවන් බඳලකල මනමෙ න
නිනි නා කැළුම් පබසරදියත පැතිරෙ න
පිණ නා ලෙවන් රන්දම නතිඳු පළඳි න
නන නා විනා වණනට කවුරුහැකිව න

133. ලකල, අලඞ්කෘතවූ; අගනා, අගින්නාවූ; මිණිරුවන්, මාණික්‍යරත්නයන්; මනමෙන සිත්බූපරිද්දෙන්; බඳ, බන්ධනයකරණලද; නිනිනා, නිරන්තරයෙන්; පබසර කැළුම්, ප්‍රභාස්වරකාන්තිය; දියත, ලොකයෙහි; පැතිරෙන, ව්‍යාප්තවන්නාවූ; ලෙවන්, ලොකයා; පිණනා, පිණනයකරන්නාවූ; නතිඳු, නාථෙන්ද්‍රයා; පළඳින, පිළන්ධනයකරන්නාවූ; රන්දම, ස්වර්ණදාමය; නනනාවිනා, අනන්තනම් නාගරාජයාහැර; කවුරු, කවරෙක්; වණනට, වර්ණනාකිරීමපිණිස; හැකිවන, සමර්ථවන්නේද?–

134. සි ර ස නළල බැමදෙසවණ මුවගහ ණ
දෙ ඇ ස දෙකරලැම නැබ බඩ ඉහදය න
වෙ සෙස වැණුම්කරණට නහිඳුසමව න
නි දෙ ස උවම්නැත ලොවනොවණම් ඉති න

134. නතිඳු, නාථෙන්ද්‍රයාගේ; සිරස, ශිර්ෂය; නළල, ලලාටය; බැම, භෲය; දෙසවණ, ශ්‍රවණද්වය; මුව, මුඛය; ගහණ, ඝ්‍රාණය; දෙඇස අක්ෂිද්වය; දෙකර, හස්තද්වය; ලැම, හෘදය; නැබ, නාභිය; බඩ, උදරය; ඉහදයන, කටිද්වයනමේ අවයවයන්; වෙසෙස, විශෙෂයෙන්; වැණුම් කරණට, වර්ණනාකිරීමට; සමවන, සමානවන්නාවූ; නිදෙස, නිර්දෙෂවූ; උවම්, උපමා; ලොව, ලොකයෙහි; නැත, නැත්තාහ; ඉතින, එහෙයින්; නොවණම්, වර්ණනානොකරමි.

135. නැ නි න් ගණි සුරු ය නිළිණෙන් සු ර තු රු ය
තෙ දි න් දි නි සුරු ය විසු මෙන් පු ර පු රු ය
සි රි න් දි නි සුරු ය ව ද නි න් සු ර ගු රු ය
මෙ ව න් මු නි කුරු ය න තිඳු න් නි ර තු රු ය

135. නැතින්, ඥාණයකරණකොටගෙණ; ගණීසුරුය, ගණෙශ්වරයාවැතිය; තිළිනෙන්, ත්‍යාගය කරණකොටගෙණ; සුරතුරුය, කල්පවෘක්ෂයක්වැතිය; තෙදින්, තෙජසකරණකොටගෙණ; දිනිසුරුය, සූර්‍ය්‍යයාවැතිය; විකුමෙන්, වික්‍රමයකරණකොටගෙණ, පුරඳුරුය, පුරන්දරයාවැතිය; සිරින්, ශ්‍රීකරණකොටගෙණ; දිනිසුරුය, බලභද්‍රයාවැතිය; වදතින්, වචනයකරණකොටගෙණ,සුරගුරුය,බෘහස්පතීවැතිය; නිරතුරුය, නිරන්තරයෙන්; ඉමවන්, මෙසාකාර ගුණයන්ගෙන්යුක්තවූ; නතිඳුන්, නාථෙන්ද්‍රයා; බුදුකුරුය, බුඞාංකුරයෙක්ය.

136. ක ලින් ක ල පැමි ණි උවඳු රු නසනලෙ ස
ප ලින් ප ල නොමි නි එපඬුරු තබනරු ස
පෙ ලින් පෙ ල යෙහෙ නි ගෙණසුරු අඟනති ස
ලොලි න් බ ල පැමි ණි නතිසුරු විමනදෙ ස

136. කලින්කල, කාලයෙන් කාලයෙහි; පැමිණි, පැමිණියාවූ;උවදුරු, උපද්‍රවයන්; නසනලෙස, විනාශකරණපරිද්දෙන්; පලින්පල, තන්හි තන්හි; නොමිනි, අප්‍රමානව; තබන, ස්ථාපනයකරණලද්දවූ; ඒපඬුරුරුස, ඒපණ්ණාකාරරාශිය; යෙහෙනි, යහපත්ආකාරයෙන්; පෙළින්පෙළ, පඞක්තිපඞක්තිව; හිස,ශීර්ෂයට; ගෙණ, ග්‍රහණයකොට; නතිසුරු, නාථේශ්වරයාගේ; විමනදෙස, විමානයදිශාවට: ලොලින්, ආශාවෙන්; පැමිණි, සම්ප්‍රාප්තවූ;සුරු,දක්ෂවූ;අඟන, අඞ්ගනාවන්; බල, අවලොකනයකර.

137. පු ද සත් අගා වින් එකලට කරතො ස්න
සොඳ සෙත් මගා දුන් සතහට මව්ලෙ ස්න
තෙද යුත් සුභා වෙන් පුත්බට මෙන්දි ස්න
වැ ද අත් නගා දෙන් නතිඳුට මේහ ස්න

137. මව්ලෙස්න, මාතෘවක්මෙන්; සතහට, සත්වයාට; සොඳ,සුන්දරවූ; සෙත්, ශාන්තිය; මගා,පයෙර්‍ෂණයකොට; දුන්, දානයකළාවූ; සත්අගාවන්, සත්වයන්ට අග්‍රප්‍රාප්තවූ;(සර්ඥයන්වහන්සේට) පුදකර, පූජාකොට; තොස්න, සන්තොෂවූ; එකලට,ඒකාලයෙහි;සුභාතෙද්‍යුත්, බොහෝතෙජසින්යුක්තවූ; බට, පෘථිවියට අවතීර්ණවූ; වෙන්ප්‍රත්මෙන්, මහාබ්‍රහ්මයාමෙන්; දිස්න, බබලන්නාවූ; නතිඳුට, නාථෙන්ද්‍රයාට; අත්, හස්තයන්; නගා, මස්තකප්‍රාප්තකොට; වැද, නමස්කාරකොට; මේහස්න, මේසන්දෙශය; දෙන්,දානයකරන්.

138. සඳුන් කපුරු කළුවැල් නුවරලාගෙ ණ
දෙමින් සුවඳ දුම් පුදපඬුරු සතොසි න
දතින් වැඳ වැටී සිරිපදලඟ කළ ණ
කියන් මායදුම දී හස්න මෙලෙසි න

138 කලණ, කල්‍යාණ (මිත්‍ර) ය; සඳුන්, චන්‍දනය; කපුරු, කර්පූරය; කළුවැල්, අගිල්ය; නුවරලා, නගරය (යනමේ ආදිද්‍රව්‍යය න්); ගෙණ, ග්‍රහණයකොට; සුවඳදුම් පුදපඬුරු, සුගන්‍ධධූප පූජාපරාණාකාරයන්; සතොසින, සන්තොෂයෙන්; දෙමින්, දාන යකරමින්; සිරිපදලඟ, (ඒ නාථදෙවෙන්‍ද්‍රයාගේ) ශ්‍රීපාදයසමීපයෙහි; දතින්වැටී. ජඞ්ඝායෙන්පතිතව; වැඳ, නමස්කාරකොට; හස්න, (මේ) සන්‍දෙසය; දී, දානයකොට; මෙලෙසින, (මතුදක්වන) පරිද්දෙන්; මායදුම, මාගේ ආයාචනාව; කියන්, කථනයකරන්.

139. **සර්. ජේ. ඇමර්සන් – වැනන්ට් මහලේකම් මැති**
වෙසෙස වැණුම්කළ මහ ඉතිහස මෙල ක
**දෙන් සලමොන් ඩයස් බණ්ඩාරනාය ක**
ගරු මැතිඳු පුත්වන – උඩුගහ මුදලිමැති යන
**දෙන්. සී. එච්. ඩයස් බණ්ඩාරනාය ක**
වාසලමුදලි තිල සහ විතිසකරු ල ක
ලැ බ සියනෑ කෝරළ මුදලි තනතු ර
ස බ තුල පබුදන ගජ එකසර කෙස ර.
තු බ කුස යස රැඳිනි දිසි තිසකර අයු ර
පො බ කල දනන් මනකොඳ එමැති පුත්ව ර

139. සර්. ජේ. ඇමර්සන් ටැනන්ට් මහලේකම් මැති, තනතා මොපලක්‍ෂිත (ශ්‍රීලඞ්කාවීපයෙහි කලක් වැඩබැලූ)මහලේකම් මැතිතුමා විසින්; මෙලක මහඉතිහස, මේ ලඞ්කාවිපය සම්බන්‍ධ මහාඉතිහාසයෙහි; වෙසෙස, විශෙෂයෙන්; වැණුම්කළ, වර්ණනාකලාවූ; දෙන් සලමොන් ඩයස් බණ්ඩාරනායක ගරුමැතිඳු, එනම් ගරු මන්ත්‍රීන්ද්‍රයාගේ; පුත්වන, පුත්‍රවූ; උඩුගහ මුදලි මැති යන, උඩුගහ මුදලි මන්ත්‍රීශ්වරයන්වහන්සේයයි කියන; දෙන්. සී. එච්. ඩයස් බණ්ඩාරනායක, දෙන්. සී එච්. ඩයස් (අභයවික්‍රම ජයතිලක සෙනෙවිරත්න) බණ්ඩාරනායක නම්වූ; වාසල මුදලි තිල සහ, වාසල මුදලිතනතුරහා; ලක, සමස්තලඞ්කාවීපයෙහි; විතිසකරු, (සාමදාන) විනිශ්චයකාරධුරයද; සියනෑකෝරළ මුදලිතනතුර, සියනෑ කෝරළයෙහි මුදලිතනතුරද; ලැබ, ලබාගෙණ; සබතුල, සභාභ්‍ය

භාරයෙහි; පබුදනගජ, ප්‍රභූජන නමැති හස්තින්ට, එකසර කෙස සර, එකවාරී සිංහයෙක්වූ; නුබකුස,ආකාශකුක්ෂියෙහි; යසරුසිනි, කීර්තිරශ්මියෙන්; දිසි, බබලන්නාවූ; තිසකරඅයුරු,චන්‍ද්‍රයාමෙන්; දනන් මනකොඳ, ජනයන්ගේ සිත්නමැති කෞමුදයන්; පොබකළ, ප්‍රබොධකළාවූ; එමැති,ඒමහාත්මයන්ගේ; පුත්වර,පුත්‍රොත්තමවූ-

140. රි සි වන දුටුදනන් වේයන්ගොඩ අස ල
තිසි ඇත්අස් ගව මී මුව සියොත් කැ ල
දි සි නදුනුයන මෙන් පිරි සව් සිරි විපු ල
වැසි හොරගල්ල නම් මහවාසල පත ළ

140. දුටුදනන්, දශීනයකළ ජනයාට; රැව්වන, රුව්වන්නාවූ; වේයන්ගොඩ අසල, එනම් ග්‍රාමාසන්නයෙහි (පිහිටි); තිසි, යොග්‍යවූ; ඇත් අස් ගව මි මුව සියොත්කැල, හස්ත්‍යශ්ව ගවමහිෂ මෘග සමූහයාගෙන්; දිසි, බබලන්නාවූ; නදුනුයනමෙන්, නන්‍දනොද්‍යානයමෙන්; විපුල, මහත්වූ; සව්සිරිපිරි, සකලෛශ්වය්‍යීයෙන් සම්පූර්ණවූ; පතළ, ව්‍යාප්තවූ; හොරගල්ල නම් මහවාසල, එනම් මහවාසලෙහි; වැසි, වාසයකරන්නාවූ-

141. වැඩිවර මෙලක්දිව් – කඩුකරලු මහකුමරිදු
සර් සලමොන් ඩයස් බණ්ඩාරනාය ක
ගරුතර මහමුදලි මැතිවර මෙසිරිල ක
පදවි සී. ඇම්. ජී, නයිට්, ඒ. ඩී. සී. යන
ලැබ යසඉසුරු සැමදන්වැඩුමෙහි ඇඑ න
අ බ තුර සිහලපබුදන මිණිකිරුළව න
කුල යෙහි වෙසෙස පිවිතුරුසේම සකකි ර
තිළිණෙ නි පතළ නෙකදෙස සුරතුරඅයු ර
ස ත ති නි සලසමින් සුබසෙත දුක්දුරු ර
න හි දු නි සියැසමෙන් රුකදෙනු එමැතිව ර

141. මහකුමරිඳු, (ඇල්බට් වික්ටර් වේල්ස්හි ආදිපාද) මහාකුමාරෙන්‍ද්‍රයා; මෙලක්දිව්, මෙලඞකාවීපයට; වැඩිවර, සම්ප්‍රාප්තවූකාලයෙහි; කඩුකරලූ, කඩුකරලැවාවූ; සර් සලමොන් ඩයස් බණ්ඩාරනායක, සර් සලමොන් ඩයස් බණ්ඩාරනායකනම්වූ; මෙසිරිලක, මේ ශ්‍රීලඞකාවීපයෙහි; ගරුතර, අතිශයින්ගරුවූ;මහමුදලිමැතිවර, මහමුදලිම නත්‍රීන්‍ද්‍රවූද; සී. ඇම්. ජී., එනම්පදවියද; නයිට්, එනම්ප

දිවියද; ඒ. බී. සී. යන, ඒ. බී. සී. පදවියදයනා; පදවි, ඨානාන්තර යන්ද; යසඉසුරු, යශෛශ්වර්යයියද; ලැබ, ලබ්ධව; සැමදනවැඩුමෙහි, සමස්තජනාභිවෘද්ධියෙහි; ඇළුන, ආශක්තවූ; සිහලපබුදන අබතුර, ශෛංහලීය ප්‍රභූජනයාඅතුරෙහි; මිණිකිරුළවන, මාණික්‍යකිරීටයක්වූ; සකකිරසේම, සංඛක්ෂීරවැනිවූ; කුලයෙනි, වංශයෙන්; වෙසෙස, විශෙෂයෙන්; පිවිතුරු, පවිත්‍රවූ; තිළිණෙනි, ත්‍යාගයෙන්; සුරතුරඅසුර, කල්පවෘක්ෂයක්මෙන්; නෙකදෙස, අනෙකදිශාවන්හි; පතළ, ව්‍යාප්තවූ; එමැතිවර, ඒමන්ත්‍රීඥයන්වහන්සේ; නතිඳුනි, නාථෙන්ද්‍රයාණෙනි; දුක්, දුඃඛයන්; දුරුර, දුරීභූතකොට; සුබසෙත, සුභශාන්තිය; සතතිනි, නිරන්තරයෙන්; සලසමින්, සලස්වාලමින්; සියැසමෙන්, සවකීයාක්ෂියමෙන්; රැකදෙනු, රක්ෂාකොටදෙනුලැබේවා.

142. පුරණ දසපෙරුමන් – කුළුණෙන් සැමටමව්වන්

බුදු කුරු නාතසුරිඳුනි නරඹා දිවැ ස
නිරතුරු නළල ලකදනදිසි තිලකලෙ ස
නෙකගරු තිළවෙසෙස – ලත් මහමුදලි මැතිඳුට
ස ල සා යසස ජයසිරි දින දින නොප මා
නොලසා සතුරු වියවුල් සැමදුරුරද මා
නන්දෙස යස කෙහෙළිබඳවා අනෙකලෙ ද
රන් ර ස මෙන් මැතිතියසමග බෝසො ද
මන්ලෙස සියක්වස් සැපවිඳිනට තිබ ද
පින් රු ස ඔබටඅත්වෙයි සිදුකලොත් සෙ ද

142· දසපෙරුමන්, දශපාරමිතාවන්, පුරණ,පූරණයකරන්නාවූ; කුළුණෙන්, කරුණාවෙන්; සැමට, සියලුදෙනාට; මව්වන්, මාතෘවක්වැනිවූ; බුදුකුරු, බුඩාඞ්කුරවූ; නාතසුරිඳුනි, නාථදෙවෙන්ද්‍රයාණෙනි, දිවැස, (ඔබගේ) දිව්‍යාක්ෂියෙන්; නරඹා, නිරීක්ෂණයකොට; ලකදන, ලාඞ්කිකජනයාගේ; නළල,ලලාටයෙහි; දිසි, දෘශ්‍යමානවූ; තිලකලෙස, තිලකයක්වැනිවූ; වෙසෙස, විශෙෂයෙන්; නෙකගරුතිල, නොයෙක් ගරුතිලද; ලත්, ලැබූවාවූ; මහමුදලිමැතිඳුට, මහමුදලිමන්ත්‍රීඥයන්වහන්සේට; යසස,කීර්තියද; ජයසිරි,විජයශ්‍රීයද; දිනදින, දවසක්පාසා; නොපමා,අප්‍රමාදව; සලසා, සලස්වා; සැම සතුරුවියවුල්,සමස්තශත්‍රෘවියවුල්; දුරුරදමා,දුරිභූතකොටදමා; නන්දෙස, අනෙකදිශාවන්හි; යසකෙහෙළි, කීර්තිධ්වජය; අනෙකලෙද, අනෙකාකාරයෙන්; බඳවා, බන්දවා; බෝසොද, බොහෝසුන්දරවූ; මැතිතියසමග, මන්ත්‍රීනියසමග; රන්රසමෙන්, සවර්ණිභා රසදිය

මෙන්; මන්ලෙස, සිත්වූපරිද්දෙන්; නිබඳ, නිරන්තරයෙන්; සියක් වස්, ශතවර්ෂයක්මුළුල්ලෙහි; සැපවිඳිනට; සැපවිඳීමපිණිස; සෙද,සී ඝ්‍රව; සිදුකලොත්, සිඬකළහොත්; ඔබට; ඔබවහන්සේට; පින්රුසා, පුණ්‍යරාශිය; අත්වෙයි; හූසාප්‍රාප්තවේ.

සිරිසර එමැතිනිපරපුර සැකෙවිනි මෙහිපවසම්; සුමිතුරහෙද තා සවන්ලකරකර.

සිරිසර, ශ්‍රීසාරවූ; එමැතිනිපරපුර, ඒමහාත්‍රිතියගේ පරම්පරාව, සැකෙවිනි, සංක්‍ෂෙපයෙන්; මෙහි, මේස්ථානයෙහි; පවසම්, ප්‍රකාශකරමි; සුමිතුර, සුමිත්‍රය; හෙද, එයද; තාසවන්ලකරකර, තාගේ ශ්‍රවණාලඞ්කාරකරව.

143. ප ර සි ඳු ඩී. බි. ඇජ්f. උබයසේක ර
මු ද ලි ඳු තල්පේ පත්තුව කළ පත ර
පි රි සි ඳු බණ්ඩාරනායක එපරපු ර
මැහි නිඳු සුසානා පින්වත් සරණක ර

143. පතර, විශාලවූ; තල්පේපත්තුවකළ, එනම්පත්තුවකළාවූ; නොහොත් එනම්පත්තුවේ මුදලින්නතුරසම්බන්ධරාජකාර්‍ය්‍යකළාවූ; පරසිඳු, ප්‍රසිඬවූ; ඩී. බී. ඇජ්f. උබයසේකර, එනම් මහාත්‍රීශ්වරයන්වහන්සේ; පිරිසිඳු, (උභයකුල) පරිශුඬවූ; බණ්ඩාරනායක එපරපුර, ඒ බණ්ඩාරනායක පරම්පරාවෙහි; පින්වත්, පුණ්‍යවත්වූ; සුසානා මැතිනිඳු, එනම් උත්තම මහාත්‍රිනිය; සරණකර, විවාහකොටගෙණ.

144. වෙන් සිරි මෙන් වසනාසඳ නොව වෙන ස
පි න් සර නැනපුත් ලොව පතළ එකලෙ ස
න න් විකුමැති පුත්දෙදෙනෙක් ලැබ වෙසෙ
න න් සැපවිඳ ගියෝ පරලොවට කම් ලෙ ස

144. වෙන්සිරිමෙන්, විෂ්ණු හා ශ්‍රීකාන්තාවමෙන්; වෙනසනොව, වියෝගනොවී; වසනාසඳ, වාසයකරණකාලයෙහි; පින්සර, පුණ්‍යසාරවූ; නැනපුත්, ඥාණාන්විතවූ; ලොව, ලොකයෙහි; එකලෙස, එකාකාරයෙන්; පතළ, ව්‍යාප්තවූ; වෙසෙස, විශෙෂයෙන්; නන්විකුමැති, නානාවික්‍රමාන්විතවූ; පුත්දෙදෙනෙක්, පුත්‍රයන්දෙදෙනෙක්; ලැබ, ලබ්ධව; නන්සැපවිඳ, නානාසෞඛ්‍ය විඳිනයකොට; කම්ලෙස, කර්‍මයවූපරිද්දෙන්; පරලොවට, පරලොකයට; ගියෝ, ගමනයකළෝය.

145\. සුරුතර දෙදෙනඅතුරෙන් කණිටුපුත්ව ර
ගරුතර නයිට් **ඇස්. සී. උබයසේක** ර
මැතිවර මෙලක නිසපයන සබපව ර
තනතුර සිහලදනවෙනුවට ලත්මෙව ර

145\. සුරුතුර, අතිශයින්සුරවූ; දෙදෙන අතුරෙන්,(ඒපුත්‍ර) යුග්මාන්තරයෙන්; කණිටුපුත්වර, කණිෂ්ඨපුත්‍රොත්තමවූ; මෙලක, මේලඞ්කාවිපයෙහි; නිසපයනසබපවර, නීතිසම්පාදනයකරණ උත්තමසභාවෙහි; මෙවර, මේකාලයෙහි; සිහලදනවෙනුවට, සිංහලජනයාවෙනුවට; මැතිවරතනතුර, උත්තම මන්ත්‍රීස්ථානාන්තරය; ලත්, ලද්දාවූ; ගරුතර, අතිශයින්ගරුවූ; (වංශාධිපතිවූ); නයිට් ඇස්. සී. උබයසේකර, නයිට්පදප්‍රාප්ත සර් සැමුවෙල් ක්‍රිස්ටොපල් උභයසේකර මන්ත්‍රීශ්‍රයාණන්වහන්සේ.

146\. පැ න ස රු **ජේම්ස් ද අල්විස්** මැතිතුම ගේ
සි රි ස රු නන්දතිය කරවිවා මනර හේ
ල ත් ග රු **ඩෙසිසි ඇස්ලින්** මැතිතිසිරිර ගේ
වෙ සි සු රු පිනැති මැතිනිය මහමුදලිඳු ගේ

146\. පැනසරු, ප්‍රඥසාරවූ; ජේම්ස්ද අල්විස් මැතිතුමගේ,ජේම්ස් ද අල්විස් මන්ත්‍රීශ්වරයන්වහන්සේගේ; සිරිසරු, ශ්‍රීසාරවූ; නන්ද තිය, දුහිතෘව; මනරහේ, සිත්වූපරිද්දෙන්; විවාකර, විවාහකොට; ලත්, ලද්දාවූ; සිරිරහේ, ශ්‍රීකාන්තාවවැනිවූ; ගරු ඩෙසිසි ඇස්ලින් මැතිනි, ගරුවූ ඩෙසිසි ඇස්ලින්නම්මැතිනිය; මහමුදලිඳුගේ, මහමුදලිමන්ත්‍රීශ්වරයන්වහන්සේගේ; සුරු, ශූරවූ; පිනැති, පින්ඇත්තාවූ; මැහිනියවෙයි, මන්ත්‍රිණියවෙයි.

147\. යමෙක්කුලවත්විද – නැත දන ඔහුටනිසිලෙස
ඇතත් එදෙක කෙණෙකුට නොමඇත නුව න
ඇතත් එතුන නැතකිත් එකෙකුට නොම් න
ඇතද මෙකිගුණහැම – නැත පින්මහිම එකෙකුට
පි රි සැම මෙගුණ තිලබුහුමන්ද ගරු ව න
සි රි උරරදන රජදම් තියද සුරු ව න
විකු මෙ ති තෙදින් දූහැමිනි සදිසි න ර වර
නොලසි ති එමැති මැතිනියසමග ප ර පුර
ව ඩ මි නි දිගායසසිරි සැපත තී ර සර
අ ද රි නි රකිණමෙන් මම යදිමි යො ර යොර

147. යමෙක්, යම්කෙණෙක්; කුලවත්විද, කුලවත්වූයේද; ඔහුට, ඒතැනැත්තාට; නිසිලෙස, (ඒකුලීනභාවයට) යොග්‍යපරිද්දෙන්; දනනැත, ධනයනැත්තේය; කෙණෙකුට, අන්‍යයෙකුට; එදෙක, (ඒකුලීනභාවයහා ධනසමෘඬියද යන) දෙක; ඇතත්, විද්‍යමානවූවත්; නුවන, ඥානය; නොමඇත, අවිද්‍යමානය; එකෙකුට, එක්කෙණෙකුට; එතුන, යථොක්ත ත්‍රිවිධසම්පත්තිය; ඇතත්, විද්‍යමානවූවත්; නොමිත, බොහෝසෙයින්; කිත්, කීර්ත්තිය; නැත, නැත්තේය; එකෙකුට, අන්‍යයෙකුට; මෙකීගුණහැම, මේකියනලද සියලුගුණයෝ; ඇතද, ඇතිවූවත්; පින්මහිම, පුණ්‍යමහිමය; නැත, නැත්තේය; මෙසැමගුණ, මේසියලුගුණයන්ගෙන්ද; ගරුවන, ගරුවන්නාවූ; තිලබුහුමන්ද, ඨානාන්තරහා බහුමානයන්ගෙන්ද; පිරි, පරිපූර්ණවූ; සිරි, ශ්‍රීකාන්තාව; උර වක්ෂස්ථලයෙහි; රඳන, රඤ්ජමානවූ; රජදම්තියද, රාජධර්මතියෙහිද; සුරුවන, ශූරවන්නාවූ; විකුමෙනි, වික්‍රමයෙන්ද; තෙදිනි, තෙජසින්ද; දහැමිනි, ධර්මිෂ්ඨතායෙන්ද; නරවරසදිසි, නරශ්‍රෙෂ්ඨයෙක්සමානවූ; එමැයි, ඒ (සර් දෙන් සලමොන් ඩයස් බණ්ඩාරනායක මහමුදලි) මන්ත්‍රීශ්වරයන් වහන්සේද; මැතිතියසමග, මන්ත්‍රීතියහා; පරපුර, පරම්පරාවද; තිරසර, ස්ථිරසාරවූ; දිගායසසිරිසැපත, දීර්ඝායුෂහා යශෛශ්වර්‍ය්‍යසම්පත්ද; නොලසිනි, අනාලස්‍යව; වඩමිනි, වර්ධනයකරමින්; අදරිනි, ආදරයෙන්; රකිනමෙන්, රක්ෂාකරණමෙන්; මම, අශ්මත්තෙමේ: යොර යොර, නැවතනැවත; යදිමි, ආයාචනාකරමි.

148 වි පත් පැමිණි හිතඅහිතන්හට නිත ර
සැ පත් සුබාසිරිදෙන සෝදුක්දුරු ර
තෙදැත් ගුණැති බුදුකුරු ඔබතුමාහැ ර
මෙ සත් ලොවට පිහිටන අන්සුර කව ර

148. විපත්පැමිණි, අන්තරාශප්‍රාප්තවූ; හිතඅහිතන්හට, මිත්‍රාමිත්‍රයන්ට; සෝදුක්දුරුර, ශොකදුඃඛයන් දූරීභූතකොට; නිතර, අනවරතයෙන්; සුබාසිරිසැපත්, යහපත් ශ්‍රීසම්පත්තිය; දෙන දනායකරන්නාවූ; තෙදැත්, තෙජාන්විතවූ; ගුණැති, (කරුණාදි) ගුණඇත්තාවූ; බුදුකුරු, බුඬාඞ්කුරවූ; ඔබතුමාහැර, උත්තමවූඔබවහන්සේහැර; මෙසත්ලොවට, මේසත්වලොකයට; පිහිටන, ප්‍රතිෂ්ඨිතවන්නාවූ; අන්සුර, අන්‍යදෙවියෙක්; කවර, කවරේද?–

149. ම තු බුදුබව ලබන ඔබදෙව්තුමාන නෝ
ගෙතු කවිබසින් මේසුබහස්න බලමි නෝ
. ක තු යම්වරද ඇතහොත් ඒහැරලම් නෝ
සි තු පැතු මෙමා අදහස ඉටුකරනුමැ නෝ

149. මතු, අනාගතකාලයෙහි; බුදුබව, බුද්ධත්වය; ලබන, ලබන්නාවූ; දෙවිතුමාතනෝ, දෙවෙන්ද්‍රයානෙනි; කව්බසින්, කාව්‍යභාෂාවෙන්; ගෙතූ, ග්‍රන්ථයකළාවූ; මේසුබහස්න, මේයහපත්සන්දේශය; ඔබ, ඔබවහන්සේ; බලම්නෝ, නිරීක්ෂණයකොට, කතු, (ග්‍රන්ථ) කතෘවූමාගේ; යම්වරද, යම්දෝෂයක්; ඇතහොත්, විද්‍යමානවූවහොත්; ඒ, ඒදෝෂය; හැරලම්නෝ; පහකොටලා; මෙමා, ග්‍රන්ථකතෘවූ මේමාවිසින් සිතූ, චින්තිතවූ; පැතූ, ප්‍රාර්ථිතාවූ; අදහස, අධ්‍යාශය; ඉටුකරණුමැනෝ, ඉෂ්ටකළහොත්යහපති.

150. සැ දි නොමද කෙත්වත් – සල්පිල් මැදිරි මනරම්
ර තනගිරිය වැසි ආදදෙළ පිය ස
ද රණ නිසතර හෙළුමගද පරබ ස
ම හමගුල් සමුදුර – අරම යතිගණකළැසුරැ
හ සුන් කැණරිහෙළකිර ඇකළයෙහෙ න
මූ හන්දිරම් සෙන්නායක මැතිනඳ න
ද හම් හසළ දනරැඳි රන්දෙබ උප න
ලි හිල් හෙළුබසින් එතුමන් යදුමගෙ න
මැ හැගි මෙකව මැන්දිස් වික්‍රමරත් න
ති ළිපැතුම්වස්කෙළෙ මුලකුරුපෙණෙ න

150. නොමද, බොහෝවූ; කෙත්වත්, ක්ෂෙත්‍රවස්තූන්ගෙන්ද; මනරම්, මනෝරම්‍යවූ; සල්පිල්, ආපනශාලාහා; මැදිරි, මන්දිරයන්ගෙන්ද; සැදි, සජ්ජිතවූ; ආදදෙළපියස, එනම්ප්‍රදෙශයෙහි: රතනගිරිය, රත්නගිරි (වලව්වෙ) හි; වැසි, වාසීවූ; නිසතර, නීතිශාස්ත්‍රයද, හෙළුමගද පරබස, සිංහල මාගධිභාෂා හා (ඉංග්‍රීසි ලතින්ආදි) අපරදිග් භාෂාද; දරණ, ධාරණයකරන්නාවූ; මහමගුල්සමුදුරා රම, මහාමඞ්ගල සමුද්‍රාරාමයෙහි; යතිගණ, භික්ෂුසමූහයා; ඇසුරැකළ, ආශ්‍රය කළාවූ; කැණරිහෙළකිර ඇහසුන්, කැණරි කොකැටුආදි සන්දේශයන්, යෙහෙන, යහපත්ආකාරයෙන්; කළ, කළාවූ; සෙන්නායක මූහන්දිරම්මැති, දිනෙස් මැන්දිස් වික්‍රමරත්න සේනානායක මූහන්දිරම්මැතිතුමාගේ, නඳන, පුත්‍රවූ; දහම්හසළ, ධර්මපරිචිතකළාවූ; දනරැඳි, ජනයාරඳන්නාවූ; රන්දෙබ, එනම්ග්‍රාමයෙහි; උපන, උපන්නාවූ; එතුමන්, යථොක්තමූහන්දිරම්මැතිතුමන් (ධරමානකාලයෙහි කළ ) යදුම, ආයාවනාව; ගෙන, ග්‍රහණය කොට; ලිහිල් හෙළුබසින්, සිථිලසිංහලභාෂාවෙන්; මැහැගි, මාහැඟිවූ; මෙකව, මේ (අළුකොබෝසන්දේශ)කාව්‍යය; මුලකුරු, (මේදශපදසැහිල්ලේ)

මූලාක්ෂරයන්හි; පෙණෙන, දෘශ්‍යමානවූ; පැතුම්වස්, ප්‍රාර්ථනාවපිණි ස; මැන්දිස්වික්‍රමරත්න, හැන්රි ජෝන් මැන්දිස් වික්‍රමරත්න සේනානායක නිහිඥවූ මාවිසින්; තිළි, සන්තොෂයෙන්; කෙළෙ, කරණලද්දේය.

151. තිසුතු නැඹුළු ආ සිය කි ස ති බෝ යැ ද
තසිතු සියළු වා සිය ලැ බ සු බෝ ලෙ ද
තසතු යහ ළු නැසිය ස මි ග බෝ සො ද
පවතු එක ළු වා සිය අළු කොබෝ ස ද

151. අලුකොබෝසඳ, අලුකොබෝපක්ෂිරාජය; තිසුතු, තානිපුනක වූ; තිබෝආසියකිස, සකල ආශිර්වාදකෘත්‍යය; සුබෝලෙද, යහපත්ප රිද්දෙන්, යැද, යාඥකොට; තසිතු, තාඅභිමතවූ; නැඹුළු, මහත්වූ; සියලුවාසිය, සකලප්‍රයෝජනය; ලැබ, ලබාගෙණ; තසතු, තාසන්ත කවූ; බෝසොද, බොහෝසුන්දරවූ; එකළු, එකාකාරවූ; යහළු නැසිය සමග, සබිජනයන්හා ස්වකීයඥාතීන්සමග; වාසිය, ශතවර්ෂයක් මු ළුල්ලෙහි; පවතු, ප්‍රවෘත්තිතවෙහිවා.

152. ස ක වසිනෙක්දහස් අටසිය දෙතිස් ව ස
ල ක මහමුදලි මැතිදුට සුබසෙතපිණි ස
නෙක විසිතුරු අරුතැති අළුකොබො සදෙ ස
එ ක සිය පණස්දෙකකින් කව්කෙළෙ මෙලෙ ස

152. සකවසින්, ශකවර්ෂයෙන්; එක්දහස්අටසියදෙතිස්වස, එක් දහස් අටසිය දෙතිස්වන වර්ෂයෙහි; ලක, ලඞකාවෙහි; මහමුදලිමැති දුට, මහමුදලි මන්ත්‍රීශ්වරයන්වහන්සේට; සුබසෙතපිණිස, ශුභශා න්තියපිණිස; නෙකවිසිතුරුඅරුත්ඇති, නෛකවිචිත්‍රාර්ථාන්විතවූ; අලුකොබොසදෙස, අලුකොබෝසන්දෙසය; කව් එකසියපණස්දෙක කින්, කාව්‍ය එක්සියපණස්දෙකකින්; මෙලෙස, මෙයාකාරයෙන්; කෙළෙ කරණලද්දේය.

යස වි ලස ක පණට න රතු රු සු ර තු රු ව න
ලක කු සප ල මැතිඳු න රනමෙ න සෙත ව ඩ න
දින ම තුප හ ලවන න නිඳුට ස දු මෙ න දෙන
නද මෙ ස සිරි ලකෙහි දිලෙ ම න ලෙ සි න නෙදි න

කපණට, කෘපණයන්ට (යාචකයන්ට); නරතුරු, නිරන්තර යෙන්; සුරතුරුවන, කල්පවෘක්ෂයක්වන්නාවූ: ලකකුස ලඞ්කාභ්‍යන්තරයෙහි; පල ප්‍රකටවූ; නරන මැතිඳු, (සර් දෙන් සලමොන් ඩයස් අභයවික්‍රම ජයතිලක සෙනෙවිරත්න රජකුමරුන් කඩුකරලූ බණ්ඩාරනායක මහමුදලි) රාජමන්ත්‍රීන්ද්‍රයාට; යසවිලස යහපත්ආකාරයෙන්; සෙතවඩනමෙන, ශාන්තිය වර්ධනයකරණ පරිද්දෙන්; මතු, අනාගතකාලයෙහි; දින, සඳිඳුව; පහලවන,(ලොකයෙහි;) ප්‍රාදුර්භූතවන්නාවූ; නනිඳුට, (තිස්ස්ග්‍රාමවිහාරයෙහි අධිගෘහිත) නාථ දෙවේන්ද්‍රයාට; යදුමෙන, යාච්ඤාකිරීමෙන්; නද, සන්තොෂයෙන්; දෙන, දානයකරන්නාවූ; මේ (අලුකොබෝ) සන්දෙශය; සිරිලකෙහි, ශ්‍රී ලඞ්කාවීපයෙහි; මනලෙසින, සිත්වූපරිද්දෙන්; නෙදින, අනෙක කාලයක්මුළුල්ලෙහි; දිලෙ, භ්‍රාජිතවේවා.

නිමි.



## කර්තෘ නාම සන්දර්ශක

# ෂඩර චක්‍ර බන්ධනය

